# දහම් පාසල

## 6 ශ්‍රේණිය



# දහම් පාසල

## 6 වන ශ්‍රේණිය


ලේඛක

**පූජ්‍ය වදමල්දෙණියේ සෝමාලෝක ස්වාමීන් වහන්සේ**
(ශාස්ත්‍රවේදී (බී.ඒ) ශාස්ත්‍රපති (එම්.ඒ) අධ්‍යාපන ඩිප්ලෝමා
කෑ/ මාව වෑගන්තලේ මහා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති)



සම්පාදනය හා ප්‍රකාශනය
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

පළමුවන මුද්‍රණය - 2011
දෙවන මුද්‍රණය - 2012
තෙවන මුද්‍රණය - 2013
හතරවන මුද්‍රණය - 2014
පස්වන මුද්‍රණය - 2015
හයවන මුද්‍රණය - 2016
හත්වන මුද්‍රණය - 2017
අටවන මුද්‍රණය - 2018

ශ්‍රී ලංකා ජනරජයේ පරිත්‍යාගයක් වූ
මෙම පොත නිසි ලෙස පරිහරණය කර
සහෝදර සිසුවකුට පිරිනැමීම සඳහා
වසර අවසානයේ දී ආපසු භාරදීම
ඔබේ යුතුකම වන්නේය.

**උපදේශක මණ්ඩලය**

අතිපූජ්‍ය තෙරිපැහැ සෝමානන්ද මහානායක ස්වාමීන් වහන්සේ
ආචාර්ය පූජ්‍ය වැලමිටියාවේ කුසලධම්ම නායක ස්වාමීන් වහන්සේ
මහාචාර්ය පූජ්‍ය බෙල්ලන්විල විමලරතන ස්වාමීන් වහන්සේ
ශාස්ත්‍රපති පූජ්‍ය ගෝනදූවේ ගුණානන්ද ස්වාමීන් වහන්සේ
ශාස්ත්‍රපති පූජ්‍ය ගන්තුනේ අස්සජි ස්වාමීන් වහන්සේ
ආචාර්ය පූජ්‍ය කුඹුල්ලේ සීලක්ඛන්ධ නායක ස්වාමීන් වහන්සේ
පූජ්‍ය තිරිකුණාමලයේ ආනන්ද අනුනායක ස්වාමීන් වහන්සේ
පූජ්‍ය දික්වැල්ලේ තිස්ස නායක ස්වාමීන් වහන්සේ
පූජ්‍ය මැදගම ධම්මානන්ද ස්වාමීන් වහන්සේ
ශාස්ත්‍රපති ගුණසේන මහතන්ත්‍රිගේ මහතා
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් - චන්ද්‍රප්‍රේම ගමගේ මහතා
බෞද්ධ කටයුතු කොමසාරිස් - ඩොනල්ඩ් මුරගේ මහතා

**විෂය සංස්කරණය**

ශාස්ත්‍රපති පූජ්‍ය ගන්තුනේ අස්සජි ස්වාමීන් වහන්සේ
ශාස්ත්‍රපති ගුණසේන මහතන්ත්‍රිගේ මහතා

**සම්බන්ධීකරණය**

ජේ. පී. චමිලා රෝහිණී ජයලත් මහත්මිය
බී. කුමාරනායක මහතා

**මුද්‍රණ කටයුතු සම්බන්ධීකරණය**

කේ. එස්. අශෝක මංජුල බණ්ඩාර මහතා
ඩී. ඩබ්. ඩී. ටී. විජේසිංහ මහතා

**පරිගණක පිටු සැකසීම**

එම්. මනෝරි ප්‍රියංගනී මැන්ඩිස් මහත්මිය

**මුද්‍රණය**

චම්පිකා ප්‍රින්ටර්ස් - කුරුණෑගල

## ශ්‍රී ලංකා ජනාධිපති
## *இலங்கை சனாதிபதி*
## President of Sri Lanka

### අතිගරු ජනාධිපතිතුමාගේ පණිවිඩය

අධ්‍යාපනය මගින් කෙනෙකුට තමා තුළ ඇති හැකියාවත්, ශක්තියත් මතුකොට ගෙන ගුණාත්මකව හා සාර්ථකව ඉහළ තලයකට ගමන් කිරීමේ හැකියාව ලැබේ. ගුණ නැණ බෙලෙන් යුතු දරුවෙකු බිහි කිරීමට පාසලෙන් පමණක් ලබාගන්නා අධ්‍යාපනය ප්‍රමාණවත් නොවන බව තර්කයෙන් තොරව පිළිගත යුතු සත්‍යයකි. එබැවින් දරුවාගේ ජීවිතය යහමගට යොමු කිරීමේ කේන්ද්‍රීය ස්ථානය වන්නේ දහම් පාසලයි.

තම දරුවාට දහම් අධ්‍යාපනය ලබාදීම දෙමාපියන් සතු සුවිශේෂී වගකීමකි. තම දරුවා උගතෙකු, දක්ෂයෙකු පමණක් නොව සාරධර්ම හා ගුණ දහමින් හෙබි සදාචාර සම්පන්න පුද්ගලයෙකු කිරීමට පියවර ගැනීම ද දෙමව්පියන්ගෙන් ඉටුවිය යුතු වටිනා කාර්යභාරයකි.

යහපත් සමාජයක් උදෙසා 1895 දී උදාර සත්පුරුෂයින්ගේ පුරෝගාමීත්වයෙන් ඇරඹුණ දහම් පාසල් සේවාවෙන් එදා මෙදා තුර සමාජයට දායාද කර දුන් දරු පරපුර අප රටේ අගනා වස්තුවකි. සමාජයට වැඩදායී දරු පරපුරක් තැනීමෙහි ලා ලාභ අපේක්ෂාවෙන් තොරව තම කාලය හා ශ්‍රමය ස්වෙච්ඡාවෙන් කැප කරන සමස්ත දහම් පාසල් ගුරු පරපුරට අප සියලුදෙනාගේ ම ප්‍රණාමය හිමිවිය යුතු ය. යහ ගුණ වැඩීමට අමතරව භාවනාව තුළින් දරුවාගේ විනය සහ පෞරුෂත්වය වැඩීම දහම් පාසල තුළින් සිදුවන තවත් සුවිශේෂී කර්තව්‍යයකි.

ආදරණීය දුවේ, පුතේ, දහම් දැනුම ලබාගැනීම උදෙසා ඔබ වෙත පිරිනැමෙන මෙම අගනා කෘතිය හොඳින් පරිශීලනයකොට ලබන දහම් දැනුම ඔබේ ජීවිතය ඔපවත් කර ගැනීමටත් ඔබට ජීවන මග හමුවන විවිධ දුක් ගැහැට උපේක්ෂාවෙන් විමසා ජයග්‍රහණය කරා ළඟාවීමටත් හේතුවේවායි ඉත සිතින් ප්‍රාර්ථනය කරමි !

ඔබට තෙරුවන් සරණයි !

මෛත්‍රීපාල සිරිසේන

2015 මාර්තු මස 16 වැනි දින.

# ගුරු භවතුන්ට වචනයක්

අතීතයේ සිට ම සිරිලක දූදරුවන්ගේ සදාචාර වර්ධනයෙහි ලා කේන්ද්‍රස්ථානය වූයේ ගමේ පන්සල යි. ගමත් පන්සලත් අතර පැවති ස බැඳියාව නිසා අපගේ දෙස, බස, රැස රැකුණි වැඩුණි. එබැවින් ම ජාතියේ මුර දේවතාවුන් වහන්සේලා වූයේ භික්ෂූන් වහන්සේ ය. එම තත්ත්වය වඩාත් උද්දීපනය වූයේ දහම් පාසල් අධ්‍යාපනය තුළිනි.

විහාරස්ථානයේ ඇති දාගැබ, බෝධීන් වහන්සේ සහ ප්‍රතිමා මන්දිරය යන තුන් බෝ මෙන් ම පන්සල් බිමේ පවත්නා තුරුලතා ආදියෙන් ලැබෙන සිසිලස ද දරුවන් තුළ කරුණාව මෛත්‍රිය ආදි සාරධර්ම වර්ධනයට අතිශය හිතකර වේ. ගුණ නැණ දෙක සුසංයෝගී වූ මිණිමුතුවන් දූපුතුන් බිහි වන්නේ එම පසුබිම තුළිනි. ඔබ කරන්නේ එබඳු දූපුතුන් බිහි කර ගැනීමට මහඟු ලෙස දායක වීමකි.

මෙය දහම් පාසලේ හයවන ශ්‍රේණියට අදාළ පාඨ ග්‍රන්ථය යි. නිපුණතා පාදක කර ගනිමින් සම්පාදනය කර ඇති මෙම කෘතිය භාවිත කරමින් අදාළ නිපුණතා සාධනය වන අන්දමට දරුවන් යොමු කරවීමේ වගකීම පැවරී ඇත්තේ දහම් පාසලේ ගුරු මහත්ම මහත්මීන් වෙත ය.

මෙම පාඨ ග්‍රන්ථයට පදනම් කර ගෙන ඇති නිපුණතා පාඩම් මෙසේ ය.

| **නිපුණතාව** | **පාඩම** |
|---|---|
| නිපුණතාව 1 | 1, 7 |
| නිපුණතාව 2 | 5, 8, 11, 12, 18 |
| නිපුණතාව 3 | 23 |
| නිපුණතාව 4 | 3, 6, 13, 17 |
| නිපුණතාව 5 | 4, 10, 19, 22, 25 |
| නිපුණතාව 6 | 9, 14, 15, 21 |
| නිපුණතාව 7 | 24 |
| නිපුණතාව 9 | 2, 16, 20 |

දහම් පාසල් අධ්‍යාපනයේ පරමාර්ථ හා නිපුණතා ඉටුවන පරිදි පාඩම් සැලසුම් කොට විවිධ ඉගැන්වීම් ක්‍රම හා ශිල්පීය ක්‍රම භාවිත කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාවට නැගීම ඔබේ වගකීම යි. ඒ සඳහා අවශ්‍ය හැකියාව ඔබ සතු ව ඇති බව අපගේ විශ්වාසය යි.

තෙරුවන් සරණයි

## දහම් පාසල් අධ්‍යාපනයේ පරමාර්ථය හා නිපුණතා

### පරමාර්ථය

බුදුදහම පදනම් කර ගෙන තමා සහ අවට පරිසරය පිළිබඳ අවබෝධයක් ඇති, එම අවබෝධය අනුව හැසිරෙන සහ එසේ හැසිරීමේ ප්‍රතිඵල අත්දකින ගුණ නැණ දෙකෙන් පිරිපුන් දරු පිරිසක් බිහි කිරීම.

### නිපුණතා

දහම් පාසල් දරුවා

1. දහම් පාසල් අධ්‍යාපනයේ වටිනාකම හැඳිනගෙන තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් ක්‍රියාකර යි.
2. බුද්ධචරිතය හා වෙනත් ශ්‍රේෂ්ඨ චරිත හැඳින, ඒවා චරිතායනය කර යි.
3. පන්සිල් සුරකිමින් සඟරුවනට හා ගුරු දෙගුරුන්ට ගරු බුහුමන් දක්වයි.
4. ධර්මය පිළිබඳ නිවැරදි, නිරවුල් දැනුමක් ඇති ව තමන්ටත්, අනුන්ටත් හිත පිණිස වන පෞරුෂයක් ගොඩනගා ගැනීමට ක්‍රියාකර යි.
5. කායික හා මානසික සෞඛ්‍යය පිළිබඳ සැලකිලිමත් වෙමින්, විවේකය ඵලදායි ලෙස ගතකර යි.
6. දේශාභිමානයෙන් යුතු ව ශාසනික උරුමය සහ බෞද්ධ සංස්කෘතික දායාද ආරක්ෂාකර ගැනීමට ක්‍රියාකර යි.
7. බෞද්ධ නිර්ණායක අනුව කළයුතු නො කළයුතු දේ නිවැරදි ව හැඳිනගෙන ඒ අනුව ක්‍රියාකර යි.
8. බෞද්ධ ආර්ථික හා දේශපාලන දර්ශනය හැඳිනගෙන ඊට අනුගත වෙයි.
9. බෞද්ධ සිරිත් විරිත්, වත් පිළිවෙත් හා පරිසරය හැඳින ඊට අනුරූපී ව ක්‍රියාකර යි.
10. පාළි භාෂා කුසලතාව සහ අභිධර්මය පිළිබඳ මූලික දැනුම ඇතිකර ගැනීමට ක්‍රියාකර යි.

## 03. හැදෙන සිසු දිවියක ලක්ෂණ

සෑම සඳුදාවක ම උදෑසන රැස්වීම ඇමතීම විදුහල්පතිතුමිය ගේ සිරිතකි. එදා විදුහල්පතිතුමිය උදෑසන රැස්වීමට පැමිණුනේ වෙනදාට වඩා ඉතාමත් ම සතුටකිනි.

විදුහල්පතිතුමිය :

දූ දරුවනි,

මට මේ විදුහල්පති තනතුර ලැබුණාට පසු අතිශයින් ම සතුටු වන දවස අද. ඒ වගේ ම අපේ පාසලටත් අද ඉතාමත් ම ශ්‍රේෂ්ඨ දිනයක්. ගියවර පැවැති අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ සමස්ත ප්‍රතිඵලය අනුව අපේ විද්‍යාලයේ අමාලි උපේක්ෂා ශිෂ්‍යාව ලංකාවෙන් ම පළමු වැනියා හැටියට සමත් වෙලා. මෙය අපේ පාසලට ලැබුණ සුවිශේෂ කීර්තියක්. විශාල ගෞරවයක්. අපේ අමාලි උපේක්ෂා දියණියගේ අනාගතය පුන්සඳ මෙන් ප්‍රභාවත් එකක් වේවා යි එක සිතින් යුතු ව අප ප්‍රාර්ථනා කරනවා. මේ පාසල තුළින් අනාගතයේ දී අමාලි උපේක්ෂා වැනි තවත් දූ දරුවන් බිහි කිරීම යි අපේ එක ම අරමුණ. මා මේ වේලාවේ අමාලි උපේක්ෂා අපේ පින්බර දියණියට ආරාධනා කරනවා, සිය ජයග්‍රහණයට හේතු වූ කරුණු ඉදිරිපත් කරමින් මේ සභාව අමතන හැටියට.

අමාලි උපේක්ෂා :

ගරු විදුහල්පතිතුමියගෙන්, ගුරු මෑණිවරුන්ගෙන්, ගුරු පියවරුන්ගෙන් සහෝදර ඔබ සැමගෙන් අවසරයි.

මා ලද ජයග්‍රහණයේ ප්‍රශංසාව ගෞරවය, කීර්තිය ලැබිය යුත්තේ පන්සලේ හාමුදුරුවෝ, මගේ මව්පියන්, විදුහල්පතිතුමිය, ගුරු මෑණිවරුන් හා ගුරු පියවරුන්. ඒ අයගේ දිරිය, විරිය, දැනුම මා වෙත නොලැඹෙන්නට මට මේ තරම් ජයග්‍රහණයක් ලබන්නට බැහැ. එ බැවින් පළමුවෙන් ම ඒ සියලුදෙනාට ම මගේ ගෞරවනීය ආචාරය හිස නමා පුදකරනවා.

මගේ ජයග්‍රහණයට හේතු වූ කරුණු කීපයක් ම තියෙනවා. මා ළඟ නිතර ම තිබුණ දෙයක් තමයි මට මේ දේ කළ හැකි යි කියන ආත්ම විශ්වාසය. ඒ තුළින් මානසික ශක්තිය දියුණු කර ගත්තා. කරණීය

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 01. | මිහිරක් ලැබේ දම්පාසල වෙත ඒමෙන් | 1 |
| 02. | බෞද්ධයකුගේ ලක්ෂණ හැඳින ගනිමු | 2 |
| 03. | හැදෙන සිසු දිවියක ලක්ෂණ | 6 |
| 04. | බුදුගුණ ඇසුරෙන් අපි සිත සතසමු | 10 |
| 05. | සසුනඹර එකලු කළ උපාලි තෙරණුවෝ | 15 |
| 06. | ධනය පිළිබඳ රුවන් වැකි | 19 |
| 07. | අපි සැදැහැතියෝ වෙමු | 22 |
| 08. | දම්සක් පැවතුම තෙක් බුදු සිරිත | 25 |
| 09. | ධර්මාශෝක රාජ්‍ය සමයට පෙර ශාසනික තොරතුරු | 31 |
| 10. | සිහිය උපදවා බවුන් වඩමු | 37 |
| 11. | රකුසු පැනයට පිළිතුරු | 41 |
| 12. | රට දැය සමය ඔපවත් කළ වීරධීර රජවරු දෙදෙනෙක් | 46 |
| 13. | ධම්මපදයෙන් බිඳක් සවනට | 50 |
| 14. | ගුරුදෙගුරුන් හට සලකමු මෙලෙසට | 58 |
| 15. | අපිත් වඳිමු ජයසිරි මහබෝධී | 64 |
| 16. | බොදු නිවසක සිරිය දකිමු | 69 |
| 17. | සිවුසස් හැඳින ගනිමු | 73 |
| 18. | මෑත කාලීන යුගකාරක තෙරවරු | 76 |
| 19. | සිත්තුළ මෙත්මල් පුබුදුවමු | 83 |
| 20. | පින් දී සෙත් පතමු | 87 |
| 21. | පින්මල් පිපෙන සිල්වැසි වසින කාලයක් | 90 |
| 22. | මිදුල හා ගෙවත්ත හැඩවත් කරමු | 93 |
| 23. | පොදු දේපොළ සුරකිමු | 96 |
| 24. | අගතියෙන් මිදෙන්නට අපි කරමු වෑයම් | 99 |
| 25. | පැළයක් සිටුවා ඵලයක් ලබමු | 101 |

## 01. මිහිරක් ලැබේ දම්පාසල වෙත ඒමෙන්

නිදහනක් බඳුය බොදු දරු කැළ නාමෙන්
සිසිලක් ලද හැකිය සදහම් දිය බීමෙන්
සෝදුක් දුරැර ලැබ සැප සතුටින් සාමෙන්
මිහිරක් ලැබේ දම්පාසල වෙත ඒමෙන්

තෙරුවන් ගුරු දෙගුරු වැඩිහිටියන් වඳින
දුසිරිත් ඉවත ලා සුසිරිත් ගුණ වඩන
පින්බර දේසයේ පින් සිතුවිලි පුරන
බෝසත් දරු කැළකි දම් පාසලෙ සිටින

සැදැහෙන් යුතු ව වැඩිහිටි ඔවදන් රකින
දෙගුරුන් නමට කවදත් තම හිස නමන
සතියෙන් සතිය සිරි සදහම් රස විඳින
දරුවන් නිසා හෙළදිව බැබළෙයි නිතින

එක මවකගේ දරු පිරිසක් ලෙස සිතන
නෙක ගුණදම්වලින් සිය දිවි සරු කරන
සුපිපුණු වතු සුද්ද මල් පොකුරක් ලෙසින
කටයුතු කරන පිරිසකි දෙලොව ම දිනන

දන්සිල් බාවනා දස පින්වල යෙදෙති
සුදනන් ඇසුර ලැබ සත්ගුණ දම් රකිති
නුවණින් යුතු ව දැහැමි ව සිය දිවි ගෙවති
සදහම් බෙලෙන් කවදත් සුවසෙත ලබති

පන්සිල් සුරැක ඉසිකෝමන් බිඳලන්න
සිත්මල් පුබුදුවා පින්කම් කරගන්න
තුන්කල් එක සිතින් සම්බුදු මග යන්න
පන්සල් බිමේ දම්පාසල වෙත එන්න

**ක්‍රියාකාරකම් :**

01. දහම් පාසල් දරුවන් තුළ දක්නට ලැබෙන හොඳ ලක්ෂණ කවි පන්තියෙන් තෝරා ලියන්න.
02. දහම් පාසලේ වටිනාකම ප්‍රකාශවන වාක්‍ය හතරක් ලියන්න.

මෙත්ත සූත්‍රයේ සක්කෝ යනුවෙන් සඳහන් වන්නේ මෙම ලක්ෂණය කියල යි, මා හිතන්නේ. අදක්ෂ. අලස. කුසීතකමට හේතුවන නැහැ බැහැ වචන මා හැමදාක ම බැහැර කළා. මට පුළුවන්, ඇයි බැරි කියා හැමදේකට ම ඉදිරිපත් වුණා. සෑම අභියෝගයකට ම අභීත ව එඩිතර ව මුහුණ දුන්නා. නිවාඩු ලත් හැම විටක ම ශ්‍රේෂ්ඨ චරිත කථා කියෙව්වා. ඒවාත් මගේ ජයග්‍රහණයට හේතු වුණා. ශ්‍රේෂ්ඨ සිංහල බෞද්ධ රජ කෙනකු වන මහාපරාක්‍රමබාහු රජතුමා කියලා තියෙනවා,

"ලෝකේ උස්සාහවන්තානං ජනානං කිමසාධියං"

ලෝකයෙහි උත්සාහවන්තයාට කළ නොහැකි දේ කුමක් ද කියලා, දන්සිල් භාවනා කරන්නවත්, බණ අසා සිතින් දරා ඒ අනුව හැසිරෙන්නවත්, පාඩම් කරන්නවත්, ලියන්න කියවන්නවත්, විමසා බලා කටයුතු කරන්නවත් විභාගවලින් සමත් වෙන්නවත් සමාජයේ යහපත් වැඩවල යෙදෙන්නවත්, හැකියාව නැත්නම් බැහැ. මා හැමවිට ම ගුරු බසට අවනත වුණා. දෙන ක්‍රියාකාරකම් පැවරුම් මැනවින් කළා. පොතපතින්. ඇසුරු කරන අයගෙන්, අත්දැකීමෙන් හැකියාවන් දියුණු කර ගත්තා. මොන තරම් ගැටලු ප්‍රශ්න දුෂ්කරතා ඇති වුණත් ඒ ගැන නොසිතා වර්තමානයේ කළයුතු දේ කුමක්දැයි සිතුවා. මව්පියන්ගේ ආර්ථිකයට අනුව චාම් ජීවිතයට හැඩගැසුනා. ඒ සඳහා මට අගනා පිටිවහලක් වුණේ දහම් පාසල. සක්කෝ කියන ගුණය දියුණු කරගත්තේ දහම් අධ්‍යාපනයෙන්. මට ලැබුණ පන්ති නායිකා, ශිෂ්‍ය නායිකා, ප්‍රධාන ශිෂ්‍ය නායිකා තනතුරු, විවිධ සමිතිවල නිලතල මගේ අධ්‍යාපන දියුණුවට හේතු වුණා. මා ඒ තනතුරු ආභරණ වවට පමණක් පත්කර ගත්තේ නැහැ. ඒවා මගේ හැකියාවන් දියුණු කරගන්න සුදිලෙන තාරකා වුණා.

තවත් මතක් කළයුතු කරුණක් තමයි අවංකකම හෙවත් උජු ගුණය. මට මේ සඳහා උපකාර වුණේ බුදු සිරිත. බුදුහාමුදුරුවෝ කියන දේ කරන කරන දේ කියන **යථාවාදී තථාකාරී යථාකාරී තථාවාදී** ගුණයෙන් යුක්ත යි. අවංක පුද්ගලයා සිතින් යමක් සිතුවොත් කරන්නේත් ඒ දේ. වංක පුද්ගලයා සිතන්නේ එකක්. කරන්නේ වෙනත් දෙයක්. ඒ වංක ගති මා කිසිවිටකත් ඇති කරගත්තේ නැහැ. අනුන් රැවටීමෙන් වළකිනවා. මෙය උජු ගුණයයි. තමා තමන්ට ම අවංකවීම හෙවත් වඩාත් අවංක වීම සූජු ගුණය යි. මේ ලක්ෂණ දියුණු කරගෙන වැඩ

# 02. බෞද්ධයකුගේ ලක්ෂණ හැඳින ගනිමු

සිරි සිදුහත් දහම් පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ වෙසක් පෝය මුල් කරගෙන පෝය දිනට පෙර දින අටසිල් සමාදන් වූහ. දහම් පාසලේ ප්‍රධානාචාර්ය ධම්මකිත්ති ස්වාමීන්වහන්සේ "බෞද්ධයා" යන මාතෘකාව යටතේ එදා ධර්ම දේශනාවක් පැවැත් වූහ. දැන් අපි එම ධර්ම දේශනාවට සවන් දෙමු

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

ඝටීකාරෝ බෝ මහාරාජ කුම්භකාරෝ බුද්ධං සරණං ගතෝ ධම්මං සරණං ගතෝ සංඝං සරණං ගතෝ'ති (ම.නි. ඝටීකාර සූත්‍රය)

බෝසත් දරු දැරියෙනි, පින්වතුනි,

මා මේ ප්‍රකාශ කළේ ඝටීකාර සූත්‍රයේ සඳහන් ධර්ම පාඨයක්. බුදුරජාණන් වහන්සේ සංඝරත්නය පිරිවරා ගෙන කොසොල් රට සැරි සරද්දී එක්තරා ප්‍රදේශයක දී මඳක් නැවතී සිනා පහළ කළා. බුදුහාමුදුරුවෝ අප මෙන් හඬ නඟා සිනාසෙන්නේ නැහැ. උන්වහන්සේ යම්තම් සිනාවුණා. මඳ සිනාව දුටු ආනන්ද හාමුදුරුවෝ "ස්වාමීනි, ඔබවහන්සේ වඩින ගමන නවත්වලා පාර අයිනට වෙලා සිනා පහළ කළේ ඇයි දැ'යි විමසුවා. බුදුහාමුදුරුවෝ ආනන්ද හාමුදුරුවන්ට දුන් පිළිතුරේ සඳහන් කරුණු මෙහෙම යි. මේ වේහලිංග කියන ගමේ හිටියා වලං හදලා ජීවත් වෙන ඝටීකාර කියලා හොඳ බෞද්ධ උපාසක කෙනෙක්. ඔහු කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ගේ අග්‍රදායකයා යි. උපස්ථායකයා යි. ඝටීකාරට යාළුවෙක් හිටියා ජෝතිපාල කියා. ජෝතිපාල අන්‍ය ලබ්ධිකයෙක්. ඝටීකාර කියන්නේ අවබෝධයෙන් යුතු ව තෙරුවන් සරණ ගිය කෙනෙක්. ඝටීකාර දිනක් තම මිතුරාට කතා කළා කාශ්‍යප බුදුරජාණන් වහන්සේ දකින්න යන්න. මට කාශ්‍යප බුදුරජාණන් වහන්සේ දකින්න වුවමනාවක් නැහැ යි යාළුවා කීවා. දවසක් දිය නෑමට ගිය වේලාවක කතා කළා බුදුහාමුදුරුවෝ දකින්න යන්න. එදා ඔහු බුදුරජාණන් වහන්සේ දකින්න යාමට එකඟ වුණා.

බලන්න කල්‍යාණ මිත්‍රයාගේ තියන හොඳ ගතිය. ජෝතිපාල බුදුරජාණන් වහන්සේට බැණ වැදුනත් ඝටීකාර කිපුණේ නැහැ. තමන්

හොඳ වැඩ කරන අතර, තම මිතුරාත් ඒ හොඳ වැඩවලට, පිනට දහමට යොදා ගන්න උත්සාහ කළා. ඒක බෞද්ධකමේ හොඳ ලක්ෂණයක්. මේ දෙදෙනා කාශ්‍යප බුදුරජාණන් වහන්සේ දකින්නට ගියා. ඝටීකාර බුදුරජාණන් වහන්සේට තම යාළුවා හඳුන්වා දෙමින්

"ස්වාමීනි, මේ මගේ හොඳ ම යාළුවා, නම ජෝතිපාල, ඔහුට ධර්ම දේශනා කරන්නැ"යි බුදුරජාණන් වහන්සේට ආරාධනා කළා. එහි දී බුදුරජාණන් වහන්සේ විසින් කරන ලද ධර්ම දේශනයට සවන් දීලා ජෝතිපාල බොහොම පැහැදීමට පත්වුණා. ආපසු එන ගමනේ දී ජෝතිපාල ඝටීකාරගෙන් මෙසේ ඇසුවා. "යහළුව, ඔබ මෙතෙක් කල් බණ අහනවා, මහණ වෙන්න හිතුනේ නැද්ද?" එවිට ඝටීකාර මෙසේ උත්තර දුන්නා. "මම මහණ වෙන්න හිතුවා, නමුත් ඔබ දන්නවානේ අන්ධ මව්පියන් රැකගන්නේ මා කියා. ඉතින් කොහොම ද මම මහණ වෙන්නේ ?" ඝටීකාර මහණ නොවී ඉන්නේ අර අන්ධ මව්පියන්ට සලකන්න ඕන නිසා. මේ ගුණ ධර්මයත් බෞද්ධයකු ළඟ තිබිය යුතු හොඳ ලක්ෂණයක්. "එහෙනම් මම මහණ වෙන්නම්" ජෝතිපාල කීවා. එවිට ඝටීකාර එයට සතුටු වී ඔහු ආපසු කැඳවාගෙන ගොස් කාශ්‍යප බුදුහාමුදුරුවන්ගේ ශාසනේ මහණ කරවනු ලැබුවා. එදා එලෙස මහණවුන ජෝතිපාල අපේ බෝසතාණන් වහන්සේ යි.

දිනක් කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ජෝතිපාල තෙරුන් සමඟ බරණැස් නුවරට වැඩම කළා. කසී රටේ කිකී කියන රජතුමා පිරිසක් සමඟ ඇවිත් බුදුහාමුදුරුවන් ගෙන් බණ අසා පැහැදිලා, බුදුහාමුදුරුවන්ට ආරාධනාවක් කළා භික්ෂූන්වහන්සේලා සමඟ රජ ගෙදරට දානයට වැඩමවන්න කියා. දන් වළඳා අවසන් වූ කාශ්‍යප බුදුරජාණන් වහන්සේට බරණැස් නුවර වස් සමාදන්වීමට රජතුමා ආරාධනා කළා. බුදුහාමුදුරුවෝ මේ ආරාධනාව පිළිගත්තේ නැහැ. ආරාධනාවක් පිළිගෙන තිබුණ නිසා රජ්ජුරුවන්ගේ හිත කළකිරුණා. ස්වාමීනි, මම ඔබ වහන්සේට මෙච්චර හොඳට සලකලා හොඳට දානෙ දීලා ඔබ වහන්සේට ආරාධනාවක් කළා. ඔබ වහන්සේ මගේ ආරාධනාව ප්‍රතික්ෂේප කරනවා. මට වැඩිය හොඳ දායක මහත්මයෙක් ඔබවහන්සේට ඉන්නව ද?"

බුදුරජාණන් වහන්සේ වදාරනවා ''ඔව්, මහරජ ඔබට වඩා හොඳ දායක මහත්මයෙක් මට ඉන්නවා'' රජ්ජුරුවෝ කලබලෙන් අහනවා

කිරීමට මා පුරුදු වුණා. එසේ අතිශයින් අවංක ව කටයුතු කිරීම මගේ ජයග්‍රහණයට හේතු වූ කරුණක් ලෙස යි මා දකින්නේ. දෙමාපියන් ගුරුවරුන් දෙන අවවාද අනුශාසනා අවංක ව පිළිගත්තා. ගුරුතුමන්ලා දෙන පැවරුම් ක්‍රියාකාරකම් අනෙකුත් වැඩ හෙට කරන්නම් හෙට ගෙනෙන්නම් කියා කල් දැමුවේවත් අනුන් ගෙන් කොපිකර ගුරුවරුන් රැවටුවේවත් නැහැ. අද කළයුතු වැඩ අද ම කළා. බාහිර පන්තිවලට වඩා පාසලේ උගන්වන දේ ගැන මට ලොකු විශ්වාසයක් තිබුණා සැම ගුරුතුමෙක් ම ගුරුතුමියක් ම අපට අධ්‍යාපනය ලබා දෙන්න වෙහෙසුනා. අප වෙනුවෙන් හවස උපකාරක පන්ති කළා. විවේක වේලාවට නංගීත්, මල්ලීත් සමග සෙල්ලම් කළා. රූපවාහිනියේ ප්‍රවෘත්ති කාටූන් වගේ වැඩසටහන් නැරඹුවා. හැබැයි පොතපතේ වැඩ කරන විට ඒ ටික හොඳින් අවංක ව කළා. පාසලේ විනය නීතිරීතිවලට එකඟ ව මගේ හැකියාවන් ඔපමට්ටම් වන ලෙස අවංක ව ක්‍රියා කිරීම නිසා විද්‍යාලේ කීර්තියට මට යමක් කරන්න හැකි වුණා. රාහුල හාමුදුරුවෝ වගේ නිතර ම අවවාද අනුශාසනා බලාපොරොත්තු වුණා. තෙරුවන්ට, ගුරු දෙගුරුන්ට, වැඩිහිටියන්ට මම නිතර ම ගරු බුහුමන් කළා. මේ සියලු ක්‍රියාවන් මගේ ජයග්‍රහණයට හේතු වුණා. අපේ විදුහල් මෑණියන්ට මගේ මේ ජයග්‍රහණය පූජෝපහාරයක් වේවා. මගේ ජයග්‍රහණයට උපකාර කළ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලයේ ගුරු මෑණිවරුන්ටත්, ගුරු පියවරුන්ටත් මගේ හදපිරි ස්තුතිය පුද කරනවා.

ඔබ සැමට තෙරුවන් සරණ යි !

විදුහල්පතිතුමිය :

දූදරුවෙනි,

වීරයාගේ ලක්ෂණය ඕනෑ ම අභියෝගයක් මැඩගෙන ඉදිරියට යෑම යි. උදාර පුද්ගලයාගේ ගතිය, ගුණ නුවණින් යුක්තවීම යි. මේ ගුණාංග දෙකෙන් ම යුක්ත ආදර්ශවත් ශිෂ්‍යාවක් ලෙසයි අප අමාලි උපේක්ෂා ශිෂ්‍යාව හඳුන්වන්නේ. ඇය කළ කථාව සියලු ම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ආදර්ශයක්. ඔබත් අමාලි වගේ දක්ෂ දරුවන් වීමට උත්සාහවන්ත වන්න. ඒක පාසලට ගෞරවයක්. අමාලි උපේක්ෂා දියණියට තෙරුවන් සරණින් යහපත් අනාගතයක් වේවා යි අප සියලු දෙනා ම එක්වී සුභ පතනවා.

කවුද, කොහෙද ඉන්නෙ'? කියා. බුදුහාමුදුරුවෝ සන්සුන් ව උත්තර දෙනවා. "මහරජ මෙහෙ ඉඳලා ටිකක් දුර වේහලිංග කියන ගමේ, එයාගේ නම ඝටීකාර, වළං හදලා ජීවත්වන දුප්පත් මිනිසෙක්. ඒ මනුෂ්‍යයා ඔබට වැඩිය බොහොම හොඳ යි. රජතුමනි, ඔබතුමා ආරාධනාව පිළිගත්තේ නැහැ කියා මාත් සමඟ අමනාප වුණා. ඒත් ඝටීකාර එහෙම කෙනෙක් නොවේ. තුණුරුවන් කෙරෙහි කවදාවත් කලකිරෙන කෙනෙක් නෙවෙ යි. ඒ වගේ ම මහරජ, ඝටීකාර හොඳට පන්සිල් රකිනවා. බෞද්ධ ජීවිතයේ වැදගත් ම ලක්ෂණයක් සිල්වත්කම. බෞද්ධ ජීවිතය බොහොම සරල ජීවිතයක් රජතුමනි, ඝටිකාර ලද දෙයින් සෑහීමකට පත්වෙනවා. මම මගේ යන හැඟීම බැහැර කර කටයුතු කරන කෙනෙක්." ඝටීකාර ගැන කාශ්‍යප බුදුරජාණන් වහන්සේ තවදුරටත් කරුණු දේශනා කළා. "මහරජ, ඔහු පුදුම කෙනෙක්. මම දවසක් ඔහු ගෙදර නැති වේලාවක උදේ වරුවේ ඔහුගේ ගෙදරට වැඩියා. එතැනදී මා ඔහුගේ දෙමාපියන් ගෙන් ඔහු කොහේදැ යි ඇසුවා. එවිට ඒ අය මට කිව්වා ඔබගේ උපස්ථායකයා ගෙදර නැති නිසා ආහාර භාජනවලින් රැගෙන දානය වළඳන්න කියලා.

දවසක් බුදුරජාණන් වහන්සේගේ පන්සල වැස්සට තෙමෙන්නට වුණා. ඝටීකාරගේ නිවසේ තිබුණු පිදුරු ගෙනැවිත් තම යි වහල සෙවිලි කළේ. ඝටීකාර ගෙදර නැති වේලාවක ඒ දේ සිදුවුණත් ඔහු ඒ ගැන සතුටු වුණා මිස කලකිරුණේ නැහැ. මහරජ මේ ඝටීකාර එබඳු ශ්‍රේෂ්ඨ කෙනෙක්." ඒ ඝටීකාරගේ වස් ආරාධනාව පිළිගෙන බුදුරජාණන් වහන්සේ නැවතත් කොසොල් රටට වැඩම කළා. කිකී රජ්ජුරුවෝ ගැල් පන්සියයක බඩු පුරවා ඝටීකාරට එව්වත් ඒවා ඝටීකාර භාරගත්තේ නැහැ. ආපසු පිටත්කර යැව්වා. ඝටිකාර මෙ වැනි කෙනකු බව පෙන්වා දෙමින් එදා බුදුහාමුදුරුවෝ ආනන්ද හාමුදුරුවන් වහන්සේට දේශනා කළා. මේ ධර්මය අසා ආනන්ද හාමුදුරුවෝ අතිශයින් ම සතුටු වුණා. ඔබ සැමත් ශ්‍රද්ධාවන්තයන් බවට පත් වී ත්‍රිවිධ රත්නයට ගරු කරන හොඳ බොදු දරුවන් වීමට උත්සාහ කරන්න. සියලු දෙනාට ම තෙරුවන් සරණ යි!

ස්වාමීන් වහන්සේ ධර්ම දේශනාව නිමා කළේ දෙවියන්ට පින් දීමෙනු යි.

**ක්‍රියාකාරකම් :**

1. බෞද්ධයකු තුළ දක්නට ලැබෙන ලක්ෂණ පහක් පාඩම ඇසුරෙන් ලියා දක්වන්න.
2. බෞද්ධයා යනු කවරෙක් දැයි හැඳින්වෙන පද්‍යයක් නිර්මාණය කරන්න.
3. අභ්‍යාස පොත භාවිත කරමින් පහත සඳහන් වාක්‍ය ඉදිරියේ ඇති කොටුවල බෞද්ධයකු තුළ තිබිය යුතු ගුණාංග ✓ ලකුණෙන් ද නොතිබිය යුතු ගුණාංග X ලකුණෙන් ද සටහන් කරන්න.

| | |
|---|---|
| ✳ තුණුරුවන් කෙරෙහි පැහැදීමෙන් ක්‍රියා කරයි. | |
| ✳ අන්‍යාගම්වලට ගරු නො කරයි. | |
| ✳ මව්පියන්ට උවටැන් කරයි. | |
| ✳ මිතුරා හොඳ වැඩවලට යොමු කරයි. | |
| ✳ මිතුරා නරක වැඩවලට පොළඹව යි. | |
| ✳ කළගුණ සලකයි. | |
| ✳ ලද දෙයින් සෑහීමට පත් නොවෙ යි. | |
| ✳ සරල ජීවිතයක් ගත කරයි. | |

**ක්‍රියාකාරකම් :**

1. ඔබ දහම් පාසලේ ශිෂ්‍ය නායකයකු/නායිකාවක යැයි සිතා, ඔබට පැවරී ඇති වගකීම් කීපයක් ලියා දක්වන්න.
2. මෙම පාඩමේ ඇතුළත් හැදෙන සිසු දිවියක තිබිය යුතු ලක්ෂණ තුන ලියා දක්වන්න.

## 04. බුදුගුණ ඇසුරෙන් අපි සිත සනසමු

බුදුරජාණන් වහන්සේ වැඩ සිටි කාලයේදී ම එම බුදුරජාණන් වහන්සේ ගේ අරහාදී ගුණ පිළිබඳ දඹදිව පුරා ප්‍රචාරය වී තිබිණි. බුදුපියාණන් වහන්සේ මහසඟරුවන පිරිවරාගෙන ගමින් ගමට වඩින විට උන් වහන්සේ පිළිබඳ කීර්තිරාවය පැතිර ගියේ පහත සඳහන් අයුරිනි.

"ශාක්‍ය කුලයෙන් පැවිදි වුණු සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ භික්ෂූන් වහන්සේලා සමඟ අද අපේ ගමට වැඩමවන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ අරහත් ය. සම්මා සම්බුද්ධ ය, විජ්ජාචරණ සම්පන්න ය. සුගත ය. ලෝකවිදූ ය. අනුත්තර පුරිසදම්ම සාරථී ය. සත්ථා දේව මනුස්සානං ය. බුද්ධ ය. භගවා ය."

මේ ආරංචිය ලබන ගම්වැසියෝ එ වැනි රහත් උතුමකු දකින්නට ලැබීම කොතරම් වාසනාවක්දැ යි කියමින් බුදුරජාණන් වහන්සේ දැකබලා ගැනීමට උන්වහන්සේ වැඩමවන මග බලා සිටි බව සඳහන් වේ. අපට අද ජීවමාන බුදුරජාණන් වහන්සේ දැකබලා ගැනීමට හැකියාවක් නැත. එහෙත් අරහාදී බුදුගුණ ඇසුරෙන් උන්වහන්සේ දැකිය හැකි ය. ඒ සඳහා බුද්ධානුස්සති භාවනාව උපකාර වේ.

බුදුරජාණන් වහන්සේ ගේ ගුණ සිහිකරමින් කරන භාවනාව බුද්ධානුස්සති භාවනාව යි. අන් කිසිවක් ගැන නොසිතා බුදුගුණ පමණක් මෙනෙහි කරන විට අප සිත තුළ පවතින්නේ යහපත් සිතුවිලි ය. එවිට නරක සිතුවිලි ඉවත් ව යයි.

අපේ සිත නිතර නිතර කිළිටි වන්නේ ආශාව, තරහ, වෛරය ආදී නරක සිතුවිලි නිසා ය. අපිරිසිදු සිතින් කරන කියන දේ අපිරිසිදු ය. අපිරිසිදුවූ ඇඳුම් පැළඳුම් පිරිසිදු කරගන්නාක් මෙන් අපිරිසිදු සිත ද පිරිසිදු කරගත යුතු ය. පිරිසිදු කරගත යුත්තේ භාවනා කිරීමෙනි. බුද්ධානුස්සති භාවනාව ද ඒ සඳහා උපකාර කරගත හැකි ය.

බුද්ධානුස්සති භාවනාව වඩන්නා තුළ බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගෞරවය හා ශ්‍රද්ධාව වැඩි වෙයි. නුවණ දියුණු වේ. නිතර ම සතුට ඇති වේ. කාගේත් ගරු සැලකිලි ලැබෙන වාසනාවන්තයකු විය හැකි ඔහුට නපුරු සිහින නොපෙනේ. බිය හා දුක්පීඩා ඉවසිය හැකි ය. සුවසේ අවදි විය හැකි ය. හෙතෙම මරණින් පසු සුගතිගාමී වේ.

"ස්වාමීනී අපි පැවිදිවීමට කැමැත්තෙමු. මේ උපාලිත් අප සමග ම පැමිණියේ මහණවීමට යි."

"රාජ කුමාරවරුනි මාගේ ශාසනය ශාක්‍යයන්ට පමණක් සීමාවූවක් නොවේ. සසුන්ගත වීමට කැමැති ඕනෑ ම තරාතිරමක කෙනකුට අවස්ථාව තිබෙනවා."

"එසේනම් ස්වාමීනි පළමු ව උපාලි ද අප දෙවනුව ද සසුන්ගත කරනු මැනවි"

ශාක්‍ය කුමාරවරුන්ගේ අයැදුම එලෙසින් ම ඉටුවිණි. උපාලි තෙරණුවෝ වනගත ව භාවනා වැඩීමට වැඩි කැමැත්තක් දැක්වූ හ. එහෙත් එම තෙරණුවන් ගෙන් මතුවට බුදු සසුනට වන මහඟු සේවය දුටු බුදුරජාණන් වහන්සේ ධර්මවිනය හැදෑරීමත්, භාවනා වැඩීමත් කෙරෙහි උපාලි තෙරුන්ගේ සිත යොමු කරවූ හ. ඒ අනුව ක්‍රියා කළ උපාලි තෙරණුවෝ කෙටි කලෙකින් රහත් වූ හ.

පදුමුත්තර බුදුපියාණන් වහන්සේ දවස පැතූ විලස විනයධර භික්ෂූන් වහන්සේලා අතර අග තනතුරට පත්වූයේ ද උපාලි මහ රහතන් වහන්සේ ය. උපාලි තෙරණුවෝ නිහතමානි ව තමන් ලද තනතුරෙහි වගකීම භාරගෙන බුදු සසුනේ චිර පැවැත්ම සඳහා කටයුතු කළ සේක.

වරෙක මව මැරූ අයෙක් ද තවත් විටෙක පියා මැරූ අයෙක් ද ලැජ්ජාවෙන් සමාජ ගර්හාවෙන් මිදීමේ අපේක්ෂාවෙන් තමන් මහණ කරන ලෙස භික්ෂූන් වහන්සේගෙන් අයැද සිටියහ. ඔවුනගේ තොරතුරු සෙවීම භාරවූයේ උපාලි රහතන් වහන්සේට ය. උපාලි තෙරණුවෝ ඔවුන් වැරදි කරුවන් බව ප්‍රකාශ කළහ. "දෙගුරුන් මැරූ අය උපසම්පදා නොකළ යුතු ය. උපසම්පදාව ලබා ඇත්නම් වහා උපැවිදි කළ යුතු ය" යි. "බුදුරජාණන් වහන්සේ නීති පැණවූයේ එවිට ය.

දිනක් ලාබාල තරුණයෙක් ජීවත්වීමට පහසු ක්‍රමයක් සෙවී ය. පැවිදි වුවහොත් යහෙකැ යි සිතා තමන් ම කෙස් රැවුල් බා සිවුරු පොරවාගෙන පන්සලකට ගොස් භික්ෂූන් වහන්සේට වඳින්නට විය. විහාරස්ථානයේ වැඩසිටි භික්ෂූන් වහන්සේලා ඔහුගේ ගුරුවරයා කවරෙක්දැ යි විමසූහ. ඔහුට දියහැකි පිළිතුරක් නොවී ය. මේ පිළිබඳ තොරතුරු සොයා බැලීමට භාරවූයේ ද උපාලි තෙරුන් වහන්සේට ය.

**පළමු පියවර :**

- ✳ මාගේ බුදුපියාණන් වහන්සේ රහසින්වත් පව් නොකළ සේක.
- ✳ මාගේ බුදුපියාණන් වහන්සේ රහසින්වත් පව් නොකළ සේක.
- ✳ මාගේ බුදුපියාණන් වහන්සේ රහසින්වත් පව් නොකළ සේක.
- ✳ මාගේ බුදුපියාණන් වහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් දුරු වූ සේක.
- ✳ මාගේ බුදුපියාණන් වහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් දුරු වූ සේක.
- ✳ මාගේ බුදුපියාණන් වහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් දුරු වූ සේක.
- ✳ මාගේ බුදුපියාණන් වහන්සේ සියලු පූජාවන් ලැබීමට සුදුසු වන සේක.
- ✳ මාගේ බුදුපියාණන් වහන්සේ සියලු පූජාවන් ලැබීමට සුදුසු වන සේක.
- ✳ මාගේ බුදුපියාණන් වහන්සේ සියලු පූජාවන් ලැබීමට සුදුසු වන සේක.
- ✳ මාගේ බුදුපියාණන් වහන්සේ රහසින්වත් පව් නොකළ නිසා ද, සියලු කෙලෙසුන් කෙරෙන් දුරු වූ නිසා ද, සියලු පූජාවන් ලැබීමට සුදුසු වන නිසා ද අරහං නම් වන සේක. අරහං නම් වන සේක. අරහං නම් වන සේක.

  මේ අන්දමින් විනාඩි පහක් පමණ භාවනා කරන්න.

භාවනාව අවසානයේ නළලත දෑඅත් තබාගෙන වැඳගෙන තෙවරක් සාධුකාර දෙන්න. පහත දැක්වෙන කවිය අරුත් මෙනෙහි කරමින් සිහින් හඬින් කියා සාධුකාර දෙන්න.

රහසක් පව් නො කොට  
කෙලෙසරයනුත් දුරු කොට  
නිසි වූයෙන් පුදට  
අරහ යයි නම කියති මුනිඳුට

**පළමු පියවර :**

* මාගේ බුදුපියාණන් වහන්සේ රහසින්වත් පව් නොකළ සේක.
* මාගේ බුදුපියාණන් වහන්සේ රහසින්වත් පව් නොකළ සේක.
* මාගේ බුදුපියාණන් වහන්සේ රහසින්වත් පව් නොකළ සේක.
* මාගේ බුදුපියාණන් වහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් දුරු වූ සේක.
* මාගේ බුදුපියාණන් වහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් දුරු වූ සේක.
* මාගේ බුදුපියාණන් වහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් දුරු වූ සේක.
* මාගේ බුදුපියාණන් වහන්සේ සියලු පූජාවන් ලැබීමට සුදුසු වන සේක.
* මාගේ බුදුපියාණන් වහන්සේ සියලු පූජාවන් ලැබීමට සුදුසු වන සේක.
* මාගේ බුදුපියාණන් වහන්සේ සියලු පූජාවන් ලැබීමට සුදුසු වන සේක.
* මාගේ බුදුපියාණන් වහන්සේ රහසින්වත් පව් නොකළ නිසා ද, සියලු කෙලෙසුන් කෙරෙන් දුරු වූ නිසා ද, සියලු පූජාවන් ලැබීමට සුදුසු වන නිසා ද අරහං නම් වන සේක. අරහං නම් වන සේක. අරහං නම් වන සේක.

  මේ අන්දමින් විනාඩි පහක් පමණ භාවනා කරන්න.

භාවනාව අවසානයේ තළලත දෙඅත් තබාගෙන වැඳගෙන තෙවරක් සාධුකාර දෙන්න. පහත දැක්වෙන කවිය අරුත් මෙනෙහි කරමින් සිහින් හඬින් කියා සාධුකාර දෙන්න.

රහසත් පව් නො කොට<br>
කෙලෙසරයනුත් දුරු කොට<br>
නිසි වූයෙන් පුදට<br>
අරහ යයි නම කියති මුනිඳුට

මිනිස් රූ - පඹයන්
තණින් - තණ කොළවලින්
දන - ජනතාව / ධනය

**ක්‍රියාකාරකම් :**

1. ලෝකෝපකාරයේ කතුවරයා නම් කරන්න.
2. උපදේශ කාව්‍ය ග්‍රන්ථ තුනක් මතකයෙන් කියන්න.
3. ලෝකෝපකාරයේ ඔබ සිත්ගත් ගීයක් පැහැදිලි ව ලියා දක්වන්න.
4. ධාර්මික රැකියා හා අධාර්මික රැකියා යනු මොනවාදැ යි ගුරුතුමා සමඟ සාකච්ඡා කරන්න.

පුහුණුවට :

1. මෙම ගී තේරුම සහිතව කට පාඩමින් කීමට පුහුණුවන්න.
2. පන්තියේ සියලුදෙනා ම එකතු වී යම්කිසි මුදලක් ඉරු දින කිහිපයක දී එකතු කර ගුරුතුමා ගේ උපදෙස් පිට යමක් රැගෙන අසරණ කෙනෙකුට පරිත්‍යාග කරන්න.

වැඳගෙන මෙසේ ප්‍රාර්ථනා කරන්න. මාගේ මේ භාවනාමය කුසලය මෙලොව සැනසීම පිණිසත් පරලොව සැනසීම පිණිසත් නිවන් සුවයෙන් සැනසීම පිණිසත් හේතු වේවා ! වාසනා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

**දෙවන පියවර** පළමු පියවරේ දී අනුගමනය කළ වත් පිළිවෙත් හා ඉරියව් පැවැත්වීම මෙහිදී ද අනුගමනය කරන්න. පහත දැක්වෙන පරිදි ගුරුතුමා අනුගමනය කරමින් කිහිප වරක් ලතාවකට කියවන්න.

✳ මාගේ බුදුරජාණන් වහන්සේ දතයුතු සියල්ල මැනවින් අවබෝධ කළ සේක. ඒ නිසා සම්මා සම්බුද්ධ නම් වන සේක.

✳ මාගේ බුදුරජාණන් වහන්සේ දතයුතු සියල්ල මැනවින් අවබෝධ කළ සේක. ඒ නිසා සම්මා සම්බුද්ධ නම් වන සේක.

✳ මාගේ බුදුරජාණන් වහන්සේ දතයුතු සියල්ල මැනවින් අවබෝධ කළ සේක. ඒ නිසා සම්මා සම්බුද්ධ නම් වන සේක.

දැන් නිහඬව එම වාක්‍යයේ අදහස් සිතින් මෙනෙහි කරන්න. භාවනාව අවසානයේ නළලත දෙඅත් තබා වැඳගෙන පහත දැක්වෙන කවිය ද සිහින් හඬින් ගායනා කොට සාධුකාර දෙන්න.

තුන් කල්හිම පැවැති
පදරුත් සියල් ලොව ඇති
අතැඹුල සෙ දැනගති
එයින් සම්මා සම්බුදුන යෙති

මාගේ මේ භාවනාමය කුසලය මෙලොව සැනසීම පිණිසත්, පරලොව සැනසීම පිණිසත්, නිවන් සුවයෙන් සැනසීම පිණිසත්, හේතු වේවා ! වාසනා වේවා ! යනුවෙන් වචනයෙන් ප්‍රාර්ථනා කර භාවනාව අවසන් කරන්න.

**ක්‍රියාකාරකම් :**

පහත සඳහන් ප්‍රශ්නවලට අවංක ව පිළිතුරු දෙන්න.

1. භාවනා කළ කාලය තුළ නොසෙල්වී සිටීමට මට හැකිවී ද ? (ඔව් / නැත)
2. දෙනෙත් පියවාගෙන බුදුපිළිම වහන්සේ දෙස සිතින් බලා සිටීමට මට හැකි වී ද? (ඔව්/නැත)
3. "මාගේ බුදුරජාණන් වහන්සේ දතයුතු සියල්ල මැනවින් අවබෝධ කළ සේක"

මේ පාඨය අමතක වීමකින් තොර ව භාවනා කාලය ගතවන තුරු තමාට ම කියා ගැනීමට හැකි වී ද? (ඔව්/නැත)

පැවරුම :

ක්‍රියාකාරකම් යටතේ විමසා ඇති ප්‍රශ්නවලට 'ඔව්' යන පිළිතුරු ලබාගත හැකිවන තෙක් දිනපතා පහසු ම වේලාවක භාවනා කරන්න.

කරුණු සොයා බැලූ තෙරණුවෝ ඔහුගේ සැබෑ තත්වය භික්ෂූන් වහන්සේලාට දැන්වූ හ. එ පවත් ඇසූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි සොර සිතින් මහණදම් පුරන්නන් උපසපත් නොකළ යුතු ය. උපසපත් වූයේ නම් මහණ බවින් මුදා හළ යුතු ය" යි විනය නීතියක් පැනවූ හ. මේ අයුරින් විනය නීති පැනවීමේදී ද බුදුරජාණන් වහන්සේට උපාලි තෙරණුවන්ගෙන් ලැබී ඇත්තේ නොමඳ සහායකි.

කුමාර කාශ්‍යප මාතාව බුදුසසුනේ පැවිදිවූයේ සැදැහැයෙනි. ඉතා සිල්වත් වූ මේ තෙරණියට දරු ගැබක් ඇති බවට ලකුණු පහළ විය. ඇය පැවිදිව සිටියේ දෙව්දත් තෙරුන්ගේ පාර්ශ්වයේ ආරාමයක යි. එහි සිටි අනෙක් භික්ෂුණීහු මේ බව දෙව්දත් තෙරුන් වහන්සේට දන්වා සිටිය හ. "දෙව්දත් තෙරුන් වහන්සේ ඇය උපැවිදි කරන ලෙස නියම කළහ. එයට අකමැති වූ කුමාර කාශ්‍යප මාතා තෙරණිය බුදුරජාණන් වහන්සේගේ පිළිසරණ පැතුවා ය. මෙම තෙරණියගේ නිර්දෝෂී භාවය බුදු නැණින් දැන සිටිය ද සිව්වණක් පිරිස ඉදිරියේ එය විසඳීම මැනව යි බුදුරජාණන් වහන්සේ සිතූහ. එම ගැටලුව විසඳීමේ කාර්යය පැවරුණේ ද උපාලි තෙරණුවන්ටය. අනාථපිණ්ඩික සිටුතුමා, කොසොල් රජතුමා, විශාඛා උපාසිකාව ආදීහු කමිටුවට අයත් වූහ. උපාලි තෙරුන් වහන්සේගේ නියමය පරිදි විශාඛා උපාසිකාව ඇගේ දරුගැබ පරීක්ෂා කොට බලා ඇය ගැබ්ගෙන ඇත්තේ පැවිදිවීමට පෙර බව ප්‍රකාශ කළාය. මේ අනුව කුමාර කාශ්‍යප මාතා තෙරණිය නිර්දෝෂ බව උපාලි තෙරණුවෝ නිගමනය කළ හ. උපාලි තෙරණුවන් සියල්ලන් ගේ ප්‍රසාදයට ලක්වූයේ තමාට පැවරෙන කාර්යයන් වගකීමෙන් යුතුව ඉටුකළ බැවිනි.

බුදුසසුනෙහි කල් පැවැත්ම උදෙසා ද උපාලි මහ රහතන් වහන්සේ ගෙන් මාහැඟි සේවයක් ඉටු විය. ප්‍රථම ධර්ම සංගායනාවේ දී මහාකාශ්‍යප මහරහතන් වහන්සේ විසින් විනය හා සම්බන්ධ සියලු ම ප්‍රශ්න අසන ලද්දේ උපාලි මහ රහතන් වහන්සේ ගෙනි. ඒ සියලු ම විනය නීති කට පාඩමින් පවත්වාගෙන යාම පැවරුණේ ද උපාලි මහ රහතන් වහන්සේට හා එම ශිෂ්‍ය පරපුරට ය. ශිෂ්‍යයන් ලවා විනය පිටකය මැනවින් ප්‍රගුණ කරවා එය ඉදිරියටත් පවත්වාගෙන යාමට විධිවිධාන සැලැස්වූ හ. "විනය වූ කලි බුදුසසුනේ ආයුෂය ය" යන්න තහවුරු කරමින් බුදු සසුන චිරාත් කාලයක් පවත්වාගෙන යාමට උපාලි මහරහතන් වහන්සේ ගෙන් සිදුවූයේ උදාර මෙහෙවරකි.

## 05. සසුනඹර එකලු කළ උපාලි තෙරණුවෝ

දැඩි හිරුරැස් වළකාලමින් සිසිල් සුළඟක් දසත හමා ගියේ ය. තුරුලතා මල්පලවලින් බරවී ය. සියොත්හු රසවත් පලතුරුවලින් කුස පුරවාගෙන තිසොල්මන් ව සිටිය හ. පරෙවියෝ සුදුමලින් ගෙත්තම් කළ වියනක් සේ අහසේ ඔබ මොබ පියාසර කරති. ගස්වල ළා දළු හිරු එළියෙන් රන් ඉරුපත් මෙන් දිලිසිනි. මෙලෙස අනෝමා ගං තෙර පිහිටි අනුපිය අඹ වනය හිටි හැටියේ විවිධ රූ රටා මවන්නට විය. සොබාදහම ලද එම විචිත්‍රවත් බව තියුණු කරවමින් සවණක් බුදුරැසින් බබලවමින් බුදුරජාණන් වහන්සේ අඹ රුක් සෙවණක වැඩ සිටියහ.

බුදුරජාණන් වහන්සේ අනුපිය අඹ උයනේ වැඩවසන පුවත ගම් නියම්ගම් සිසාරා පැතිර ගියේ අසුරු සැණිනි. මෙය සවණත වැකෙත් ම **භද්දිය, අනුරුද්ධ, ආනන්ද, කිම්බිල, භගු, දේවදත්ත ශාක්‍ය කුමාරවරුන්ට ඇතිවූයේ නිම්හිම් නැති සතුටකි.**

ඇහැ කන නැහැය දිව ගත පිනවන කලට
දුක මිස සැපක් සතුටක් නොමැතිය අපට
සිතමින් කල් ගෙවන විට අප හැම එකට
බුදුහිමි ගමට වැඩියේ අපෙ පෙර පිනට

මෙම සිතුවිලි පෙරටු කොට ශාක්‍ය කුමාරවරු බුදුරජාණන් වහන්සේ හමුවීමට තීරණය කළහ. ඔවුහු තම නරණවැමියා වූ උපාලි අතට රන් අබරණ දී මේවා මිළ කොට දිවි ඇතිතාක් සතුටින් ජීවත් වැන්නැයි කීහ. පිය විප්පයෝගයෙන් උපාලි හඬන්නට විය. රන් අබරණ රැගෙන යාම සුදුසු නැත. රජතුමා උදහස් ව තමා මරන්නට හැකියැ යි උපාලි සිතුවේ ය. කම් සැප හැරදා රජ දරුවෝ සසුන්ගත වෙත්නම් තමනට එය නුසුදුසු වන්නේ කෙසේ දැ යි උපාලිට හැඟුණි. හෙතෙම රන් අබරණ ගසක එල්ලා කුමාරවරුන් මුණ ගැසී තමා ද පැවිදිවීමට කැමති බව පවසා සිටියේ ය.

සියල්ලෝ ම අඹ වනයට පිවිස බුදුරජාණන් වහන්සේට නමස්කාර කළහ. සතුටු සාමීචි කතාබහෙන් පසු ව බුදුරජාණන් වහන්සේට ඔවුහු මෙසේ සැළකර සිටිය හ.

උපාලි මහරහතන් වහන්සේ ගේ චරිතයෙන් අපට ගතහැකි ආදර්ශ අතර පහත සඳහන් ඒවා ද වේ.

* විනය ගරුකව ක්‍රියා කිරීම.
* දත් දෙය හොඳින් මතකයේ තබා ගැනීම.
* තම දැනුම භාවිත කර ගැටලු විසඳීමට ක්‍රියා කිරීම.
* නිවැරදි අවබෝධයෙන් යුතුව හොඳ නරක විනිශ්චය කිරීම.
* හොඳින් ඉගෙනගෙන ගුරුවරයා ගේ ප්‍රශංසාවට ලක්වීම.
* තමන් වෙත පැවරෙන වගකීම් මැනවින් ඉටු කිරීම.
* බුදුසසුනේ පැවැත්මට තමන් ගෙන් ඉටුවිය යුතු යුතුකම් ඉටු කිරීම.

ක්‍රියාකාරකම් :

1. උපාලි මහරහතන් වහන්සේ ලැබූ අග තනතුර කුමක් ද ?
2. උපාලි තෙරුන් වහන්සේ ගේ චරිතයෙන් ඔබට ගතහැකි ආදර්ශ දෙකක් ලියා දක්වන්න.

පුහුණුවට :

"විනයො නාම සාසනස්ස ආයු"

| | |
|---|---|
| බුදු සසුන | රැකුමට |
| හැකිකම ලැබුණෙ | විනයට |
| සිනා මෙය | සැමවිට |
| අපිත් කැපවෙමු විනය | රැකුමට |

# 07. අපි සැදැහැතියෝ වෙමු

ධනංජය අයිය යි, අයේෂා නංගි යි ඉරිදා දහම් පාසලට යන්නේ හරිම කැමැත්තෙන්. මොක ද දන්නවා ද ? ආදර්ශවත් කවි, කතා දහම් කරුණු ඉගෙන ගන්න ලැබෙන නිසා. ඉතින් දවසක් අයියා දහම් පාසලේදී ඉගෙනගත් කතාවක් නංගිට නිවසේ දී කියා දුන්නේ මෙන්න මේ විදියට. අපි ඒ කතාවට දැන් සවන් දෙමු.

නංගි අද දහම් පාසලේ දී අපේ ගුරුතුමා අපට අලුත් කතාවක් කියලා දුන්නා.

මොකක්ද අයියේ, ඒ කතාව ?

ඒ තම යි නංගි, බුද්ධේනියා කතාව

නංගී ඒ කතාව අහල තියෙනවාද ?

නැහැ, අයියේ ඒ කතාව මට කියල දෙනවාද ?

හොඳයි එහෙනම් ඒ කතාව මම කියන්නම්. නංගි අහගෙන ඉන්න.

දඹදිව පැළලුප් කියලා නුවරක් තිබුණා. ඔය නුවර හිටියා බුද්ධේනියා කියා කුමාරිකාවක්, ඈ හරි ම ලස්සන යි. අම්ම යි තාත්ත යි මිය ගිහින්, ඒ අය ධනය හම්බ කළාට වියදම් කළේ නැහැ. ඒ නිසා බුද්ධේනියා අසූහත් කෝටියක ධනයට හිමිකාරියක් වුණා. කුමාරිකාව විවාහ කරගන්න හුඟක් කුමාරවරු කැමැත්තෙන් හිටියා. අවිවාහක ව මව්පියන්ගේ ධනයෙන් පින් දහම් කරන්නයි ඇය සිතුවේ.

ඉතින් නංගි දවසක් අශ්ව වෙළෙන්දෙක් බුද්ධේනියාගේමාළිගාවේ නවාතැන් ගත්තා. ඒ වෙළෙන්දා මාළිගාවෙන් පිටත් වී යන විට ඒ කුමාරියට අශ්ව පැටියෙකු තෑගි කළා.

කුමාරිකාව අශ්ව පැටවා ආදරයෙන් හැදුවා. ඌ ලොකු මහත්වුණා. ඌ තරම් වේගයෙන් දුවන්න පුළුවන් අශ්වයකු මුළු රටේ ම හිටියේ නැහැ. ඒ ගැන කුමාරිකාව හිටියේ හරිම සතුටකින්. බුද්ධේනියා දඹදිව ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඳ පුදා ගැනීමට බොහෝම ආශා කළා. ඒ සඳහා ඇයට බොහෝ දුරක් යෑමට සිදුවුණා. අශ්වයා නිසා මේ ගමන හුඟක් පහසු වුණා. කුමාරිකාව දිනපතා ම ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඳ පුදා ගන්න යන්න පුරුදුව සිටියා.

# 06. ධනය පිළිබඳ රුවන් වැකි

සිංහල බෞද්ධ සාහිත්‍යයේ උපදේශ කාව්‍ය අතර ලෝවැඩ සඟරාව, ලෝකෝපකාරය, සුභාෂිතය ප්‍රමුඛස්ථානයෙහි ලා සලකනු ලබන කෘතිහු වෙති. එම කෘති අතර දීර්ඝතම උපදේශ කාව්‍යය ලෝකෝපකාරය යි. උපදේශ කාව්‍යයන්හි අග්‍රඵලය ලෙස දැක්විය හැකි ලෝකෝපකාරය ගී විරිතින් බඳනාලද උසස් කෘතියකි. රණස්ගල්ලේ හිමිපාණන් වහන්සේගේ නිර්මාණයක් වන මෙම කෘතිය පද්‍ය 238 කින් යුක්ත ය. ශ්‍රී ලාංකික ජන සමාජය හැඩගැස්වීමෙහි ලා මහඟු මෙහෙයක් ලෝකොපකාරයෙන් සිදුවී තිබේ. එහි ධනය ඉපයීමට පරිභෝජනයට හා පරිත්‍යාගයට අදාළ ව රචනා වී ඇති වැදගත් ගී කිහිපයක් පහත දැක්වේ.

1. මසුරු දුදන දන - සුදනතට පත් දනට වැඩ වේ
   කරදිය මේ රදුට - අසුව සතහට අමා වන මෙන්

2. නිදුකින් සව් ඉසුරු - මඳව ලැබෙතත් නුවණ ඇත්තෝ
   අනුන් නසා ලබන - ඉසුරු සලකත් වසුරු අයුරින්

3. අදමින් ලත් ඉසුරු - නො පවතී සොරුන් සෙවු දන මෙන්
   දහමින් ලත් ඉසුරු - සැපත් එ සුරිඳු ලත් ඉසුරු වැනි

4. නොකා නොදී ඉසුරු - තබා දිවි රකින අය අවියත්
   කෙත් රැකවලට බැඳි - මිනිස් රූ වැනි තණින් බැඳ ලූ

5. මසුරු දනෝ දන් - දෙන්ට නො කියති ඇතත් යදිනට
   ගොළුවන්ට මුළු දිව - ඇතිමුත් කතා නොකියන මෙන්

(ලෝකෝපකාරය 24, 25, 125, 135, 139 ගී)

භාවය -

1. මසුරු ජනයන් ගේ ධනය යහපත් ජනයන් අතට පත්වූ කල්හි පොදු ජනයාට වැඩක් ම සිදුවේ. මුහුදු ජලය වැසි වලාකුළට හසු වූ කල්හි සත්වයාට අමෘතය මෙන් මිහිරි වන්නාක් මෙනි.

2. දැඩි දුකක් නොවිඳ ලැබෙන සම්පත්තිය ඉතා අඩු වුවත් නුවණ ඇති අය අනුන් නසා ලබන සම්පත්තිය අශුචි මෙන් පිළිකුල් කරති.

3. අධර්මයෙන් සපයා ගත් සම්පත් සොරුන් විසින් සපයා ගත් සම්පත් මෙන් නො පවති. ධර්මයෙන් ලැබූ සම්පත් ශක්‍රයා ගේ සම්පත්තිය හා සමාන වේ.

4. තමා කන්නෙත් නැති ව අනුන්ට දෙන්නෙත් නැති ව වස්තුව සඟවාගෙන ජීවිතය පවත්වාගෙන යන මෝඩයෝ කුඹුරු ආරක්ෂාවට තණකොළවලින් බැන්ද පඹයන් වැනි වෙති.

5. ලෝභී පුද්ගලයෝ සම්පත් ඇතත් යාචකයන්ට දන් දෙන්ට නො කියති. ගොළුවන්ට සම්පූර්ණ දිවක් ඇතිමුත් කතා නොකරන්නාක් මෙනි.

මෙම ගීවලින් දහම්පාසල් දරුවන්ට පහත සඳහන් උපදෙස් ලබා දී ඇත.

1. අධාර්මික ව (වැරදි මාර්ගවලින් ) ධනය ඉපැයීමෙන් වළකින්න.
2. දැහැමි ආකාරයට හරිහම්බ කර ගැනීමට පුරුදු වන්න.
3. අනුන්ට විපත් පමුණුවා තම සම්පත් වැඩි දියුණු කර ගැනීම ඉතාමත් පහත් ක්‍රියාවක් බව සිතීමට පුරුදු වන්න.
4. උපයන ධනය මසුරුකමින් සඟවා තැබීමට පුරුදු නොවී තමාගේත් අනුන්ගේත් ප්‍රයෝජනයට ගැනීමට පුරුදු වන්න.
5. ලෝභ නැති ව හැකි පමණින් දන් දීමට පුරුදු වන්න.

හඳුන්වා දෙන වචන

| | | |
|---|---|---|
| පත | - | පත් වූ කල්හි |
| මේ රඳුට | - | වලාකුළට |
| වසූරු | - | අශුචි |
| සුරනිඳු | - | ශක්‍රයා |
| යදිනට | - | හිඟන්නන්ට |
| කරදිය | - | මුහුදු ජලය |

බුද්ධෛනියා මෙසේ නිතර අසු පිටින් යන එන බව දුටු වැදි තරුණ පිරිසක් ඇයව අල්ලා ගන්න සිතුවා. ඒ සඳහා දවසක් මග රැකගෙන සිටියා.

එදා ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඳ පුදා ගැනීමට අසු පිටින් ගමන් කරමින් සිටි බුද්ධෛනියා කුමරිය දුරදී ම දැක්කා වැදි පිරිස. ඔවුන් ගෙන් තමන්ට අනතුරක් වන බව වැද්දන්ගේ පෙනුමෙන් ම කුමරියට හිතුනා. කුමරිය සංඥාවක් නිකුත් කළා. අශ්වයා පවනට බඳු වේගයෙන් දුවන්නට වුණා. අශ්වයාගේ වේගය නිසා වැදි පිරිසට කිසිවක් කරගන්න බැරිවුණා. ඔවුන්ට අසු නොවී කුමරියට තම වන්දනා ගමන යෑමට හැකියාව ලැබුණා.

බුද්ධෛනියා කුමරිය දිනපතා ම ශ්‍රී මහා බෝධීන් වහන්සේ වන්දනා කිරීමට ගියේ ඇය තුළ ඉමහත් ශ්‍රද්ධාවක් තිබුණ නිස යි. කරදරවලින් ආරක්ෂා වීමට මේ ගුණධර්මය බොහෝසේ බුද්ධෛනියා කුමරියට උපකාරී වුණා. මරණින් මතු ඇය දෙව්ලොව උපන්නා.

"අයියේ, අයියා කීවානේ බුද්ධෛනියා කුමරිය තුළ ශ්‍රද්ධාව තිබුණා කියලා. අපි කොහොම ද ශ්‍රද්ධාවන්තයෙකු හැඳින ගන්නේ ?" කියා නංගි ඇසුවා.

"නංගි, සැදැහැවතුන් තුළ පවතින ගුණාංග තුනක් තියෙනවා. ඒ ගුණාංග බුද්ධෛනියා තුළත් තිබුණු බව ගුරුතුමා අපට පෙන්වා දුන්නා."
"මොනව ද අයියේ ඒ ගුණාංග ? "

"නංගි, සැදැහැවතා බුදුරජාණන් වහන්සේ, රහතන් වහන්සේලා, භික්ෂූන් වහන්සේලා, වැනි සිල්වත් ගුණවත් උතුමන් ඇසුරු කරන්න කැමැති යි. ඇසුරු කර උන්වහන්සේලා ගෙන් බණ අසන්නත් හරිම කැමැති යි. මසුරුකම් දුරුකර පින්දහම්වල යෙදෙනවා."

"හොඳයි, දැන් නංගි කියන්න බලන්න ශ්‍රද්ධාවන්තයා ගේ ලක්ෂණ තුන මොනවා ද කියල."

"සිල්වතුන් දැකීමට කැමැති යි
බණ අහන්න කැමැති යි
මසුරු නැතිව දන් දෙන්න කැමැති යි. හරි නේද අයියේ ?"

"හරි, නංගි හොඳට මතක තියාගත්ත නේ. ඔය අදහස් තියෙන්නේ නංගී ගාථාවක, මම ඒ ගාථාවත් කියලා දෙන්නම්."

දස්සනකාමෝ· සීලවතං
සද්ධම්මං සෝතුමිච්ඡති
විනෙය්‍ය මච්ඡේර මලං
සවේ සද්ධොති වුච්චති

සිල්වත් උතුමන් දකිනට කැමති යි
නිබඳ ව සදහම් ඇසුමට කැමති යි
මසුරු නැතු ව දන් දීමට කැමති යි
සැදැහැ ගුණය ඇතිබව ඉන් කියවෙ යි

අපිත් බුද්ධෛනියා කුමාරිකාව වගේ සැදැහැයෙන් කටයුතු කිරීමට පුරුදු පුහුණු වෙමු.

'බුද්ධෛනියා කතාව කියලා දුන්නට අයියට තෙරුවන් සරණ යි.' නංගිටත් තෙරුවන් සරණ යි.'

**ක්‍රියාකාරකම් :**

1. සැදැහැවතා ගේ ලක්ෂණ තුන මතකයෙන් කියන්න.
2. සිල්වත් උතුමන් හැටියට සැලකෙන්නේ කවුරුන් ද ?
3. බණ ඇසීමෙන් ලැබෙන ආනිශංස ගැන ගුරුතුමා සමඟ සාකච්ඡා කරන්න.
4. දන් දීමේ දී යටපත් කරගත යුතු අකුසල චේතනා තුන ගුරුතුමා ගෙන් අසා දැන ගන්න.
5. ඔබ කරන හොඳ වැඩ පහක් ලියා පෙන්වන්න.

# 08. දම්සක් පැවතුම තෙක් බුදු සිරිත

ශාක්‍ය ජනපදයේ උපත ලත් සිදුහත් කුමාරයාණෝ යස ඉසුරු රජ සැප මැද ඇති දැඩි වූහ. පසු කලෙක සතර පෙර නිමිති දැක ජීවිතය ගැන විමසිලිමත් ව එහි සැබෑතතු සොයන්ට පෙළඹුණ හ. අභිනිෂ්ක්‍රමණය කර අනෝමා ගං තෙර දී උන්වහන්සේ පැවිදි වන්නේ එහි ප්‍රතිඵලයක් ලෙසට ය.

සිදුහත් බෝසතුන් දැන් සරල ජීවිතයක් ගත කරන තාපසවරයෙකි. මෙතෙක් කිසිවකුත් නො දුටු නො ඇසූ නිවන් මග සොයා යන සිදුහත් තාපසතුමාණන්ට ආලාරකාලාම - උද්දකරාම පුත්ත තාපසවරු හමුවූහ. එතුමන් වෙතින් ධ්‍යාන ලබාගත්ත ද එය සත්‍යාවබෝධයට අදාළ නොවන්නක් බව වැටහිණි. තමන් ලද ඉගෙනුම විමර්ශනයට ලක්කිරීම බුද්ධිමත් ශිෂ්‍යයකුගේ ලක්ෂණයකි. එය බෝසතුන් තුළ දක්නට ලැබිණ. ගෞරවාන්විත ව ගුරුවරුන්ගෙන් සමුගත් බෝසතාණෝ කිසි විටෙකත් ගුරුවරුන් විවේචනය නොකළ හ. මේ ලක්ෂණ දිස්වන්නේ හොඳ සිසු දරුවකු තුළම ය.

ගුරුවරුන්ගෙන් සමුගෙන කුසලය නම් කුමක්දැ යි තනිව ම සොයා යන බෝසතාණන් වහන්සේ උරුවෙලාවෙහි සේනානි නම් නියම් ගමට පැමිණිය හ. මෙය නම් භාවනාවට සුදුසු පරිසරයකැ යි එතුමන්ට සිතිණ. ඒ බව බුදුවීමෙන් පසුව උන්වහන්සේ විස්තර කළේ මෙසේ ය.

"මම නිවන සොයමින් සේනානි නම් නියම් ගමට පැමිණියෙමි. එහි සිත්කලු භූමි භාගය ද දුටුවන් පහදවන වනලැහැබ ද සුදු වැලිතලා ඇති එගොඩ මෙගොඩ වීමට මනා තොටුපළවල් ඇති ගලා බස්නා නේරංජරා නදිය ද අවට පවත්නා ගොදුරු ගම ද දුටුවෙමි. එය දුටු මට මෙ බඳු සිතක් පහළ විය. පධන් වීර්යය කරනු කැමැති කා හට වුව ද මෙම පරිසරය ඒකාන්තයෙන් ම සුදුසු ය."

මෙසේ සිතූ බෝසතාණන් වහන්සේ එහි නැවතී සිරුරට අධික දුක් දෙමින් උග්‍ර තවුස් දම් පුරන්නට තීරණය කළ හ. ඒ අත්දැකීම පසු කලෙක බුදුමුවින් පළවුයේ මෙසේ ය.

"මම මුං යුෂ, කොල්ලු යුෂ, කඩල යුෂ, මෑ යුෂ, ටික ටික වැළඳීමි. ආහාර අඩුකම නිසා මගේ සිරුර ඉතාම කෙට්ටු විය. කළුවැල් පුරුක් මෙන් ඇඟ පසඟ සිහින් විය. දිරාගිය ශාලාවක පරාල මතුවී පෙනෙන්නා සේ ඉළ ඇට මතුවී පෙනිණි. ඇස් ගැඹුරු ළිඳක් පත්ලෙහි දියෙහි පෙනෙන තරුමෙන් විය. ළපටි කල කැඩූ තිත්ත ලබු ගෙඩියක් අව්වෙන් වේලී හැකිලි යන්නාක් මෙන් හිසේ සම හැකිළී ගියේ ය. බඩ අතගාමියි සිතා කොඳු ඇටය අතගාමි. කොඳු ඇටය පිරිමදිමි යි සිතා බඩේ සම පිරිමදිමි. බඩේ සම කොඳු නාරටියට ම ඇලී ගියේ ය. මළමුත්‍ර පහකිරීමට යාමේ දී එතැන මුනින් වැටුනෙමි. සිරුර අතින් පිරිමදින විට කුණු වී ගිය ලොම් වැටෙන්නට විය. ඇතමෙක් මගේ සිරුර කළු පාට යි කීහ. සමහරු දුඹුරුයි කීහ. දුඹුරුත් කළුත් නොව සුදුමැලි වී ඇතැ යි තවෙකෙක් කීහ. මෙලෙස ඉතාම පිරිසිදු පැහැබර මගේ සිරුර පිරිහී ගියේ ය. "

දුෂ්කර ක්‍රියාවෙන් බෝසතාණන් වහන්සේ අපට දුන් ආදර්ශය නම් තම ඉලක්කය සඵල වන තුරු විවිධ කැපකිරීම් කිරීමට සූදානම් විය යුතු බව යි. උග්‍ර තවුස්දම් පිරීමෙන් විමුක්තිය ලද නොහැකි බව වටහාගත් බෝසතාණන් වහන්සේ මැඳුම් පිළිවෙතට පිළිපන්හ. සොත්ථිය බමුණාගෙන් ලද කුසතණ අතුරා ඇසතු රුක මුල වැඩ සිටියේ, මස් ලේ වියළී ගොස් ඇට නහර පමණක් ඉතිර වුව ද බුදු වී මිස නොනැගිටිමි යන තිර අදිටනිණි. යමක් කිරීමට ස්ථිර ව සිතා ගැනීම අධිෂ්ඨානය යි. කිසිදු කාර්යයක් අධිෂ්ඨානයෙන් තොරව සපුරාගත නොහැකි ය. එය බෝසත් සිරිතෙන් අපට ලබාදෙන උතුම් ආදර්ශයකි.

අවට පරිසරය නිහඬ ය, ශාන්ත ය, වෙසක් සඳරැසින් මුළු පෙදෙස ම ඒකාලෝක වෙයි. බෝසතාණන් වහන්සේ ගේ සිත සමාධිගත විය. උන්වහන්සේ ත්‍රිවිද්‍යා උපදවා සිව්සස් සිය නැණින් දැන සම්බුදු බවට පත්ව අසමසම ශාස්තෘවරයාණන් බවට පත් වූහ.

පැරණි වූ නිසා ම යමක ඇලී ගැලී නොසිට එයින් යහපතක් නොවන බව දුටු විට නව පිළිවෙතක් සොයා යෑමෙ වැදගත් කම හා ඵලදායකත්වය මෙ මගින් අපට ලබාදෙන ආදර්ශය යි. තම අපේක්ෂාවන් ඉටුවීම කාට වුව ද සතුට ගෙන දෙන්නකි. "අනේක ජාති සංසාරං" ආදී උදානයෙන් තම ප්‍රීතිය බුදුරජාණන්

වහන්සේ ලොවට පළ කළහ. බුදු බවට පත්වීමෙන් අනතුරුව සති හතක් ම බුදුපියාණෝ ශ්‍රී මහා බෝධීන් වහන්සේ අවට කාලය ගත කළහ.

පළමු සතිය බෝ මැඩ අසල විමුක්ති සුවයෙන් ගතකර පටිච්ච සමුප්පාදය මෙනෙහි කළ සේක. කළගුණ දක්වනු වස් බෝධීන් වහන්සේට අනිමිස ලෝචන පූජාව කළේ දෙවන සතියේ ය. තුන්වන සතිය සක්මන් කරමින් ද සිව්වන සතිය රුවන් ගෙයි අභිධර්මය මෙනෙහි කරමින් ද කල් ගෙවූ හ. පස්වන සතිය අජපාල නුගරුක මුල වැඩ හිඳිද්දී තමන් වහන්සේ සොයාගත් ධර්මය ගුරු තනතුරේ තබා ගත් සේක. වර්ෂාව පැවැති සවැනි සතිය මිදෙල්ල රුකමුල මුචලින්ද නාරජුගේ ආවරණය යට කල්ගත කළහ. රාජායතනයේ කිරිපලු රුක මුල වැඩ සිටි සත්වන සතිය අවසානයේ දී තපස්සු භල්ලුකවෙළෙඳ දෙබෑයෝ බුද්ධ රත්නය හා ධර්ම රත්නය සරණ ගිය පළමු උපාසකයෝ වූහ.

සති හත අවසානයේ බුදුරජාණන් වහන්සේට මෙවැනි අදහසක් පහළ විණි.

"මා අවබෝධ කරගත් දහම ඉතා ගැඹුරු ය. දැක්මට හා අවබෝධයට අපහසු ය. එහෙත් ශාන්ත ය, ප්‍රණීත ය, තර්ක කිරීමෙන් දැනගත නො හැකි ය. නුවණැත්තන් විසින් ම අවබෝධ කළ යුත්තකි. එම දහම ලෝකයාට දේශනා කිරීම හුදෙක් මට වෙහෙස ගෙන දෙන්නක් පමණක් වේ ද ?"

එම සිතුවිල්ලෙන් පළමුව දහම් නො දෙසන පැත්තට සිත නැමුනද දෙවනු ව බුදු ඇසින් ලොව බැලූ කල මිනිස් සමාජය නෙළුම් විලක්සේ පෙනිණි.

"විලෙක ජලයෙහි හටගෙන ජලයෙහි වැඩුණු ජලයෙන් උඩට නො ආ මල් පොහොට්ටු තිබේ. දියෙහි හටගෙන දියෙහි වැඩුණ දිය හා සමව පවතින මල් පොහොට්ටු ද තිබේ. දියෙහි හටගෙන දියෙහි වැඩුණ දියෙන් උඩ නැඟි දියෙහි නොගෑවී පවතින මල්ද තිබේ. ඒ මල් සේ කෙලෙස් අඩු- කෙලෙස් වැඩි - තියුණු ඉඳුරන් ඇති -මෘදු ඉඳුරන් ඇති, යහපත් ආකාර ඇති- 'අයපහත් ආකාර ඇති' පහසුවෙන් අවබෝධ කරවිය හැකි- පහසුවෙන් වටහා දිය නොහැකි සත්වයන් මම දිටිමි"

දහම් දෙසීමට උත්සුක වූයේ ඉන් පසුව යි. කාහට දහම් දෙසම් දැ යි කල්පනා කළ බුදුරජාණන් වහන්සේට සිහිපත් වූයේ ආලාරකාලාම, උද්දකරාමපුත්ත යන ආචාර්යවරුන් ය. මේ වන විට ඔවුන් මියගොස් ය. දුෂ්කර ක්‍රියා සමයේ දී තමන් වහන්සේට උවටැන් කළ පස්වග මහණුන් සොයා බරණැස ඉසිපතනයට වැඩම කළේ ඉනික්බිතිව ය. ගුරු ගෞරවය කල්‍යාණ මිත්‍රත්වය, කළගුණ සැලකීම, පරාර්ථකාමී බව මෙ මගින් බුදුරජාණන් වහන්සේ අපට පෙන්වා දුන් ආදර්ශ වේ. එමෙන් ම සත්‍යය සොයා තමන් වෙත පැමිණෙන තුරු බලා නොසිට එබඳු අය. සොයා වැඩමවීම බුදු සිරිතේ දක්නට ලැබෙන උතුම් ලක්ෂණයකි.

බරණැසට වැඩමවන අතරමග දී උපක ආජීවකයා හමු විය. හෙතෙම බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ විමසී ය.

"ඔබගේ ඉඳුරන් ප්‍රසන්න ය. සිරුරේ පැහැය ඉතා පිරිසිදු ය. ඔබතුමා කවරෙකු උදෙසා පැවිදි වූයේ ද ? ඔබතුමාගේ ගුරුවරයා කවරෙක් ද ?"

පිළිතුර වශයෙන් බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ.

"මට ගුරුවරයෙක් නැත. මා හා සමාන වූවෙක් නැත. මම ලොවෙහි උතුම් ශාස්තෘවරයා වෙමි. සම්මා සම්බුද්ධ වෙමි. නිවුණු - සැනසුණු කෙනෙක්මි. දම්සක් පැවැත්වීමට කසී පුරයට යමි"

බුදුරජාණන් වහන්සේ උපක ආජවකයාට තමන් වහන්සේ ගැන හඳුන්වාදීමෙන් ගත හැකි ආර්ශයක් ඇත. එනම් අමුත්තන්ට තමන් නිවැරදි ව හඳුන්වා දිය යුතු බව යි.

බුදුරජාණන් වහන්සේ දිගු මගක් ගෙවා බරණැස ඉසිපතනයට වැඩම කළ හ. උන් වහන්සේගේ වැඩමවීම දුරදීම දුටු පස්වග තවුසෝ "අපි කියන දේ නො අසා බුදුවිය නොහැකි ව ආපසු වඩිනවා" යයි සිතූහ. අපි සත්කාර නොකරමු යැ යි ඔවුහු කතිකා කරගත්හ. බුදුරජාණන් වහන්සේ ඔවුන් වෙත සමීපවත් ම ඔවුනගේ එම තීරණය බිඳ වැටිණ. කළයුතු වතාවත් නිසිලෙස ඉටු කළහ. "ආවුසො" යන වදනින් උන්වහන්සේ ඇමතූව ද, එසේ ඇමතීම සුදුසු නොවන බව බුදුරජාණන් වහන්සේ ඔවුන්ට පෙන්වා දුන්හ. ගරු කළ යුත්තනට ගරු කිරීමේ හා ඔවුනොවුන්ට උචිත වචනයෙන් ඇමතීමේ අගය මෙයින් වටහා දුන් සේක

බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතනාරාමයට වැඩමවූයේ ඇසළ පොහෝ දිනයක ය. තමන් වහන්සේ අවබෝධ කරගත් දහම එදින පස්වග තවුසන්ට දේශනා කළහ. එම දහම ඇතුළත් සූත්‍රය ධම්මචක්කප්පවත්තන සූත්‍රය නමින් හැඳින් වේ. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව මෙය යි. කාමසුඛල්ලිකානුයෝගය හා අත්තකිලමථානුයෝගය, යන අන්ත දෙකේ අයහපත් බවත් මධ්‍යම ප්‍රතිපදාවේ අගයත් චතුරාර්ය සත්‍යයත් මෙම සූත්‍රයෙහි ඇතුළත්ව තිබේ.

දේශනාව අසා කොණ්ඩඤ්ඤ තාපසතුමා සෝවාන්ව පැවිද්ද ලබාගත්තේ ය. උන් වහන්සේ ගෞතම බුද්ධ ශාසනයේ පළමු ශ්‍රාවකයන් වහන්සේ ය. පසුව අනෙක් සතර දෙනා වහන්සේ සෝවන්ව පැවිදි බව ලැබූහ. පස් දෙනා වහන්සේ ම අනත්තලක්ඛණ සූත්‍රයේ ඇතුළත් දහම් අසා අඳුරු රැයක් පහන් කළ හිරුමඬල සේ රහත් ඵලයට පත්වූහ.

**ක්‍රියාකාරකම් :**

1. මහබිනික්මණේ සිට දම්සක් පැවතුම තෙක් බුදු සිරිතේ එන සිදුවීම් සහ ඒවා ඇසුරෙන් ගතහැකි ආදර්ශ පහක් පහත සඳහන් අන්දමට වගු ගතකර දක්වන්න :

| සිද්ධිය | ආදර්ශය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |

පුහුණුවට

අනේක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවේසන්තෝ - දුක්ඛා ජාති පුනප්පුනං

ගහකාරක දිට්ඨෝසි - පුන ගේහං න කාහසි
සබ්බා තේ ඵාසුකා භග්ගා - ගහකූටං විසංඛිතං
විසංඛාර ගතං චිත්තං - තණ්හානං ඛයමජ්ඣගා

යළි යළි ඉපදීම දුක් සහිතය දකිමින්
පස්කඳ ගෙය සදන වඩුවා ගැන සොයමින්
සංසාරයේ නෙක නෙක ජාතියෙ රැඳෙමින්
ඔබ මොබ ඇවිද්දෙමි මම ඔබ ගැන සිතමින්

පස්කඳ සදන තණ්හා වඩුවා දිටිමි
යළි ගෙය සදන්නට ඉඩකඩ මම නොදෙමි
පරාල සහ කැණි මඩල ද සුන් කෙළෙමි
සිත නිවනට යොමා සම්බුදු බව ලදිමි

## 09. ධර්මාශෝක රාජ්‍ය සමයට පෙර ශාසනික තොරතුරු

බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේ දී ම ධර්මය සංගායනා කිරීමේ ඇති අවශ්‍යතාව පෙන්වා දී තිබිණි. එහෙත් ධර්ම සංගායනා පැවැත්වූයේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ය. භාරතීය ශාසන ඉතිහාසයෙහි එවැනි ථෙරවාදී ධර්ම සංගායනා තුනක් ගැන තොරතුරු හමුවේ. එයිනුත් සංගායනා දෙකක් පවත්වා ඇත්තේ අශෝක රජතුමාගේ රාජ්‍ය කාලයට පෙර ය. අපි එම සංගායනා දෙක පිළිබඳ ව මෙම පාඩමෙන් ඉගෙන ගනිමු.

### ප්‍රථම ධර්ම සංගායනාව

සංගායනා යන්නෙහි අරුත සාමූහික ව කියවීම යන්න ය. භික්ෂූන් වහන්සේලා එකතු වී බුදුරජාණන් වහන්සේ වදාළ ධර්ම විනය සියල්ලන් ඉදිරියේ කියවා පොදුවේ මේ බුද්ධ දේශනය යි කියා සම්මුතියකට එළඹීම ධර්ම සංගායනා ලෙස හැඳින්වේ. එලෙස සංවිධානාත්මක ව පළමුවන ධර්ම සංගායනාව පවත්වන ලද්දේ බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවූ විට ය.

### සංගායනාවේ නිදානය

බුදුපියාණන් වහන්සේ පිරිනිවන් පෑ බව මහාකාශ්‍යප තෙරණුවන්ට ආරංචි විය. භික්ෂූන් වහන්සේලා පිරිසක් සමග උන්වහන්සේ පාවා නුවර සිට කුසිනාරා නුවර බලා වැඩම කරන කල්හි බුදුරදුන්ගේ වියෝවෙන් පුහුදුන් භික්ෂූන් වහන්සේ හඬන්නට වූහ. ඒ අතර සිටි මහලු කල පැවිදිවූ සුභද්‍ර නම් භික්ෂුව වැළපෙන භික්ෂු පිරිස අස්වසමින් මෙසේ පැවසීය.

"ඇවැත්නි, ශෝක නොවන්න. නොවැළපෙන්න. ඒ මහා ශ්‍රමණයාගෙන් අපි මිදුනෙමු. මේ දෙය කැපය මේ දෙය අකැපය යි නීති පැනවීම නිසා මෙතෙක් කල් අපි පීඩා වින්දෙමු. දැන් අපට කැමැති දෙයක් කළ හැකි ය. අකැමැති දෙයක් නොකළ හැකි ය. "

සුභද්‍ර භික්ෂුවගේ එම ප්‍රකාශය ඇසූ මහාකාශ්‍යප තෙරණුවෝ ධර්ම සංවේගයට පත්වූහ. මෙවන් අය මතුවටත් ඇති වුවහොත්

## 10. සිහිය උපදවා බවුන් වඩමු.

සුද්ධෝදන රාජ්‍යයේ රාජකීය වප් මඟුල් දිනය උදාවිය. කිඹුල්වත් නුවර දෙව් පුරයක් මෙන් සරසා තිබුණි. මුළු කෙත්යාය ම අලංකාරවත්ය. සුදොවුන් රජතුමා මෙම සී සෑමේ උළෙලට සහභාගී වූයේ සිය පුත් කුමරු ද සමඟ ය. වෙල්යාය අද්දර විශාල දඹ රුකකි. එය පාමුල සකස් කළ යහනෙක කුමරු නිදිකරවා සිටියේය. රජතුමා ඇති ඇමතිවරුන් පිරිවරාගෙන සී සෑමෙහි යෙදී සිටියේ ය. කුමරුගේ ආරක්ෂාවට සිටි කිරි අම්මාවරුන්ගේ නෙත් සී සෑම දෙස යොමු වූයේ ද නිරායාසයෙනි. නින්දෙන් අවදි වූ සිදුහත් කුමාරයා තමා අවට කිසිවකු නොදැක යහනෙහි ම පලක් බැඳ ඉඳ ගත්තේ ය. භාවනාවෙහි නියැලුණේය. සිදුහත් කුමරු එදා වැඩූ භාවනාව ආනාපානසතිය යි. බුදු වීමේදීත් බෝසතාන් වහන්සේට මෙම භාවනාව උපකාර විණි.

බෞද්ධ භාවනා අතර වඩාත් ප්‍රචලිත ව ඇති භාවනාව ආනාපානසතිය යි. පාලි භාෂාවෙන් "ආන" යයි කියනුයේ හුස්ම ඇතුළට ගැනීමට යි. හුස්ම පිට කිරීම "අපාන" නම් වේ. ආන හා අපාන යන වචනවල එකතුවෙන් "ආනපාන" යන්න සෑදී තිබේ. හුස්ම ගැනීම හා පිට කිරීම හෙවත් ආශ්වාස ප්‍රශ්වාස දෙකට අපේ සිහිය යොමු කිරීම ආනාපාන සති භාවනාව ය.

ආනාපානසති භාවනාව පුරුදු කරන විට සිතට නරක සිතුවිලි ඇතුළු නොවේ. නරක සිතුවිලි තිබිණි නම් ඒවා ඉවත් ව සිත පිරිසිදු වේ. ඇදුම, පීනස, හෘදයාබාධ වැනි රෝග සුවකර ගැනීමට ද මෙම භාවනාව ඉවහල් වේ. ජීවිතයේ සෑම කාර්යයක් ම සාර්ථව ව හා සතුටින් කර ගැනීමේ ශක්තිය ඇති වේ. මේ භාවනාව ගතට හෝ සිතට කිසිදු වෙහෙසක් ඇති නොකර යි. සිත වහා සන්සුන් කර ප්‍රබෝධවත් කරයි. හොඳින් හුස්ම ගන්නා විට තරුණ බව හා නිරෝග බව සුරැකේ. ගත සැහැල්ලු වේ. සිත සන්සුන් වේ. මතක ශක්තිය වැඩේ.

දිනපතා ම නියමිත වේලාවක් ආනාපානසති භාවනාව කිරීමට අපි පුරුදු වෙමු. සිත අසංවර වූ මොහොතක ටික වේලාවක් මෙම භාවනාව කිරීමට හුරුවෙමු. එවිට සිත සංවර වේ. ස්වභාවික ක්‍රියාවලියක් ලෙස ආශ්වාස ප්‍රශ්වාස කරන අපි භාවනාව පුහුණු කිරීමේ දී සිහියෙන් යුතුව හුස්ම ගැනීම හා හුස්ම හෙළීම සිදු කරමු.

ඔවුන්ගෙන් ත්‍රිපිටක ධර්මයට හානි විය හැකි යැ යි උන් වහන්සේට සිතිණි. විසිර පැවති ධර්ම කරුණු පොදු සංග්‍රහයක් ලෙස සකසා තිබීම ද අවශ්‍ය විය.

**සංවිධාන කටයුතු**

මහාකාශ්‍යප මහරහතන් වහන්සේ විසින් සුදුසුකම් ඇති තෙරුන් වහන්සේලා හාරසිය අනූනව නමක් මෙම සංගායනාවට තෝරා ගන්නා ලදහ. මේ වන තුරුත් ආනන්ද තෙරණුවෝ රහත් ඵලයට පත්ව නොසිටිය හ. ධර්ම භාණ්ඩාගාරික වූ උන්වහන්සේගෙන් තොරව මෙම සංගායනාව සිදු කළ නො හැකි ය. එහෙයින් ආනන්ද තෙරණුවන් ගැන අපේක්ෂාවෙන් එක් අසුනක් හිස්ව තැබිණ. සංගායනාවට පෙර දින රාත්‍රියෙහි ආනාන්ද තෙරණුවෝ රහත් වූහ. මෙයින් රහතන් වහන්සේලා 500 සම්පූර්ණ විය. මෙම සංගීතිය "පඤ්ච සතිකා" නමින් හැඳින්වෙන්නේ එලෙස රහතන් වහන්සේලා පන්සිය නමක් ඇතුළත් වූ බැවිනි. සංගායනාව සිදුකළේ රජගහනුවර වේභාර පර්වතය පාමුල පිහිටි සප්තපර්ණී ගුහාවේ දොරටුව අභියස තැනූ මණ්ඩපයකදී ය.

මේ සඳහා අවශ්‍ය ආරක්ෂාව මෙන් ම පහසුකම් ද සපයන ලද්දේ අජාසත් රජතුමන් විසිනි. මහාකාශ්‍යප තෙරණුවෝ සංගායනාවේ මූලාසනය හෙබවූ හ.

**සංගායනා කළ පිළිවෙළ**

මූලාසනයේ වැඩ සිටි මහාකාශ්‍යප තෙරණුවෝ විනය පිළිබඳ ප්‍රශ්න නැගූහ. ඒවාට පිළිතුරු සැපයූවේ විනයධාරීන් අතර අග්‍ර වූ උපාලි තෙරණුවන් ය. පසුව එම කරුණු පන්සිය දෙනා වහන්සේ ම අනුමතකොට සජ්ඣායනා කළහ. දෙවනු ව ධර්මය සංගායනා කරන ලදි. මහාකාශ්‍යප තෙරණුවෝ ප්‍රශ්න ඇසූ හ. ඒවාට පිළිතුරු දුන්නේ ආනන්ද තෙරණුවන් ය. අනතුරුව සංගීති කාරක මහතෙරවරු සියල්ල අනුමත කොට එක්ව සජ්ඣායනා කළහ.

## සංගායනාවේ ප්‍රතිඵල

එහිදී ත්‍රිපිටක ධර්මයේ ආරක්ෂාව පිණිස පියවර ගැනුණි. තම තමන්ගේ ශිෂ්‍ය පිරිසට ඉගැන්වීම සඳහා විනය පිටකය උපාලි තෙරණුවන්ට ද දීඝ නිකාය ආනන්ද තෙරණුවන්ට ද සංයුක්ත නිකාය මහා කාශ්‍යප තෙරණුවන්ට ද අංගුත්තර නිකාය අනුරුද්ධ තෙරණුවන්ට ද පවරන ලදී. මජ්ඣිම නිකාය සැරියුත් තෙරණුවන්ගේ ශිෂ්‍ය පිරිසට ද පවරන ලදී. ඛුද්දක නිකාය බුද්ධ කාලයේ සිටම භික්ෂූන් විසින් ද අභිධර්මය සැරියුත් මහ තෙරණුවන්ගේ ශිෂ්‍ය පිරිස විසින් ද පවත්වා ගෙන එන ලදී.

සත් මසක් මුළුල්ලේ පැවති මෙම සංගීතිය ශාසනයේ චිර පැවැත්මට බෙහෙවින් ඉවහල් විය.

## දෙවන ධර්ම සංගායනාව

පළමු වන ධර්ම සංගායනාවෙන් පසු තෙරුන් වහන්සේලා සෑහෙන කාලයක් පවිත්‍ර ව බුදු දහම පවත්වා ගෙන ආහ. බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු සියයක් ගත විය. කාලාශෝක රජතුමා රජවී වසර දහයක් ගෙවුණි. මේ වන විට විශාලා මහනුවර මහ වන විහාරයෙහි වජ්ජිපුත්‍රක භික්ෂූහු වාසය කළහ. මේ භික්ෂූහු බුදුරජාණන් වහන්සේ අකැපය යි වදාළ කරුණු දහයක් කැපය යි ප්‍රකාශ කළහ. ඒවා අනුගමනය ද කළහ. දස අකැප වස්තු නම් වූ ඒ දහය මෙසේ ය.

1. අවශ්‍ය වූ විටෙක ආහාරවලට මිශ්‍රකර ගැනීම සඳහා අඟක ලුණු තබා ගැනීම කැපය. (සිංගිලෝණ කප්ප)
2. ඉර අවරට ගොස් සෙවණැල්ල ඇඟල් දෙකක් වනතුරු දන් වැළඳීම කැපය (ද්වංගුල කප්ප)
3. ගමකින් ගමකට යෑමේ දී ආහාර රැගෙන යාම කැපය (ගාමන්තර කප්ප)
4. මහාසීමාවක් තුළ පිහිටි කුඩා කුඩා ආවාසයන්හි වෙන වෙන ම විනය කර්ම කිරීම කැපය. (ආවාස කප්ප)

ආනාපානසති භාවනාව මීට පෙර ද අපි පුරුදු කෙළෙමු. මෙම පාඩමේ දී එහි තවත් ඉදිරි පියවරක් ඉගෙන ගනිමු. මීට පෙර අප භාවිත කළේ හුස්ම ගැනීම එක වාරයක් ලෙසත්, හුස්ම පිට කිරීම තවත් වාරයක් ලෙසත් ය. හුස්ම ගැනීමේ දී එකයි කියූ අප හුස්ම පිට කිරීමේදී භාවිත කළේ දෙක යි යන්න යි. මෙම පියවරේ දී අනුගමනය කරන්නේ හුස්ම ගැනීම සහ පිට කිරීම එක වාරයක් වශයෙනි. අපි විස්තර කළ දේ දැන් ක්‍රියාවට නගමු.

ශිෂ්‍යයන් එරමිණිය ගොතාගෙනත් (බද්ධ පර්යංකයෙන්) ශිෂ්‍යාවන් පා පසුපසට නමාගෙනත් (අර්ධ පර්යංකයෙන්) හිඳගන්න. ඇඟිලි හොඳින් එකතුවන සේ අත්දෙක එක්කර නළලත තබාගෙන තෙවරක් නමස්කාරය කියන්න. අනතුරුව තමන්ට ඇසෙන සේ සිහින් හඬින් පහත සඳහන් කවියෙහි අර්ථය මෙනෙහි කරමින් කියන්න.

| | | |
|---|---|---|
| මම සතුන් නොමරමි | - | සොරකම් කිසිත් නොකරමි |
| දුසිරිතෙන් දුරුවෙමි | - | බොරු බසින් මත් දෙයින් වළකිමි |

දෑස් පියාගෙන හොඳින් හුස්ම ඉහළට පහළට හෙළා කය සැහැල්ලු කර භාවනාව ආරම්භ කරන්න.

හුස්ම ඉහළට ගැනීම සහ හෙළීම එක ම වාරයක් ලෙස මතක තබාගන්න.

**පළමු පියවර**

| | |
|---|---|
| (පළමු හුස්ම වාරය) | එකයි .... එකයි .... එකයි .... එකයි .... එකයි |
| (දෙවන හුස්ම වාරය) | දෙකයි .... දෙකයි .... දෙකයි .... දෙකයි .... දෙකයි |
| (තෙවන හුස්ම වාරය) | තුනයි .... තුනයි .... තුනයි .... තුනයි .... තුනයි |
| (සිව්වන හුස්ම වාරය) | හතරයි .... හතරයි .... හතරයි ..... හතරයි .... හතරයි |
| (පස්වන හුස්ම වාරය) | පහයි .... පහයි .... පහයි .... පහයි .... පහයි |

නැවතත්

| | |
|---|---|
| (පළමු හුස්ම වාරය) | එකයි .... එකයි .... එකයි .... එකයි .... එකයි. |
| (දෙවන හුස්ම වාරය) | දෙකයි .... දෙකයි .... දෙකයි .... දෙකයි .... දෙකයි. |
| (තෙවන හුස්ම වාරය) | තුනයි .... තුනයි .... තුනයි .... තුනයි .... තුනයි |
| (සිව්වන හුස්ම වාරය) | හතරයි ... හතරයි .... හතරයි ..... හතරයි .... හතරයි. |
| (පස්වන හුස්ම වාරය) | පහයි .... පහයි .... පහයි .... පහයි ... පහයි |
| (සවන හුස්ම වාරය) | හයයි .... හයයි .... හයයි .... හයයි .... හයයි. |

5. සීමාවට නොපැමිණි භික්ෂූන්ගේ අනුමතය පසුව ලබා ගැනීමේ අදහසින් විනය කර්ම කිරීම කැපය. (අනුමති කප්ප)

6. ආචාර්ය පරම්පරාවෙන් පවත්වාගෙන ආ සියල්ල ඒ අයුරින් අනුගමනය කිරීම කැපය (ආචිණ්ණ කප්ප)

7. මිදීගෙන එන කිරි කැප කරවා නොගෙන වැළඳීම කැපය (අමථිත කප්ප)

8. නොපැසුණු මීරා වැළඳීම කැපය (ජලොගි කප්ප)

9. වාටිය නැති ඇතිරිල්ලක් ප්‍රයෝජනයට ගැනීම කැපය ( අදසක නිසීදන කප්ප)

10. රන් රිදී කහවණු පිළිගැනීම කැපය (ජාත රූපරජත පටිග්ගහණ කප්ප)

**සංවිධාන කටයුතු**

වජ්ජිපුත්තක භික්ෂූන්ගේ මෙම විනය විරෝධී ක්‍රියා මහත් ආන්දෝලනයකට තුඩුදුනි. කාකණ්ඩපුත්ත යස තෙරණුවන් විශාලා මහනුවරට වැඩම කළේ එහි සැබෑ තතු දැක බලා ගනු පිණිස ය. උන්වහන්සේ වජ්ජිපුත්තක භික්ෂූන් ජලය සහිත ලෝහ බඳුනක් තබාගෙන සඟරුවන උදෙසා කහවණු ආදිය රැස් කරනු දුටහ. එය භික්ෂූන්ට කැප සරුප් නොවන බව යස තෙරණුවෝ පෙන්වා දුන්හ. පසුව සබ්බකාමී රේවත ආදී තෙරවරුන් ද දැනුවත්කර උන්වහන්සේලා සමග විශාලා මහනුවරට වැඩමකර සංගායනාවක් පැවැත්වීමට යස තෙරණුවෝ කටයුතු සංවිධානය කළහ. මෙයින් වජ්ජිපුත්තක භික්ෂූහු කලබල වූහ. තමන්ට පීඩා කිරීමට අධර්මවාදී භික්ෂු පිරිසක් විශාලා මහනුවරට පැමිණ ඇතැ යි ඒ භික්ෂූහු කාලාශෝක රජුට දැන්වූහ. ඒ පුවත ඇසූ රජතුමා යස තෙරණුවන් ඇතුළු පිරිස නුවරින් බැහැර කරන ලෙස ඇමැතිවරුන්ට නියම කළේ ය. එහෙත් නියම අධර්මවාදීන් නම් වජ්ජිපුත්තක භික්ෂූන් ම බව රජුගේ සොහොයුරිය වූ නන්දා තෙරණිය රජුට පැවසුවා ය. ඒ අනුව රජතුමා යස තෙරණුවන් ඇතුළු පිරිසට අවශ්‍ය රැකවරණ පහසුකම් ලබා දෙමින් දෙවන සංගීතිය පැවැත්වීමට කටයුතු සූදානම් කර දුන්නේ ය.

පළමුවෙන් ම කළයුතු කාර්යය වූයේ දශ වස්තුව කැප ද අකැප ද යන්න නිරාකරණය කර ගැනීම ය. ඒ සඳහා පෙරදිග සහ අපරදිග තෙරුන් වහන්සේලා නියෝජනය වන පරිදි කාරක සභාවක් පත්කර ගන්නා ලදි.

**සංගායනාව කළ ආකාරය හා එහි ප්‍රතිඵල**

අනතුරුව රේවත සහ සබ්බකාමී යන තෙරුන් වහන්සේලා ප්‍රශ්නොත්තර ක්‍රමයෙන් දශ වස්තුව විමසූහ. කාරක සභාවේ තීරණය සංඝ සභාවට ඉදිරිපත් කළේ සබ්බකාමී තෙරණුවන් ය. ආචිණ්ණ කප්පයෙහි ආචාර්යවරුන් විසින් පුරුදු පුහුණු කරගෙන ආ විනය විරෝධී නොවන දේ පමණක් කැප බව පිළිගන්නා ලදි. අනෙක් නවය මුළුමනින් ම විනය විරෝධී බව තීරණය විය.

මේ ධර්ම සංගායනාව සඳහා රහතන් වහන්සේලා හත්සියයක් සහභාගි වූහ. අටමසක් මුළුල්ලේ සංගායනාව පැවැත් විණි. මෙලෙස වැරදිමත සියල්ල ප්‍රතික්ෂේප වීම බුදු සසුනේ චිර පැවැත්මට හේතු විය.

දශවස්තුව කැප යයි පිළිගත් පිරිස කොසඹෑ නුවරට රැස්ව වෙන ම සංගායනාවක් කළහ. දස දහසක් පමණ **භික්ෂූන්** එයට රැස්වූ බැවින් **එම සංගායනාව මහා සංගීති නමින් හැඳින්වේ. දෙවන සංගායනාවට** අනතුරුව **ථෙරවාදී** සහ **මහා සංඝික** යනුවෙන් කොටස් දෙකකට භික්ෂු පරපුර බෙදී ගියේ ය. මෙය ශාසන ඉතිහාසයෙහි මුල්ම නිකාය භේදය ඇති වූ අවස්ථාව ලෙස සැලකේ. ධර්මාශෝක කාලය වන විට නිකාය 18 ක් බිහිවී තිබුණු බව සඳහන් වේ.

**සංගායනාවලින් අපේ දිවියට :**

- සාමූහික ව ක්‍රියා කිරීමේ අගය
- බහුතර කැමැත්තට වඩා ධර්මානුකූල බවට මුල්තැන දීම
- ඒකමතික තීරණයෙන් ක්‍රියා කිරීම
- විමසා බලා තීරණ ගැනීම
- අභියෝගයන්ට නොපැකිල ව මුහුණ දීම
- ධර්ම විනය දෙක රැක ගැනීමට ක්‍රියා කිරීමේ අවශ්‍යතාව
- විනයගරුක වීම

## ක්‍රියාකාරකම්

පහත දැක්වෙන ශීර්ෂ පාඨ යටතේ සංගායනා දෙක පිළිබඳ කරුණු වෙන වෙන ම වගුගත කරන්න :

| සංගායනාව | හේතුව | කාලය | ස්ථානය | මූලිකත්වය | අනුග්‍රහය | සහභාගි වූ ප්‍රමාණය | ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| පළමුවන සංගායනාව | | | | | | | |
| දෙවන සංගායනාව | | | | | | | |

## පැවරුම

ධර්ම සංගායනා අවස්ථාවක් නිරූපණය කෙරෙන චිත්‍රයක් නිර්මාණය කරන්න.

නැවතත්

| | |
|---|---|
| (පළමු හුස්ම වාරය) | එකයි .... එකයි .... එකයි .... එකයි .... එකයි. |
| (දෙවන හුස්ම වාරය) | දෙකයි .... දෙකයි .... දෙකයි .... දෙකයි .... දෙකයි. |
| (තෙවන හුස්ම වාරය) | තුනයි .... තුනයි .... තුනයි .... තුනයි .... තුනයි |
| (සිව්වන හුස්ම වාරය) | හතරයි .... හතරයි .... හතරයි ..... හතරයි .... හතරයි. |
| (පස්වන හුස්ම වාරය) | පහයි .... පහයි .... පහයි .... පහයි .... පහයි |
| (සවන හුස්ම වාරය) | හයයි .... හයයි .... හයයි .... හයයි .... හයයි. |
| (සත්වන හුස්ම වාරය) | හතයි .... හතයි .... හතයි .... හතයි .... හතයි. |

නැවත නැවත මෙම ක්‍රමය අනුගමනය කරන්න. ඔබ බාහිර ලෝකයෙන් වෙන්වී ආශ්වාස ප්‍රශ්වාස අරමුණට ම යොමු වනු ඇත. අවසානයේ මහත් සැනසීමක් සිතට දැනෙනු ඇති. භාවනාව නිමා කිරීම සඳහා දෑත් නළල මත තබා වැඳ සාධුකාර දී ප්‍රාර්ථනා වාක්‍යය කියන්න.

"මාගේ මේ භාවනාව මෙලොව සැනසීම පිණිසත් පරලොව සැනසීම පිණිසත් නිවන් සුවයෙන් සැනසීම පිණිසත් හේතුවේවා! වාසනා වේවා!" යනුවෙන් ප්‍රාර්ථනා කරන්න. දෙවියන්ට පින් අනුමෝදන් කරන්න.

## දෙවන පියවර

පළමු පියවර සති කීපයක් පුරුදු පුහුණු කළ විට ඔබට දෙවන පියවර සඳහා යා හැකියි. ගණන් කිරීම නතරකර හුස්ම ගැනීම හා පිටවීම ගැනම සිහිය යොමු කරමින් පහත දැක්වෙන ආකාරයට භාවනාව දිගට ම කරගෙන යන්න. සමහර විට හුස්ම ගැටෙන්නේ නාසයේ අගවිය හැකි ය. නැතහොත් උඩුතොල මුදුනෙහි විය හැකි ය. එය ඔබ ම ආශ්වාස ප්‍රශ්වාසකර බලන්න. පළමු පියවරේ දී මෙන් දෙවන පියවරේ දී ද භාවනාවට පෙර කළයුතු පූර්ව කෘත්‍යය සිදු කරන්න.

* දිග හුස්මක් ගන්නා විට දිග හුස්මක් ඇතුළු වූ බව සිතන්න.
* දිග හුස්මක් පිට කළ විට දිග හුස්මක් පිට වූ බව සිතන්න.
* කෙටි හුස්මක් ගන්නාවිට කෙටි හුස්මක් ඇතුළු වූ බව සිතන්න.
* කෙටි හුස්මක් පිට කළ විට කෙටි හුස්මක් පිට වූ බව සිතන්න.

මෙම පියවරත් කීපවතාවක් ම අනුගමනය කරන්න. පාසලේ දී මෙන් ම නිවසේදීත් මෙය ක්‍රියාවට නගන්න. අවසානයේ දී භාවනාව නිමා කළ යුත්තේ පළමු පියවර අවසානයේ දී මෙනි. "මාගේ මෙම භාවනාව මෙලොව සැනසීම පිණිසත්, පරලොව සැනසීම පිණිසත් නිවන් සුවයෙන් සැනසීම පිණිසත් හේතු වේවා! වාසනා වේවා!" යනුවෙන් ප්‍රාර්ථනා කරන්න. දෙවියන්ට පින් අනුමෝදන් කරන්න.

**ක්‍රියාකාරකම්**

පහත දැකවෙන ප්‍රශ්න සියල්ලට ම "ඔව්" පිළිතුර ලැබෙන තෙක් ඉවසිල්ලෙන් භාවනා කරන්න :

1. භාවනා කළ සම්පූර්ණ කාලය තුළ හිස හා කොන්ද කෙළින් තබා ගැනීමට හැකි විණි ද?
2. සම්පූර්ණ භාවනා කාලය තුළ ම ආශ්වාස ප්‍රශ්වාස වාතය ගැටෙන තැනට සිහිය යොදාගෙන සිටීමට හැකිවිණි ද?
3 අනුපිළිවෙළින් ආශ්වාස ප්‍රශ්වාස ගණන් කිරීමට හැකිවිණි ද?

**පුහුණුවට**

සුප්පබුද්ධං පබුජ්ඣන්ති
සදා ගෝතම සාවකා
යේසං දිවා ච රත්තෝ ච
භාවනාය රතෝ මනෝ
- ධම්මපද

# 11. රකුසු පැනයට පිළිතුරු

බ්‍රහ්මදත්ත නම් රජකෙනකුට මහිංසාසක සහ චන්ද්‍ර නමින් පුත්තු දෙදෙනෙක් සිටියහ. කුමාරවිය ලබන්නටත් පෙරාතුව දරුවන්ගේ මව් මිය ගියා ය. රජතුමා වෙනත් බිසවක සරණ පාවා ගත්තේ ය. එම දේවියට උපන් දරුවාට සූර්ය යයි නම් තබන ලදි. හුරුබුහුටි තුන්වන පුතා දැක සතුටු වූ රජතුමා තම බිසවගෙන් ඇයට කැමැති ඕනෑම දෙයක් ඉල්ලන්නැයි ප්‍රකාශ කළේ ය . බිසව එය පසුවට කල් තැබුවා ය. කුමාරවරු තරුණ වියට පිවිසුනහ. බිසව කල්යල් බලා සූර්ය කුමරුට රජකම ලබා දෙන ලෙස ඉල්ලා සිටියා ය. වැඩිහිටි පුතුන් සිටිය දී එසේ කළ නොහැකි බව රජතුමා බිසවට දැන්වූවේ ය.

බිසවගේ කළකිරීම දුටු රජතුමා වැඩිමහල් පුතුන් කැඳවා කුඩම්මා ගෙන් මතුවට කරදර වෙන්න පුළුවන්. එබැවින් කලක් සැඟවී සිට මාගෙන් පසුව රජකම ගන්නැ යි ප්‍රකාශකර හිමාලය ප්‍රදේශයට පුතුන් පිටත්කර යැවී ය. කුමාරවරු කඳුලු පිරි දෙනෙතින් යුතු ව පිය රජුගේ දෙපා වැඳ හිමාලයට යෑමට පිටත් වූහ. ඔවුන් දෙදෙනා මාළිගාවෙන් පිටවෙද්දී සූර්ය කුමාරයා ක්‍රීඩා කරමින් සිටියේ ය.

සූර්ය කුමාරයා : ලොකු අයියයි, පොඩි අයියයි
එන්නේ නැද්ද සෙල්ලම් කරන්න.
කොහෙද මේ යන්න හදන්නෙ ?

කුමාරවරු : අපි යනවා හිමාලය වනයට

සූර්ය කුමාරයා : හිමාලය වනයට ? මාත් එනවා ඔයාලත් එක්ක යන්න
(ටික දුරක් ගිය පසු)

සූර්ය කුමාරයා : මට වතුර තිබහයි.

මහිංසාසක කුමාරයා : මල්ලි අර පෙනෙන්නේ විලක් එතැනට ගිහින් වතුර බීලා අපටත් වතුර අරගෙන එන්න, නෙළුම් කොළයකට

සූර්ය කුමාරයා : හොඳයි අයියේ, මම වතුර අරන් එන්නම්
(සූර්ය කුමාරයා ගොස් විලට බැස්සේ ය.)

විලේ සිටි දිය රකුසා : හඃ හඃ හා වතුර බොන්න?
වතුර බොනවා මදිවට
නෙළුම් මලුත්, නෙළුම් කොළත් කඩාගෙන
හරි වැඩක්නෙ මේක
(දිය රකුසා කුමරුගේ බෙල්ලෙන් අල්ලා ගත්තේ ය.)
උඹ දන්නවද දේව ධර්ම?

සූර්ය කුමාරයා : ම් ......................... ඉර හඳ

දිය රකුසා : මො මොනවද උඹ කීවේ ?
උඹ දන්නා දේව ධර්ම හිටපන් උඹට
යස පාඩමක් උගන්වන්න.
(දිය රකුසා කුමරු ගෙන ගොස් සඟවා තැබුවේ ය.)

මහිංසාසක කුමාරයා : ලොකු මල්ලි, දැන් මල්ලි ගිහින්, සෑහෙන වේලාවක් උනා
තාමත් එන්නෙ නැති පාට යි. ගිහින් බැලුවොත් හොඳයි.
(චන්ද්‍ර කුමරු මල්ලි සොයාගෙන විල ළඟට ගියේ ය.)

චන්ද්‍ර කුමාරයා : වතුර ටිකක් බොන්න. ඕන
(විලට චන්ද්‍ර කුමරු බසිනවාත් සමඟම දිය රකුසා කුමාරයාගේ අත තදින් අල්ලා ගත්තේ ය.)

දිය රකුසා : විලට බැහැලා වතුර ටික බොර කරලා
මලුත් කඩාගෙන
කොලත් කඩා ගන්නයි හැදුවේ.
ම්..... ම්..... උඹ දන්නවද දේව ධර්ම.?

චන්ද්‍ර කුමාරයා : ස ....... සත ....., යතර දිග

දිය රකුසා : සතර දිග ඒ මොනවද?
(දිය රකුසා චන්ද්‍ර කුමරු සඟවා තැබුයේ ය.)

ලොකු මල්ලිත්, පොඩි මල්ලිත් නොපැමිණි නිසා යම් අනවරයකට ඔවුන් පත්ව ඇති බව මහිංසාසක කුමරුට අවබෝධ විය. හෙතෙම විල ළඟට ගියවිට විල ළඟ ඇති මල්ලිලාගේ පා සටහන් දුටුවේ ය. දියේ රකුසකු සිටින බව වටහාගත් කුමරු කඩුව කොපුවේ දමාගෙන දුන්න අතට ගෙන සිට ගත්තේ ය.

මේ වන විට කැලේ ලී කපන මිනිසෙකු ලෙසින් සිටි දිය රකුසා කුමරු විසින් හඳුනා ගනු ලැබීය.

දිය රකුසා : පින්වත, ඔබට හරි මහන්සියි වගේ, විලට බැහැලා, ඇඟපත සෝදාගන්න. වතුරත් නිල්ම නිල් පාටයි. රතු නෙළුම් සුදු නෙළුම් විලේ පිරිලා. කෑමට ගන්න නෙළුම් අලත් තියෙනවා.

මහිංසාසක කුමාරයා : ඕවා කියලා මාව රවටන්න උඹට බැහැ ඇත්ත කියාපන් උඹ අපේ මල්ලිලා, අල්ලා ගත්තා නේද?

දිය රකුසා : ඔව්, අල්ලා ගත්තා. ඇයි අහන්නේ? මේ විලට බහින අය අල්ලා කන එක මගේ වැඩක් ඒකට බාදා කරන්න කාටවත් බැහැ.

මහිංසාසක කුමාරයා : විලට බහින ඕනෑ ම කෙනෙකු අල්ලාගෙන කන්න උඹට අයිතියක් තියෙනවා? කවුද ඔය අයිතිය උඹට දුන්නෙ?

දිය රකුසා : මිනිස්සු මරාගෙන කන්න අපට අයිතිය දුන්නෙ වෙසමුනි රජ්ජුරුවෝ. හැබැයි දේව ධර්මය දන්නවා නම් ඒ අය මරාගෙන කන්නේ නැහැ.

මහිංසාසක කුමාරයා :- උඹට දේව ධර්මය දැනගන්න ම ඕනෑ ද?

දිය රකුසා :- සත්තකින් ම ඔව්, මට මේ අපා දුකෙන් මිදෙන්න දේව ධර්මය දැනගන්න ඕනෑ

මහිංසාසක කුමාරයා : හොඳයි, එහෙනම් උඹට මම දේව ධර්මය කියන්නම්, හැබැයි මා හොඳට නාවලා, පිරිසිදු කරලා. මල්මාලාවලින් සරසලා, ආසනයක් මත හිඳවලා ගරු බුහුමන් කරන්න ඕනෑ.

දිය රකුසා කුමරු කී විලස සියල්ල ඉටු කළේ ය. කුමරා දේව ධර්මය දේශනා කළේ ය. රකුස හිරි ඔත්තප්ප දෙකටයි දේව ධර්මය කියන්නෙ, හිරි නම් පව් කිරීමට ඇති ලැජ්ජාව, ඔත්තප්ප නම් පව් කිරීමට ඇති භය. මේ උතුම් පැවතුම් දේව ධර්මය ලෙස සත්පුරුෂයන් හඳුන්වනවා.

දිය රකුසා : මා මෙතෙක් කල් සෙව්ව දේ ලැබුණා. ඔබ කෙරහි පැහැදුනා. දැන් ඔබට මල්ලිලා දෙන්නාගෙන් එක්කෙනකු දෙන්නම් කොයි මල්ලි ද ඕනෑ?

මහිංසාසක කුමාරයා : (ගත් කටටම) පොඩි මල්ලි

දිය රකුසා : ලොකු මල්ලි සිටියදී ඇයි බාල මල්ලි ඉල්ලන්නේ? ඔබ දේව ධර්මය දන්න බව නම් ඇත්ත. ඒත් රකින බවක් නම් පෙනෙන්නට නැහැ. ඒකනේ වැඩිමහල් මල්ලි සිටිද්දි පොඩි මල්ලි ඉල්ලන්නේ.

මහිංසාසක කුමාරයා : රකුස, උඹ මේ මොනවා කියනවාද? අපි මෙහාට ආවේ බාල මල්ලි නිසා, බාල මල්ලිට රජකම දෙන්න කියා කුඩම්මා අපේ පියතුමාට කීවා. පියතුමා ඒකට කැමැති නැහැ. කුඩම්මාගෙන් අපට කරදරයක් වෙයි කියලා හිතාගෙනයි අපව හිමාලයට එව්වේ. පුංචි මල්ලිත් අප දැකලා අපේ පස්සෙන් ආවා. එහෙව් එකේ මල්ලි රකුසෙක් කෑවා කිව්වොත් ඒක පිළිගන්න එකක් නැහැ. ඒ නිසයි බාල මල්ලිව පළමුව ඉල්ලන්නේ.

දිය රකුසා :- සාධු ......./ සාධු ........// සාධු ........../// ඔබ හොඳට දේව ධර්මය දන්න කෙනෙක් හොඳට පිළිපදින කෙනෙක්, මෙන්න මල්ලිලා දෙන්නම.

ඒ කුමාරවරු තුන්දෙනා දිය රකුසාගේ ආරක්ෂාව යටතේ වාසය කර පිය රජුගේ ඇවෑමෙන් රකුසා ද කැටුව බරණැස් නුවරට පැමිණියහ. චන්ද්‍ර කුමාරයාට යුවරජ තනතුරත්, සූර්ය කුමාරයාට සේනාධිපති තනතුරත් ප්‍රදානය කළ මහිංසාසක රජතුමා රකුසාට දිනපතා ආහාරපාන ලබාදෙමින් දැහැමින් රජකම් කළේ ය.

මහිංසාසක කුමරු නම් අප මහබෝසතාණන් වහන්සේ ය. මේ කතා පුවත ඇතුළත් වන්නේ පන්සිය පණස් ජාතක පොත් වහන්සේගේ දේවධර්ම ජාතකයෙහි ය.

* මෙම ජාතක කතාව ආදර්ශයට ගෙන එකමුතුව සමගියෙන් ක්‍රියා කරමු.
* විමසිලිමත් වෙමු.
* පව් කිරීමට බිය වෙමු.
* පව් කිරීමට ලැජ්ජා වෙමු.
* වැඩිහිටියන්ගේ අවවාද පිළිගනිමු.
* දූරදර්ශීව ක්‍රියා කරමු.
* තැනට සුදුසු ලෙස කටයුතු කරමු.
* නුවණැතියන්ගේ අදහස්වලට බුද්ධිමත්ව ඇහුම්කන් දෙමු.
* විපතක් පැමිණිවිට නුවණැතිව හා දිරියෙන් යුතුව මුහුණ දෙමු.

පැවරුම : මේ කතා පුවත නාට්‍යාකාරයෙන් ඉදිරිපත් කරන්න.

## 12. රට දැය සමය ඔපවත් කළ වීර ධීර රජවරු දෙදෙනෙක්

පොළොන්නරුව අපේ දෙවන රාජධානිය යි. සියවස් දෙකකට පමණක් සීමා වූ මෙම පොළොන්නරු යුගය බැබළවූ පහන් ටැඹ දෙකක් බඳු රජවරු දෙදෙනෙකි, පළමුවන මහා විජයබාහු රජතුමා සහ පළමුවන මහ පැරකුම්බා රජතුමා. මේ නරපතියෝ රට දැය හා බුදු සසුන නඟාසිටුවීමට අමිල සේවාවක් කළාහු වෙති. ඒ පරපුරේ දරුවන් වන අප ද මෙම උදාර චරිත ආදර්ශයට ගෙන එම වීරවරයන් තුළ පැවැති දේශානුරාගය, ජාති වාත්සල්‍යය, ශාසන මාමකත්වය ආදි ගුණාංග අප තුළ ද ඇතිකර ගතයුතු ය.

**මහා විජයබාහු රජතුමා :**

සොළීන්ගේ ආක්‍රමණ නිසා අනුරාධපුර සිංහල රාජධානිය බිඳ වැටිණි. එහි පාලනය සොළීන් අතට පත්විය. අපේ අභිමානය වන වෙහෙර විහාර විනාශ කර ඒවායේ නිදන් වස්තු පැහැර ගත් ඔවුන් සිය වාස භූමි කරගත්තේ ද අපේ වෙහෙර විහාර යි. ඔවුහු වැව් අමුණු පවා විනාශ කළහ. ආක්‍රමණිකයන්ගේ පීඩා ඉවසා දරා ගත නොහැකි වූ අපේ හාමුදුරුවරු රජරටින් රුහුණටත්, මායා රටටත් බුරුම රට රාමඤ්ඤ දේශයටත් වැඩම කළහ. සම්බුදු සසුනට මෙ දවස උදා වූයේ අඳුරු සමයකි. එහෙත් ජාතිය නඟාලීමට හා බුදු සසුන බැබළවීමට පින්බර කුමාරයෙක් රුහුණෙන් පහළ විය. හේ නමින් කීර්ති කුමාරයා ය. හෙතෙම මුගලන් හා ලෝකිතා යන රාජකීය යුවලගේ අභිජාත පුත්‍රයා ය.

කුඩා කාලයේ ම කීර්ති කුමාරයා ශිල්ප ශාස්ත්‍රයන්හි පරතෙරට පැමිණියේ ය. හෙතෙම විවිධ අභියෝග බාධක ජය ගනිමින් කෙටි කලකින් ම සිරිසඟබෝ විජයබාහු නමින් රුහුණේ රජ විය. සේනා සංවිධානය කර සොළී බලය සහමුලින් ම බිඳ දමා සිරිලක එක්සේසත් කළ එතුමා පළමුවන විජයබාහු නමින් ඉතිහාස ගතවූයේ ය.

විජයග්‍රහණයෙන් පසු පළමුවෙන් ම කළයුතු කාර්යය ලෙස එතුමාට පෙනී ගියේ ශාසනය පුනරුත්ථාපනය කිරීම යි. උපසම්පන්න භික්ෂූන් වහන්සේලා පස්නමක්වත් මෙකල අපේ රටේ නොසිටිය හ. බුරුමයෙන් හෙවත් වර්තමාන මියන්මාරයෙන් උපසපන් භික්ෂූන් වහන්සේලා විසි නමක් වැඩමවා උපසම්පදාව යළි ඇති කිරීමට පුරෝගාමී වූයේ ද මහා විජයබාහු රජතුමා ය. එතුමාගේ ශාසනික සේවාවන් අතර පහත සඳහන් ඒවාද වේ.

* මියන්මාරයට පාලි ත්‍රිපිටක පොත් යැවීම.
* පාලි ත්‍රිපිටක පොත් මෙරට භික්ෂූන් වහන්සේට පූජා කිරීම.
* පොළොන්නරුවේ අටදාගෙය නමින් දළදා වහන්සේට මාළිගාවක් කරවීම.
* දළදා පූජෝත්සව පැවැත්වීම.
* සිරිපා වන්දනා මාර්ග පිළිසකර කරවීම.
* සිරිපා වන්දනා කරුවන්ගේ සුව පහසුව පිණිස රත්නපුර ගිලිමලේ ගමේ ආදායම පවරාදීම.
* සොළීන් විනාශ කළ විහාරස්ථාන යලි ගොඩනැගීම සඳහා සෙල්ලිපි මගින් විහාර ගම් පූජා කිරීම.

මහා විජයබාහු රජතුමා බොහෝ ඇසූපිරූ තැන් ඇති අයෙකි. තෙරුවන් සරණ ගිය සැදැහැවතෙකි. සතර පෝයට ම අටසිල් සුරැකි උපාසකවරයෙකි. සිව්පසයෙන් භික්ෂූන් වහන්සේලාට උවටැන් කළ කුලූපග දායකයෙකි. ධර්ම දේශකයන් වහන්සේලාට උපකාර කළ ධර්මකාමියෙකි. කාව්‍ය ශාස්ත්‍රයන්හි නියැලුන අයට සම්මාන සත්කාර කළ සාහිත්‍ය රසිකයෙකි. ධර්ම ග්‍රන්ථ කර්තෘවරයෙකි.

රජතුමා කෙතරම් වැඩ කටයුතු තිබුණද උදය කාලයේ බුදු මැදුරට වී දහම් පොත් පරිවර්තනය කළේය. සිංහල ධම්ම සංගණි කෘතිය රජතුමා විසින් රචනා කරන ලද බණ පොතකි. එතුමාගේ නමට "මහා" යන විශේෂණ පදය එකතුවූයේ හුදෙක් ගෞරව නාම සම්මුතියක් වශයෙන් නොවේ. සිය ජාතියට දේශයට හා බුදු සසුනට කළ උදාර මෙහෙයට උපහාර වශයෙනි.

## මහා පැරකුම්බා රජතුමා :

අප මුලින් සඳහන් කළ මහවිජයබාහු රජතුමා ශාරීරික ලක්ෂණ බලා අනාවැකි පල කිරීමට ද දක්ෂ කෙනෙකි. රජතුමා සිය තෙවන දියණිය වූ රත්නාවලී කුමරියගේ දේහ ලක්ෂණ අනුව ඇය පින්වත් පුතකු ලබන බවත්, එම කුමරා සිරිලක එක්සේසත් කරන බවත් විදේශවල දී පවා සටන් කර ජයගැනීමට හැකි අයකු වන බවත් ප්‍රකාශ කර ඇත. මෙම අනාවැකිය සනාථ කරමින් මානාභරණ යුව රජතුමාටත් රත්නාවලී දේවියටත් දාව තෙවැන්නා ලෙස පින්වත් කුමාරයෙක් උපත ලැබුවේ ය. පසු කලෙක මහා පරාක්‍රමබාහු රජතුමා නමින් ප්‍රකට වූයේ එම කුමරුවන් ය.

පරාක්‍රමබාහු කුමාරයා කුඩා කාලයේ ම ඔහුගේ පියා පරලෝ සැපත් විය. එහෙත් දැයේ අනෙකුත් දරුවන්ට ආදර්ශ සම්පන්න වූ මොහු එයින් කම්පා නොවී ය. පසුව හෙතෙම මායා රට රජවිය. එදා එතුමන් විසින් ගොඩනගන ලද පරාක්‍රම පූරය මෙදා පඬුවස් නුවර යි. රජතුමා සිය රාජ්‍යයේ උන්නතියට දැදුරු ඔය සම්බන්ධ කර වාරිමාර්ග ඉදි කළේ ය. දේශ සීමා මුරපළවල් ශක්තිමත් කිරීමටද පියවර ගත්තේ ය. මෙවන් පාලන ශක්තියකින් හෙබි එතුමා මුළු සිරිලකම අගරජ බවට පත්වූයේ පොළොන්නරුව රාජධානි කරගෙනය.

වීරයා නම් බාධා මැඩගෙන ඉදිරියට යන්නාය. උදාරත්වය නම් ගුණ නුවණින් පිරිපුන් බව යි. පරාක්‍රමබාහු නිරිඳු මේ දෙඅංශයෙන් ම පිරිපුන් වීරෝදාර උතුමෙකි. මෙතුමා සටන් කරනවිට සටන්කාමියෙකි. අන් හැමවිට ම මහත්මා ගති පෑ අයෙකි. සැදැහැවතෙකු වූ රජතුමා සතර පෝයට ම සිල් සමාදන් විය. එදින ම සවස ආරෝග්‍ය ශාලාවට ගොස් රෝගීන් ගේ සුවදුක් විමසා බැලී ය. අමාරු රෝගීන් පරීක්ෂා කොට පළමු බෙහෙත සියතින් ම දීමට ද අමතක නොකළේ ය. රෝහලෙන් පිටව යන අයට ද පහසුකම් සලසා දුනි. ලෝකයේ පළමුවරට රෝහල් සුහිත නැව් තැනීමේ ගෞරවය හිමිවන්නේ ද අපේ මහපැරකුම්බා රජ්ජුරුවන්ට ය. සැලසුම් සහගතව නාවික යත්‍රා මගින් බුරුම රට රාමඤ්ඤ දේශය යටත් කර ගත්තේ වෛර සිතකින් නොව, යුක්තිය අයුක්තිය ඔවුනට පෙන්වාදීමට ය. දෙරටේ භික්ෂූන් වහන්සේලාගේ අනුශාසනා පරිදි රාමඤ්ඤ දේශය රජතුමා විසින් බුරුමයට ම පවරා දෙන ලදි. මෙයින් ප්‍රකට වන්නේ අපේ රජතුමා තුළ පැවැති මානව දයානුකම්පාව යි.

මහාපරාක්‍රමබාහු රජතුමා දිඹුලාගල මහාකාශ්‍යප මාහිමිපාණන් වහන්සේගේ උපදෙස් මත තුන් නිකායික භික්ෂූන් වහන්සේලා සමඟි කර කතිකාවතක් පිළියෙල කළේ ය. එය පොළොන්නරු කතිකාවත නමින් හැඳින්වේ. මෙම කතිකාවත පොළොන්නරු ගල් විහාරයේ සටහන් කර ඇති අයුරු අදටත් දැකිය හැකි ය.

පොළොන්නරු දෙමළ මහසෑය, ලංකා තිලකය, ගල් විහාරය, කිරි වෙහෙර, තිවංක පිළිමගෙය පබලු වෙහෙර එතුමා අපට දායාද කළ තිළිණයන් අතර වේ. රජතුමා කළ පිරිවෙන් ගණන හැත්තෑ පහකි. ඒ අතර ආලාහන පිරිවෙන ප්‍රධාන වේ. දැදිගම කොටවෙහෙර හෙවත් සූතිඝර චෛත්‍යය සිය මව් ගුණය සිහිකර ගොඩනැගූ දාගැබ යි.

ලංකාවේ මුල සිට ම පැවතුනේ වැවයි, දාගැබයි කේන්ද්‍ර කරගත් ශිෂ්ටාචාරයකි. වැවෙන් ආර්ථික දියුණුවත් දාගැබෙන් සදාචාර දියුණුවත් අපේක්ෂා කළේ ය. අපේ රජතුමා ඒ ඉතිහාසයේ යුග පුරුෂයෙකි. "අහසින් වැටෙන එක දිය බිඳකදු ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට නොදිය යුතුය" යන උදාර ප්‍රකාශයට සරිලන සේ පරාක්‍රම සමුද්‍රය වැනි මහවැව් රැසක් ඉදිකළේ ය. ගොවිතැනින් ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත කළේ ය. මෙරටින් විදේශ රටවලට පවා සහල් අපනයනය කිරීමට සමත් විය. මහ වැව් 163ක් ද, කුඩා වැව් 2376 ක් ද, අමුණු 165ක් ද, ඇළවල් 3910 ක් ද, ප්‍රතිසංස්කරණය කරන ලද හා අලුතෙන් තනවන ලද වාරි කර්මාන්ත අතර වේ. ආගමික පුනරුදයක් මගින් සදාචාර දියුණුවට ද මග පෑදුවේ ය.

වරින්වර ජාතියේ පිනෙන් ජනිත වූ මෙවන් වීර පුරුෂයන්ගේ උදාර චරිතවලින් අපේ ජාතික ඉතිහාසය ඔපවත් වී ඇත. එම උදාර චරිත කියවා ඔවුන් තුළ පැවති විශිෂ්ට ගතිලක්ෂණ අප ආදර්ශයට ගත යුතු ය. රාජ්‍ය පාලන උපාය කෞශල්‍යය, බිඳ නොවැටෙන චිත්ත ශක්තිය, වෙහෙස නොබලා ක්‍රියාකරන ගතිය සෑම රාජ චරිතයක ම අන්තර්ගත ව ඇත. සතර බ්‍රහ්මවිහරණ සතර සංග්‍රහ වස්තු ශ්‍රේෂ්ඨ රජවරුන් තුළ තිබුණ ගුණ ධර්මයෝ වෙති. ලෝක සිතියමේ කුඩා තිතක් බඳු සිරිලක වනසන්නට සතුරු බලවතුවන්ට ඉඩකඩ නොසැලසුනේ මෙවන් හෙළ විරුවන් පහළ වූ බැවිනි.

### ක්‍රියාකාරකම්

මහාවිජයබාහු රජතුමාගේ සහ මහාපරාක්‍රමබාහු රජතුමාගේ චරිත කථා ඇසුරෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| රජතුමා | සිදුකළ ශාසනික හා සාමාජික සේවා | උදාර ගතිලක්ෂණ |
|---|---|---|
| | | |

## 13. ධම්මපදයෙන් බිඳක් සවනට

ශ්‍රී රේවත දහම් පාසලේ "සිරිලක බොදු දරුවෝ" ශිෂ්‍ය සමිතියේ පැවති සුවිශේෂ වැඩසටහනකට අපි දැන් සහභාගි වෙමු.

**සභාපති**

තනි ගසක පිපෙන තනි මලකට වඩා මල් සමූහයක් ඇති මල් ගස හරිම ලස්සන යි. එවන් මල් ගස් රැසකින් විවිධ මල් රැගෙන සකස් කරගත් මල් වට්ටියක් වගෙ යි, බෞද්ධ අපගේ අත්පොත වන ධම්මපදය. සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ධම්මපදය වර්ග විසි හයකින් හා ගාථා හාරසිය විසි තුනකින් යුක්ත යි. ධම්මපදය ත්‍රිපිටකයේ සාරය බඳුය. චතුරාර්ය සත්‍යය පටිච්ච සමුප්පාදය, ත්‍රිලක්ෂණය, කර්මය පිළිබඳ ඉගැන්වීම් පින් පව් කුසල් අකුසල් හොඳ නරක කළයුතු දේ නොකළ යුතු දේ ගැන කරුණු එහි ඇතුළත්. එය ඕනෑම ගැටලුවකට ප්‍රශ්නයකට විසඳුම් සොයා ගැනීමට, බෞද්ධ අබෞද්ධ කාටත් එදිනෙදා භාවිත කළ හැකි අනර්ඝ කෘතියකි. ධම්මපදය තරම් උපමාවලින් උපදේශයන් ගෙන් පිරුණ තවත් පොතක් බෞද්ධ අපට නැති තරම්. ලොකු කුඩා කා අතරත් ජනප්‍රිය එම ධම්මපදයෙන් තෝරාගත් ගාථා කීපයක් "ධම්මපදයෙන් බිඳක් සවනට" වැඩසටහන තුළින් ඉදිරිපත් කිරීමටයි මා දැන් සූදානම් වන්නේ.

සෑම තත්පර දහයකට වරක් ලොව කොතැනක හරි මිනී මැරුමක් සිදු වෙනවා. එහෙම වන්නේ ඔවුනොවුන් තුළ පවතින අවිශ්වාසය, වෛරය, ක්‍රෝධය, තරහව, පළිගැනීමේ සිතිවිලි නිසා. මෙවන් සිතුවිලි අපේ ජීවිතවලට කොයිතරම් අහිතකර ව බලපානව ද, ඒ ගැන කථා කිරීමට මගේ මුල් ඇරයුම නුවන්. ප්‍රසන්න සොහොයුරාට

නහි වේරේන වේරානි - සම්මන්තීධ කුදාචනං
අවේරේන ච සම්මන්ති - එස ධම්මෝ සනන්තනෝ

තරහව තරහවෙන් මේ ලොව කිසි කලෙක
සන් සිඳුමක් නොවේ එය ඇත්තකි නිසැක
වයිරය මෙතිනි සන් සිඳුනේ හැම කලෙක
වෙනසක් නොවී නිබඳව පවතින දමේක

පූජාර්හ ස්වාමීන්වහන්සේ ගෙන් අවසර යි.
මා ප්‍රිය බෝසත් කුමර කුමරියනි,

එක්තරා පවුලක අම්මෙකු යි, තාත්තෙකු යි, පුතෙකු යි සතුටින් ජීවත් වුණා. පියා හදිසියේ ම මිය ගියා. පියා ගේ ඇවෑමෙන් පුතාට එක ම ආලෝකය වුණේ අම්මා. දෙදෙනා ම ජීවත්වුනේ ආදරයෙන්. පුතා කිසිවිටකවත් අම්මාට විරුද්ධව වැඩ කළේ නැහැ. දෙන අවවාද උපදෙස් හොඳින් අනුගමනය කළා. අම්මා පුතා ගේ අනාගතය ගැන හිතලා කුමාරිකාවක් සරණ පාවා දුන්නා. ඇය වඳ කාන්තාවක්, දරුවෝ නැහැ.

තවත් කාන්තාවක් අම්මා පුතාට ආවාහ කර දුන්නේ පළමු බිරිඳගේ ද කැමැත්ත ඇතුව යි. ඇයට දරුවෙකු ලැබෙන ලකුණු පහළ වුණා. මෙය දුටු පළමු බිරිඳ දරුවන් නැති නිසා ඇයට වෛර කළා. දරු සම්පත් දෙකක් ම විෂ බෙහෙතකින් විනාශ කළා. තුන්වන දරුගැබටත් විෂ බෙහෙත් දුන්නා. ඇය මියැදුනේ පළමු බිරිඳ කෙරෙහි වෛරයෙන්. මේ වෛරය ආත්ම ගණනාවක් පුරා පැවතුණා. අන්තිම ආත්මයේදී එක් කාන්තාවක් මිනිස් කාන්තාවක ලෙසත් අනෙක් කාන්තාව කාලි නමින් යක්ෂණියක ලෙසත් සැවැත්නුවර උපන්නා.

යක්ෂණිය මිනිස් කාන්තාව ගේ දරු දෙදෙනෙකු ම මැරුවා, තුන්වන දරුවා මරන්නට එද්දි දරුවා රැගෙන කාන්තාව ජේතවනාරාමයට ගියා. දරුවා බුදුහාමුදුරුවන් ලඟ තබා පිළිසරණ පැතුවා. ආත්ම ගණනාවක් දෙදෙනා කරගත් මහා විපත පෙන්වා දෙමින් බුදුරජාණන් වහන්සේ මා මුලින් ප්‍රකාශ කළ ගාථා රත්නය දේශනා කළා.

වෛරයෙන් වෛරය කිසි කලෙකත් සන්සිඳෙන්නේ නැහැ. සන්සිඳෙන්නේ මෛත්‍රියෙන් ම යි. මෙය ලෝකයේ කවදත් පවතින ධර්මතාවක්. මේ බණෙන් දෙදෙනාම සමඟි වුනා. යකින්න සෝවන් වුනා.

බණින තැනැත්තාට බැණ වැදීමෙන් පහරදුන් තැනැත්තාට පහරදීමෙන් වෛරයේ ගිනිසිළු නිවා දමන්න බැහැ. පහර දුන් අයට පෙරලා පහර දෙන්නේ නැත්නම් ඔහු නැවතත් පහර දෙන්නට පෙළඹෙන්නේ නැහැ. ඔහු මනසින් පසුතැවෙනවා. තමා කළේ පහත්

ක්‍රියාවක් බව ඔහුට ම වැටහෙනවා. වෛර කිරීමෙන් තමා ම තමාට පරදිනවා. මෛත්‍රිය කිරීමෙන් තමා ම තමාට ජය ළඟාකර ගන්නවා. ක්‍රෝධ නොකිරීමේ ආනිසංස රැසක් තිබෙනවා. බොහෝ දෙනාට ප්‍රිය වෙනවා. ක්‍රෝධ සිතුවිලි නැති වෙනවා. වැරදි අඩුවෙන් කරන තැනැත්තෙක් වෙනවා. සිහියෙන් යුතුව මරණයට පත් වෙනවා.

සෙම් සොටු මල මූත්‍ර ආදියෙන් අපවිත්‍ර වූ තැනක් ඒවායින් ම පිස දැමුවොත් එතැන තව තවත් අපවිත්‍ර වෙනවා. පිරිසිදු ජලය වැනි දෙයකින් සෝදා දැමීමෙන් පිරිසිදු කරගත හැකි වෙනවා. අද පටන් අපි වෛර සිත් ඇතිකර ගැනීමෙන් තොර වෙමු. මෙත් සිතිවිලිවලින් සිත් පූරවා ගනිමු.

සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා
සියලු සත්වයෝ සැප ඇත්තෝ වෙත්වා

**සභාපති**

ක්‍රෝධයේ ගිනිසිළු මෙත්ගුණ දහරින් නිවාලන්නට අපට මග පෙන්වූ ඔබට අපගේ කෘතවේදී ස්තුතිය. මේ සභාවේ ඉන්න ඔබෙන් කවුරුහරි ඇසුවොත් ඇත්තට ම ඔබ වැඩියෙන් ම ආදරේ කාටද කියා ඔබ විවිධ අය ගැන කියාවි. ඒ ඔබ ආදරේ කරන විවිධ අය ඉන්නා නිසා. ඒත් ඇත්තට ම ඔබ වැඩියෙන්ම ආදරේ ඔබට ම නේ ද? ඒ ගැනත් අවධානය යොමු කරමින් බුදු දහමට අනුව අපි සතුන්ට හිංසා නොකළ යුත්තේ ඇයි යන කරුණ ගැන කථා කරන්නට අපේ ඇරයුම, සම්පත් දිසානායක සොහොයුරාට යි.

**දිසානායක**

සුඛ කාමානි භූතානි - යෝ දණ්ඩේන විහිංසති
අත්තනෝ සුඛමේසානෝ - පෙච්ච සෝ න ලභතේ සුඛං

සුඛ කාමානි භූතානි - යෝ දණ්ඩේන න හිංසති
අත්තනෝ සුඛමේසානෝ - පෙච්ච සෝ ලභතේ සුඛං

ගෞරවනීය අප හාමුදුරුවන් වහන්සේ ඇතුළු මහ සභාවෙන් අවසරයි.

ගරු සභාපතිතුමනි, කුමර කුමරියනි,

මා මෙතැනට පැමිණියේ ඔබ ගැන යමක් ඔබට ම කියන්නට, අප කවුරුත් වැඩිපුරම ආදරේ අපටම යි. අප කවුරුත් හිංසාවට පීඩාවට පත් වෙන්න කැමති නැහැ. ඒ නිසා කිසිවකුට හිංසා පීඩා කිරීම හොඳ නැහැ. අප අකැමැති වේදනාවක් අනුන්ට ඇතිකිරීම හොඳ නැහැ. මේ ගැන සිතන විට මගේ මතකයට නැගෙන්නේ මා මුලින් ප්‍රකාශ කළ ගාථාවේ නිදාන කථාව.

බුදුරජාණන් වහන්සේ පිණ්ඩපාතේ වඩිනවිට දුටුවා අපේ වයසේ ම දරුවන් පිරිසක් සර්පයකුට පහර දෙනවා. බුදුහාමුදුරුවෝ ටික වේලාවක් එතැන නතර වුණා.

"දරුවනේ , ඔබ මොකද කරන්නේ," ?
"බුදුහාමුදුරුවනේ අපි මේ සර්පයා මරන්නයි හදන්නේ,"
"ඔය ළමයි කැමැති ද කවුරු හරි ඔය ළමයින්ට ගල්වලින් පොලුවලින් අතින් පයින් ගහනවට."?
"අපොයි නැහැ. බුදුහාමුදුරුවනේ අපට රිදෙනවනේ, තුවාලත් වෙනවනේ"

අන්න ඒ වගෙයි දරුවනේ අනෙකුත් අයත්, සියලුම සතුනුත් එහෙම යි.

"තමන්ගේ සැප පතන කවුරුවත් සතුන්ට හිරිහැර කරන්නේ නැහැ. දයාව කරුණාව තමයි දක්වන්නේ. තමන්ට තමන් පළමුව ආදරේ කරලා නරක පුරුදුවලින් ඈත් වෙනවා. අනුනට හිරිහැර කරන්නෙත් නැහැ. ඒ නිසාවෙන් ම මෙලොව පරලොව සැප ලබනවා නරක වැඩ කළොත් දෙලොව ම දුක් විඳින්න වෙනවා," අපිත් මෙම බුදුවදන අනුගමනය කර ගුණසුවඳින් ජීවිතය සුවඳවත් කර ගනිමු. සමුගන්නට කලින් මා සඳහන් කළ ගාථා දෙකේ අදහස කවියෙන් කියන්නම්.

තම සැප සොයමින් බැහැරව දහමට
කිසිවෙකු හිංසා කළහොත් සතුනට
දුක ඔහු පසු පස පැමිණෙයි හැමවිට
සැපතක් නොලැබෙයි පරලොව ගියවිට

තම සැප සොයමින් යොමූ වී දහමට
කිසිවකු හිංසා නො කළොත් සතුනට
සැප ඔහු පසුපස පැමිණෙයි හැමවිට
සැපතම හිමිවෙයි පරලොව ගියවිට

ඔබ සැමට සම්මා සම්බුද්ධ සරණයි !

සභාපති

තමන්ට මෙන් අන් අයට ද ආදරේ කර හිංසාවෙන් වැළැකී හොඳ වැඩවල යෙදීමේ වැදගත්කම අපට කියාදුන් තරිඳු සම්පත් දිසානායකට අපගේ කෘතවේදී ස්තුතිය.

මාසේ පෝයදාට අහස අන්ධකාරයි, හඳ නැති නිසා. හඳ ඇති පුර පෝයදාට කවුරුත් කැමැතියි, අහසත් පරිසරයත් සඳ රැසින් ලස්සන වෙන නිසා. ඒ ලස්සන සඳට අපේ බුදුහාමුදුරුවෝ පුද්ගලයෙක්ව උපමා කළා. කවුද ඒ පුද්ගලයා කියා අපි අහල බලමු, පූර්ණිමා ජයවර්ධනගෙන්.

පූර්ණිමා ජයවර්ධන

යො ච පුබ්බෙ පමජ්ජිත්වා
පච්ඡා සො නප්පමජ්ජති
සො ඉමං ලෝකං පභාසේති
අබ්භා මුත්තෝ ව චන්දිමා

අනුවණ විලස වැඩ කරමින් පමා කොට
සිටිය අයකු පසු සිහි උපදවා සිට
වැඩ කළහොත් මුළු ලෝකය පුබුදු කොට
සඳමෙන් බබළවයි වැහිකළු ඉවත් කොට

පින් කෙතක් බඳු අප හාමුදුරුවන් වහන්සේගෙන් ද
ඇදුරු මඬුල්ලෙන් හා ඔබ සැමගෙන් ද අවසරයි

අපේ හාමුදුරුවන් වහන්සේලා, ගුරු මෑණිවරු ගුරුපියවරු මව්පියන් වැඩිහිටියන් අපට පවරන වගකීම්, දෙන අවවාද අනුශාසනා ධර්ම උපදේශ අනුව වැඩ කළොත් අපට සිද්ධ වන්නේ යහපතක්මයි. ඒවා ඉටුකිරීම අපේ යුතුකමක්.

ගුරු සිත නොරිදු වා
වේලාව නො වරදු වා
බැති පෙම් උපදු වා
අකුරු උගනී කුමරු සොඳු වා

අපේ බුදුහාමුදුරුවන්ගේ කාලයේ වැඩසිටියා සම්මුඤ්ජනි කියලා පොඩි හාමුදුරුනමක්. උන්වහන්සේ වැඩි කාලයක් ගත කළේ මළුව ඇමදීමට. සම්මුඤ්ජනි හාමුදුරුවෝ අනෙක් භික්ෂූන් වහන්සේලා මළු පෙත්මත් ඇමදීමෙන් වළකින බව කියා දොස් නගන්නට වුණා. දිනක් රේවත හාමුදුරුවෝ සම්මුඤ්ජනි හාමුදුරුවන් ඇතුළුව සියලුම භික්ෂූන් වහන්සේලාට ප්‍රකාශ කළා කාලය වෙන් කරගෙන උදේ හවස මළුව අමදින්න. අනෙක් වේලාවල බණ භාවනා කරන්න කියා. මේ අවවාදය පිළිගත්ත සම්මුඤ්ජනි හාමුදුරුවෝ කෙටි කලෙකින් ම රහත් වූනා.

මේ සිද්ධිය මුල්කර ගෙන හොඳ උපදේශයක් අපට බුදුහාමුදුරුවෝ ලබා දුන්නා. ඒ උපදේශය තමයි මා මුලින් සඳහන් කළ ගාථාවේ ඇතුළත් වන්නේ. මුලදී අඩුපාඩුකම් සහිත ජීවිතයක් ගත කළත් පසුව නිවැරදි ජීවිතයකට හුරුවුවහොත් ඒ තැනැත්තා වළාකුලෙන් මිදුන සඳවගේ ලෝකය ම බබළවන බවයි. බුදුරජාණන් වහන්සේ වදාළේ.

තම ජීවිතයෙහි ඇති අඩුපාඩු සකස් කර ගැනීමට තම දුබලතා හඳුනාගෙන එයින් වැළකීමට වයස තරාතිරම බාධාවක් නොවෙයි. සම්මුඤ්ජනි හාමුදුරුවෝ වගේම අංගුලිමාල හාමුදුරුවෝ, ධර්මාශෝක රජතුමා වැනි අයගේ චරිත කථා එයට කදිම නිදසුන්. පමාවී හෝ ජීවිතය සුමගට යොමු කර නොගත්තොත් ජීවිතය පුරාවට ම අපට සිද්ධ වෙන්නේ පසුතැවෙන්නට. තමන්ගේ උත්සාහය, කල්‍යාණ මිත්‍ර ආශ්‍රය තුළින් යහපත් මගට පිවිසෙන්නට ඔබට ශක්තිය හා ධෛර්යය තෙරුවන් සරණින් ලැබේවා.

**සභාපති**

පුන්සඳ කියන්නේ පරිසරයේම එක අංගයක්, සලකුණක්. ඔබත් ඒ පරිසරයට යි අයිති. ඔබත් පුන්සඳ මෙන් සමාජයට ආලෝකයක් වන්න. එම අදහස් අපට ඉදිරිපත් කරමින් අපව අවදි කළ පූර්ණිමා ජයවර්ධනටත් අපේ පුනාහානුමෝදනාව. අපගේ අද දවස වගේම හෙට දවසත් අරුත්බර කරවමින් අපට නිතරම අර්ථයෙන් ධර්මයෙන්

අනුශාසනා කරන අපේ ස්වාමීන්වහන්සේට යි මෙ ගෞරවනීය ආරාධනාව, අනුශාසනා ව පැවැත්වීමට.

අනුශාසනාව

දරුවනි බලන්න මේ මේසය මත තිබෙන රෝස මල් බඳුන දෙස. අපේ ජීවිතත් හරියට රෝසමල් වගේ. අපේ දූ දරුවන් වෛරය, ක්‍රෝධය, පළිගැනීම, ප්‍රමාදය ගැන කථා කළා. ඒවා හරියට නටුවේ කටු වගේ. ඒ වගේම මෛත්‍රිය, කරුණාව, මුදිතාව, අප්‍රමාද බව, අවිහිංසාව, තමන්ට තමන් ආදරය කළයුතු බව කථා කළා. ඒවා හරියට රෝස මල් වගේ. රෝස මලත් කටුත් තියෙන්නේ එකම නටුවක. ඒ වගේමයි අප ළඟ තිබෙන හොඳ නරකත් කුසල, අකුසලත්, හොඳ ගුණ ධර්ම ඔබ ළඟ හැමදාක ම පවතිනවා නම් ඔබ සුවඳත් ලස්සනත් කැටිවුන රෝස මලක් වගේ. එවිට ඔබ මුළු පරිසරයම ලස්සන කරාවි. සුවඳ කරාවි.

ඔබ අතින් යම්කිසි වරදක් සිදුවූවා නම් ඒ වැරදි හදාගන්න ඕනෑ. පූර්ණිමා ජයවර්ධන සිසුවිය මතක් කළා, පසුබට නොවී වැරදි හදාගත් පුද්ගලයන් කීප දෙනෙක් ගැන. ඒ අය මුළු භාරතයම බුදු සසුන ම ආලෝකවත් කළ අය. මා ඔය දරුවන් කළ කථා තුන ම හොඳින් ඇසුවා. ගාථා කියනවිට අල්ප ප්‍රාණ මහා ප්‍රාණ අකුරු වරද්දන තැන් තිබුණා. ඒවා හොඳින් ඉගෙන ගෙන උච්චාරණය කරන්න, පාලි වචන යොදන විටත් නිවැරදි වචනය ම යොදන්න. උදාහරණයක් වශයෙන් පාලි භාෂාවෙන් "සූක" කියන්නේ ගිරවට. "සුඛ" කියන්නේ සැපයට. ටිකක් ශබ්ද නඟලා ගාථා කියන්න. ගාථා තාලයකට අනුව ගායනා කරනවිට කවුරුවත් හොඳින් ශ්‍රවණය කරන බව දුටුවා. අනෙක් දරුවනුත් පුංචි පුංචි රැස්වීම්, සභාවේ තැන් තැන්වල නොතියා තම දැනුම ආකල්ප කුසලතා දියුණු කරගන්න උනන්දුවන්න. නිහඬව කථාවලට සවන් දීමෙන් ඔබට කොයි තරම් දේවල් ඉගෙන ගන්න පුළුවන්ද? හෙට දවස වෙන් වන්නේ ඔබටය යි. ඒ ගැන සිතන්න. "අජ්ජේව කිච්චං ආතප්පං" අද අදම ක්‍රියාත්මක වන්න, අද වැඩේ අද ම කරන්න. ඔබ ඔබටත් අනුන්ටත් සමස්ත සමාජයටමත් පහන් ටැඹක් වන්න සිතාගන්න. අනුශාසනාව මම අවසන් කරන්නේ සිරිත්මල්දමේ එන මේ කවියෙන්.

සොඳුරු සැප වේවා!
උතුරු ගුණ වැඩි වේවා!
මහරු බල වේවා!
මෙදරු පෙළහට ජයක් වේවා!

ඔබ හැම දෙනාටම තෙරුවන් සරණයි.

**සභාපති**

"ධම්මපදයෙන් බිඳක් සවනට" වැඩසටහන වඩාත් සාර්ථක කිරීමට වැඩම කර අනුශාසනාවකින් අපව දිරිමත් කළ දහම් පාසලේ ප්‍රධානාචාර්ය අපේ ස්වාමීන් වහන්සේට කෘතඥතා පූර්වක පුන්‍යානුමෝදනාව පළමුවෙන් ම .ධම්මපදයෙන් දහම් කරුණු ඉදිරිපත් කළ සැමටත් සහාය දැක්වූ ඔබ සැමටත් තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරනවා.

(ලේකම් තුමියගේ ස්තුති කථාවෙන් හා ජත්තමානවක ගාථා සජ්ඣායනාවෙන් පසු සභාවේ වැඩ කටයුතු නිමා විය.)

**ක්‍රියාකාරකම් :**

පහත දැක්වෙන වාක්‍යවල හිස්තැන් පුරවා අභ්‍යාස පොතේ ලියන්න.

1. * ධම්මපදයේ ගාථා ............... කි. වර්ග ................... කි.
   * වෛරයෙන් ................... කිසි කලෙකත් නොසන්සිඳේ.
   * ............................ වෛරය සන්සිඳේ.
   * වලාකුළින් මිදුනු සඳට උපමා කර ඇත්තේ ............... තැනැත්තාය.
   * තම සැප පතා අනුන්ට ...................... නොකළ යුතු යි.
2. මෙහි ඇතුළත් ගාථා තේරුම් සහිතව කටපාඩම් කරගෙන තාලයකට අනුව ගායනා කරන්න.
3. පාඩමෙහි ඇති ගාථා ඇසුරින් ලබාගත හැකි උපදේශ ලියා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

# 14. ගුරු දෙගුරුන්හට සලකමු මෙලෙසට

සිරි සිදුහත් දහම් පාසලේ සිසු දරුවන් සෑම පුර පසළොස්වක පෝය දිනක ම අටසිල් සමාදන් වීම සිරිතකි. ප්‍රධානාචාර්ය ස්වාමීන් වහන්සේගේ මග පෙන්වීම මත මැදින් පෝයදා ඔවුහු විශේෂ සීල භාවනා වැඩ සටහනක් සංවිධානය කළහ. මෙදින සිල් සමාදන්වූ පිරිසෙන් වැඩි දෙනෙක් පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ මව්පියෝ ය. ඔවුනගෙන් ඇතමකු සිල් සමාදන් වූයේ පළමුවරට ය. ඒ තම දූපුතුන්ගේ බලවත් ඉල්ලීම නිසා ය.

දහවල් දානය දහම් පාසලේ සිසු සිසුවියන් විසින් ම පිරිනමනු ලැබීම ද තවත් සුවිශේෂ කරුණකි. ඔවුහු ඉතා උනන්දුවෙන් උවසු උවැසියන්ට උවටැන් කළහ. සෑම පෝය දිනක ම දානය අවසානයේ දහම් පාසලේ බෝසත් ළමා සමාජය මගින් සංවිධානය කෙරෙන දහම් දෙසුමකි. එය බෞද්ධ හැදියාව දියුණු කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන විවිධ මාතෘකා යටතේ පැවැත්වෙන්නකි. මෙදින ධර්ම දේශනාවේ මාතෘකාව වූයේ " ගුරු දෙගුරුන්හට සැලකීම " යන්න යි. අපි මෙතැන් සිට එම ධර්ම දේශනාවට සවන් දෙමු.

වැඩිහිටි පින්වතුනි, බෝසත් දරු දැරියනි,

අපේ සුද්ධෝදන මහරජතුමා තම පුත් සිදුහත් කුමාරයාත් නන්ද කුමරයාත් නොසිතුව මොහොතක මහණවීම නිසා සිටියේ බලවත් චිත්ත පීඩාවකින්. රාහුල කුමරු තමාගේ අනුමැතියකින් තොරව සසුන්ගත කළ නිසා මේ වේදනාව තවත් වැඩි වුණා. අධික දරු සෙනෙහස නිසා බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ රජතුමා මෙසේ ප්‍රකාශ කළා.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, දරු සෙනෙහස කියන්නේ පුදුමාකාර දෙයක්. ශරීරයත්, සමත්, මසත්, නහරත්, ඇටත් පසාරු කරගෙන ගොස් ඇට මිදුලු දක්වා කාවැදී පවතින්නක්. ඒ නිසා දරුවන්ගේ වෙන්වීම මහත් පීඩා ගෙන දෙන්නක්. එ බැවින් මව්පියන් ගේ අවසරයක් නැතිව කිසි ම දරුවකු මහණ නොකරන ලෙස මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා."

සුද්ධෝදන රජතුමා කළ ඒ ඉල්ලීම බුදුරජාණන් වහන්සේ පිළිගත්තා. එය විනය නීතියක් බවට ද පත් කළා. එදා මෙදාතුර මව්පියන්ගේ අවසරයකින් තොර ව දරුවකු සසුන්ගත කරන්නේ නැහැ, මව්පියන් තම දරුවන්ට ඇති සෙනෙහසේ මහිමය කියන්නට මෙම කරුණ වුව ද ප්‍රමාණවත්. මෙම අදහස් වඩාත් සිත් සසල කරවමින් එදිරිවීර සරත්චන්ද්‍ර මහාචාර්ය තුමා සිංහබාහු නාට්‍යයේ මෙසේ සඳහන් කරනවා.

පුතු සෙනේ මස් නහර හම සිඳ
ඇට සොයා ගොස් ඇට තුළට වැද
ඇට මිඳුලු මත රඳා සිට දුක්
දෙයි තිබන්දා

පුතු සෙනේ පිය හද තුළ ම මිස
නැත පුතුන් හද තුළ රඳන්නේ
ඇට තුළට වැද ඇට මිඳුලු මත
සදාකල් නැත දුක් දෙවන්නේ

දෙමාපියන්හට නියම ලෙස ප්‍රත්‍යුපකාර කිරීමට නම් දරුවන් ඒ අය ගුණාංග හතරක පිහිට විය යුතු වෙනවා. එහි පළමු වැන්න සද්ධාව යි. තම දිවි දෙවෙනි කොට දරුවන් වෙනුවෙන් කැපවෙන මව්පියන් සිය දෙඋර මත තබා අවුරුදු සියක් පෝෂණය කළත්, කැත කුණු ඉවත් කළත්, එය මවුපියන්ට දරුවන්ගෙන් කෙරෙන ප්‍රමාණවත් උපකාරයක් නොවන බව යි බුදුරාජාණන් වහන්සේ වදාළේ. සද්ධා, සීල චාග, පඤ්ඤා කියන ගුණාංගවල දෙගුරුන් පිහිටුවන දරුවන් තම යි නියම ලෙස දෙමාපියන්ට ප්‍රත්‍යුපකාර කරන්නේ.

බුදුරජාණන් වහන්සේගේ බුද්ධත්වය කරුණු සහිත ව පිළිගැනීම යි සද්ධාව. බුද්ධ රත්නය පිළිගත් විට ධර්ම රත්නයත් සංඝරත්නයත් පිළිගන්නවා. මේ අනුව තෙරුවන් තුළ ඇති සූවිසි මහාගුණ හඳුනාගෙන පිළිගෙන තෙරුවන් කෙරෙහි පැහැදීම යි සද්ධාව. සද්ධා ගුණය නැති මව්පියන් තුළ එම ගුණය වැඩි දියුණු කිරීමට ඔබට විවිධ දේ කළ හැකි යි. මේ ඒ අතර කීපයක්

* ධර්ම දේශනා පැවැත්වෙන ස්ථානවලට කැඳවාගෙන යෑම.
* සැදැහැවත් උපාසක උපාසිකා ඇසුර ලබාදීම.
* දහම් පාසලේ සහ දිනපතා පාසලේ බුද්ධ ධර්මය පෙළපොත ඔවුන්ට ඇසෙන සේ කියවීම.

* ගුවන් විදුලියේ සහ රූපවාහිනියේ බෞද්ධ වැඩ සටහන් ඇසීමට හා නැරඹීමට අවස්ථාව සැලසීම.

* දෙගුරුන් සමඟ දිනපතා සවස නිවසේ දී තෙරුවන් වන්දනා කිරීම.

* සිය කැමැත්තෙන් ම තෙරුවන් වන්දනා කරන මව්පියන්ට මල් පිළියෙල කරදීම.

* දෙමාපියන් කැටුව වන්දනා ගමන් යෑම.

මව්පියන් තුළ ඇති කළයුතු දෙවන ගුණය සීලය යි. කය වචනය දෙකේ සංවරකම සීලය බව යි බුදුදහමේ ඉගැන්වෙන්නේ. සිල්වත්කමින් අඩු මව්පියන් සීලයෙහි පිහිටුවීමට ඔබට කළ හැකි ක්‍රියා මාර්ග කීපයක් කියා දෙන්නම්

* පස්පව්වල ආදීනව කියැවෙන බණ කතා, පුවත්පත් වාර්තා, පද්‍ය රචනා ඇසීමට සැලැස්වීම.

* උපෝසථ සීලය සමාදන්වීමට උනන්දු කරවීම.

* සිල් සමාදන් වූ දෙගුරුන්හට උවටැන් කිරීම.

* මතට ලොල් වූ පියෙකු නම්හොඳ සිහියෙන් සිටින විට දෙපා නැමද ගෞරවයෙන් යුතුව ඒවායේ ආදීනව කියා දීම.

චාග සම්පදාව මව්පියන් තුළ පිහිටු විය යුතු තෙවන ගුණය යි. පිරිසිදු සිතින් දීම ත්‍යාගය යි. ලාභයක් අපේක්ෂාවෙන් දීම පරිත්‍යාගයක්වත්, දානයක්වත් වන්නේ නැහැ. කරුණාවෙන් යමක් පරිත්‍යාග කරන්නට දෙගුරුන් හුරුකරවීමට ඔබට කළහැකි දේ අපමණ යි.

* පන්සලේ, පාසලේ, ගමේ කෙරෙන පොදු කටයුතුවලට මව්පියන් යොමු කරවීම.

* එවන් පොදු වැඩවල දී දෙගුරුන් ලවා සුළු හෝ පරිත්‍යාගයක් කරවීම.

* තම ඉඩමෙන් වෙනත් අයකු ගේ නිවසට යන අඩි පාරට, විදුලි මාර්ගයට, දුරකථන මාර්ගයට, ජලනල පද්ධතියට, රථවාහන මාර්ගයට කැමැත්තෙන් ම ඉඩදෙන ලෙස දෙගුරුන්ගෙන් ඉල්ලා සිටීම වගේ දේ ඔබට කරන්න පුළුවන්.

සතරවන ගුණාංගය දෙගුරුන් තුළ ප්‍රඥා ගුණය වඩා වර්ධනය කිරීමයි. එදිනෙදා ජීවිතයේදී හොඳ නොහොඳ තේරුම් ගැනීමට අතිශයින් ම ප්‍රඥාව ප්‍රයෝජනවත් වෙනවා. එවන් ප්‍රඥා ගුණයට මව්පියන් හුරුපුරුදු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග අතර කීපයක් දක්වන්නම්.

* බණ ඇසීමට, පොත්පත් කියවීමට, කියවීම අසා සිටීමට සැලැස්වීම.
* බුද්ධිමත් සංවාදවලට, ධර්ම සාකච්ඡාවලට, සහභාගි කරවීම.
* රූපවාහිනිය, ගුවන්විදුලිය මගින් ප්‍රචාරය කරනු ලබන ගුණනැණ වඩවන විශේෂ වැඩ සටහන්වලට යොමු කරවීම.
* මද්‍ය සාරය ප්‍රඥාව දුර්වල කරන්නක් බැවින් එමගින් මුදවා ගැනීම.

මව්පියන්, සැදැහැවතුන්, සිල්වතුන්, පරිත්‍යාගශීලීන්, ප්‍රඥාවන්තයින් බවට පත්කර ඔවුනට දහම් ආලෝකය ලබාදිය හැකි නම් එය මව්පියන් සඳහා ඔබට කළ හැකි උසස්ම ප්‍රත්‍යුපකාරය යි.

දෙගුරුන්ට සැලකීම ගැන කරුණු දැක්වීමෙන් පසුව ස්වාමීන් වහන්සේ දේශනා කළේ ගුරුතුමන් පිළිබඳව යි.

ඔබට මතකද ඔබ පාසලට පිය නැගූ මුල්ම දවස? එදා මුලින්ම ගුරුතුමාට ලැබුණේ විවිධ සමාජවල උපන් විවිධාකාර හැසිරීම් රටා ඇති දූ-දරු පිරිසක්. ඔබේ හැකියා හඳුනාගෙන අධ්‍යාපනය මගින් ගුණ නැණ දෙකෙන් යුතු පූර්ණ පුද්ගලයකු බවට ඔබ පත් කරන්නේ ගුරුතුමා. ගුරුතුමා හුදෙක් ඔබට දැනුම ලබාදෙන්නකු පමණක් ම නො වෙයි. ඔබගේ චරිතය ගැන සොයා බලා නරක වැඩවලින් ඔබ මුදවාගෙන හොඳ වැඩවල යොදවන්නෙක්.

සැම අතින්ම හැදුණු වැඩුණු දූරදර්ශී අයකු බවට ඔබ පත්වන්නේ ගුරුතුමා ගේ මග පෙන්වීමෙන්. දෙගුරුන්ට දක්වන සැලකිල්ල ගුරුතුමා වෙනුවෙනුත් ඔබ දැක්විය යුත්තේ මේ නිසා යි. ගුරුතුමාට ගුරුතුමියට ඔබට කළහැකි ප්‍රත්‍යුපකාර අතර කීපයක් දක්වන්නම්.

* ගුරුතුමා දුටුවිට හුනස්සෙන් නැගිටීම.
* ගුරුතුමාට සංග්‍රහ සම්මාන කිරීම.
* ගුරුතුමාගේ කාර්යයන් ඉටුකර දීම.

* මැනවින් ඉගෙනීම සහ ගුරු උපදෙස් අනුව ක්‍රියා කිරීම.
* ගුරුබසට හොඳින් සවන් දී ඒවා සිත් දරා ඒ අනුව ක්‍රියා කිරීම.
* නිසි දිනට නිසි වේලාවට අභ්‍යාස කර පෙන්වීම.
* අද කළයුතු වැඩ කොටස අද ම සිදු කිරීම.
* තමා පිළිබඳ හොඳ ආරංචි ගුරුතුමාට ලැබෙන්නට සැලැස්වීම.
* ගුරුතුමා පාසලෙන් අස් වී ගිය ද, විශ්‍රාම ගත්තද කළගුණ සිහිකර ගෞරව දැක්වීම හා අවවාද අනුශාසනා ලබා ගැනීමට පුරුදුවීම.

මේ කරුණු සියල්ල ම ශිෂ්‍යයා හා බැඳී පවතිනවා. ශිෂ්‍යයා හැමවිට ම සුවඳවත් මල් කැකුළක් වැනි විය යුතු යි. මල් කැකුළ බාහිර පෙනුමෙන්, සුවඳින් මෝරනවා වගේ ශිෂ්‍යයාද බාහිර ප්‍රසන්න භාවයෙන් මෙන් ම ගුණ නුවණින් ද වර්ධනය වීම අවශ්‍ය යි. සැරියුත් මහ රහතන් වහන්සේ සැතපෙන විට තම ගුරුදේවයාණන් වහන්සේ වූ අස්සජි මහරහතන් වහන්සේ වැඩ වෙසෙන විහාරය දෙසට නමස්කාර කර ඒ දෙසට හිස ලා සැතපුණු බව එම චරිත කථාවේ සඳහන් වෙනවා. ඔබත් එලෙස ඔබේ ගුරු මෑණියන්ට ගුරු පියාණන්ට ගෞරවය හා සෙනෙහස දක්වන්න පුරුදු වන්න.

මේ දරුවන් එක්සත්ව එක්සිත්ව එකම අරමුණක සිට ඔබටත් ඔබේ ගුරු දෙගුරුන්ටත් සතුටු විය හැකි පින්කමක් කළා. දන් මේ වැඩිහිටියන්ගේ මුහුණුවලින් පවා පෙනෙනවා ඔවුන් තුළ ඇති සතුට මේ ධර්ම දේශනාවට වැඩමවන්නට කලින් මව්පියන් මේ දරුවන්ගේ ක්‍රියාව අගයමින් ප්‍රශංසාත්මක ව මා සමඟ කථා කළා.

මතට දුමට ලොල් වූ ඇතැම් පියවරුන් මට පොරොන්දු වුණා එවන් වැඩ නැවත නොකර ඒ මුදල් දරුවන්ගේ දියුණුවට, මෙවැනි සුභසාධන වැඩවලට යොදවන බවට, ගෙවල්වල නොයෙක් ගැටලු ප්‍රශ්න ඇතිවන්නේ නඩු හබවලට යොමු වන්නේ කෙනකුගේ දියුණුවට බිම් අඟලක්වත් නො දෙන්නේ අපි හරිහැටි ධර්මය නො දකින නිසා. එය අද දරුවන් නිසා තේරුම් ගත් බව යි, අම්මාවරුන් ප්‍රකාශ කළේ. මට මතක්වෙනව එදා විශාලාමහනුවර කූඨාගාර ශාලාවේ දී සිදුවුන සුහද පිළිසඳරක්. එදා මහාප්‍රජාපතී ගෝතමී මෙහෙණින් වහන්සේ බුදුරජාණන් වහන්සේ දෙස බලාගෙන දරුවන් කැමති අම්මලා මෙවන්

දරුවන් ප්‍රාර්ථනා කරන්නැයි ප්‍රකාශ කළා. මේ දරුවෝ ගැනත් අපට හිතෙන්නේ එහෙම යි.

මෙ දරුවන්ට දන් පැහැදිලි වන්න ඇති ඔබ කළ පින්කමේ ඇති වටිනාකම ධර්මදේශනාව නිමා කිරීමට පෙර සිරිත් මල්දමේ එන මේ කවිය මතක් කරන්න කැමති යි.

දෙගුරුන් ගුරුන් ඉටු දෙවියන් ලෙස සිතමු
උතුමන් බසින් ඉටු දෙවියන් දැන ගනිමු
එබැවින් නිතින් මේ දෙවියන් වැඳ ගනිමු
බැලුමෙන් හොඳින් ගුරු දෙගුරුන් රැක ගනිමු

ඔබ සැමට තෙරුවන් සරණයි !

**ක්‍රියාකාරකම් :**

1. දෙගුරුන් වෙනුවෙන් ඔබට කළ හැකි නියම ප්‍රත්‍යුපකාරය කුමක්දැයි කෙටියෙන් දක්වන්න.
2. "ගුණ නුවණ වඩාලන අපේ ඉටු දෙවිවරු" මැයෙන් ගුරුවරුන් පිළිබඳව වචන 25ක රචනාවක් හෝ කවි දෙකක් නිර්මාණය කරන්න.

**පැවරුම :**

1. ගුරු දෙගුරුන් ගේ අගය ගැන කියැවෙන ගීත එකතු කර කුඩා පොතක් සකස් කරන්න.

**පුහුණුවට :**

අභිවාදන සීලිස්ස - නිච්චං වද්ධාපචායිනෝ
චත්තාරෝ ධම්මා වඩ්ඪන්ති - ආයු වණ්ණෝ සුඛං බලං

වැඩිහිටි අය නිති නමදින
දූ දරු සැමහට සසොබන
ගුණ සතරක් වැඩෙයි සොඳින
ආයු, වණ්ණ, සැප, බල යන

**අලුත් සහල් මංගල්‍යය හා බැඳුණු පුදසිරිත් :**

දුරුතු පෝයදා අලුත් සහලින් කරනු ලබන පූජාවකි. යම් විටෙක අස්වනු නෙළීම ප්‍රමාද වේනම් නොපැසුණු වී කරල් රැගෙන මිරිකාගත් යුෂෙන් කිරිබතක් සාදා බෝ සමිඳුට පූජා කෙරේ. පෙර සිට ම අලුත් සහල් මංගල්‍යය සිදු කරන බවට බෝධීන් වහන්සේ ඉදිරිපිට ප්‍රතිඥා දීම ගොවියාගේ සිරිතකි. අලුත් අස්වැන්නෙන් ලබාගත් නො ඉඳුල් සහලින් කිරිබත් පිසීම මෙහි ප්‍රධාන කාර්යයයි. මෙය සාමූහික ක්‍රියාවකි. රන් පාත්‍රයක බහාලූ මෙම කිරි ආහාර හේවිසි හොරණෑ සහිත පෙරහැරකින් ශ්‍රී මහා බෝධීන් වහන්සේ වෙත වැඩමවනු ලැබේ. අනතුරුව විහාරයටත් බෝධීන් වහන්සේටත් පූජා කෙරේ.

**පරණ අවුරුදු මංගල්‍යය හා බැඳුණු පුදසිරිත් :**

මෙහි දී නව වසරට සෙත්පතා බුද්ධ පූජා බෝධිපූජා සිදු කෙරේ. එය පවත්වන්නේ අලුත් අවුරුදු දිනට දින පහකට පමණ පෙර බදාදා හෝ සෙනසුරාදාක ය. මෙයට ශ්‍රී මහා බෝධි විහාරයේ භික්ෂූන් වහන්සේලා ද රාජකාරි ගම්වල වැසියන් ද සහභාගිවීම අනිවාර්ය වේ. රාජකාරි ගම්වල අය ආයුධ හා වළං සැපයීම, හොරණෑ සක්ගෙඩි පිඹීම කළ යුතු වේ. මංගල්‍යයට පෙර දින සවස සියලු දෙනා එක් වී මල් පහන් ගිලන්පස සූදානම් කර ඒවා ශ්‍රී මහා බෝධීන් වහන්සේට පූජා කරති.

**අලුත් අවුරුදු මංගල්‍යය හා බැඳුණු පුදසිරිත් :**

මෙය වෙසක් පෝයට පළමු විසා නැකත උදා වෙනවාත් සමඟ සෙනසුරාදාවක කෙරෙන මංගල්‍යයකි. මෙයට අටමස්ථානය ම සම්බන්ධ වේ. නානුමුර මංගල්‍යය ලෙස ද මෙය හැඳින්වේ. බුද්ධ පූජා හා බෝධි පූජා ද මෙම මංගල්‍යයට ඇතුළත් ය. අටමස්ථානයේ ම භික්ෂූන් වහන්සේලා සහභාගි වීම, බෝධීන් වහන්සේට ආභරණ පැළඳවීම, අටමස්ථානාධිපතීන් වහන්සේ විසින් විශේෂ චාරිත්‍ර කිහිපයක් අනුගමනය කිරීම මෙම මංගල්‍යයේ දක්නට ලැබෙන ලක්ෂණ කීපයකි.

හිමිදිරි පාන්දර විසා නැකතින් ශ්‍රී මහා බෝධි විහාරයේ පිළිම වහන්සේට සොළොස් මහාපූජාව පැවැත්වේ. මෙය බුදුරදුන් ජීවමාන කාලයේ දෙවියන් සහ අග්‍ර උපස්ථායක වූ ආනන්ද තෙරණුවන් විසින් බුදුරජාණන් වහන්සේට කරන ලද පූජා ආශ්‍රයෙන් ඇතිවූවක් ය යන්න

## 15. අපිත් වඳිමු ජයසිරි මහබෝධී

ගෞතම මුනිඳුන් පිටදුන් බෝධී
සඟමිත් තෙරණිය ගෙනවැඩි බෝධී
මහමෙවුනාවේ රෝපිත බෝධී
අපිත් වඳිමු ජයසිරි මහ බෝධී

මෙවන් බෝධි පූජා කවි සිහියට නැගෙනවිට අපේ මතකයට එන්නේ අනුරාධපුරයේ ඇති ශ්‍රී මහා බෝධීන්වහන්සේ ය. එය ශ්‍රී ලාංකිකයන් සතු ඉපැරණි ම පූජනීය වස්තුවකි. වසර දෙදහස් පන්සියයක ඉතිහාසය කියාපාන ලොව ඇති එක ම ඓතිහාසික වෘක්ෂය වන්නේ ද මෙය යි.

ලක්දිව ශ්‍රී මහාබෝධීන්වහන්සේ විවිධ අවස්ථාවල පූජෝපහාරයට ලක්විය. බුදුරජාණන් වහන්සේගේ අනිමිස ලෝචන පූජාවෙන් උපහාර ලැබීය. දඹදිව දම්සෝ රජතුමා තෙවරක් සිය රාජ්‍යයෙන් පිදුවේ ය. දෙවන පෑතිස් නිරිඳු ලංකා ද්වීපයෙන් පුද කළේ ය. එදා සිට මේ දක්වා ලක්දිව රජ කළ සිංහල රජවරු විවිධ අවස්ථාවල ශ්‍රී මහා බෝධීන්වහන්සේ වැඳපුදා බෝධිඝර, බෝධි ප්‍රාකාර ආදිය කරවා එහි ආරක්ෂාව සැලසූහ. පැරණි රජවරුන් විසින් තම නමට සංඝබෝධි, අග්ගබෝධි ආදි වශයෙන් "බෝධි" යන පදය යොදා ගන්නා ලද්දේ ජයසිරි මහ බෝ සමිඳුන්ට තිබුණු ගෞරවය සහ භක්තිය නිසා ය. ශ්‍රී මහා බෝධීන්වහන්සේ මෙරටට වැඩමවද්දී එහි ආරක්ෂාව සඳහාත් එයට පුදපූජා හා තේවා විධි පැවැත්වීම පිණිසත් ශ්‍රේණි දහඅටකට අයත් විශාල පිරිසක් එවූ බව මහාවංශයේ සඳහන් වේ. එම පිරිස පරපුරෙන් පරපුරට එම කාර්යය නොකඩවා ඉටු කළහ. දැනුදු ඉටු කරන්නාහ.

දිනපතා හා වාර්ෂිකව ශ්‍රී මහා බෝධීන්වහන්සේ උදෙසා පූජා විධි පවත්වන පිළිවෙළක් තිබේ. ඒ සඳහා ම වෙන් වූ කාර්ය මණ්ඩලයක් ඇත. එහි ප්‍රධානත්වය දරන්නේ අටමස්ථානාධිපති නායක ස්වාමීන් වහන්සේ ය.

පූජාවිධි පැවැත්වීමට පෙරාතුව සිදු කරනු ලබන්නේ මළුපෙත්මං ඇමදීමය. වැඩ ඉන්න මළුව හෙවත් බෝධීන් වහන්සේ රෝපනය කර ඇති ඉහළ ම මළුව ඇමදීම සිදු කෙරෙන්නේ ස්වාමීන් වහන්සේ



ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ

නමක විසිනි. එය කරනුයේ ද සාම්ප්‍රදායික රටාවකට අනුවය. එනම් සමචතුරශ්‍රාකාර කොටු සිටින ලෙසට ය. එසේ කළ හැක්කේ පුහුණුවක් ලද අයෙකුටම පමණි. සෙසු පිරිස අනෙකුත් මළු අමදති. පරමල් ඉවත් කර විහාර ගෙය පිරිසිදු කිරීමෙන් පසු ශබ්ද පූජා සහිත බුද්ධ පූජාව වැඩමවා ගෙන එනු ලැබේ. එය ද සිදුවන්නේ භික්ෂූන් වහන්සේ නමකගේ අතිනි. ඒවා බෝධීන් වහන්සේ ළඟ දිනපතා කෙරෙන පූජා පිළිවෙත් අතර, කිහිපයකි.

අලුයම් දුරය, මද්දහන් දුරය, හැන්දෑ දුරය ලෙස තේවාවන් ත්‍රිවිධ වේ. මෙම තේවා කාර්යයෙහි ප්‍රධානියා අටමස්ථානාධිපති නාහිමිපාණන් වහන්සේ ය. විහාර ගම්වල පිරිස නියමිත රාජකාරිවල යෙදවීම, ඔවුන්ට උපදෙස් දීම පුද පූජා පිළිවෙත් ක්‍රමවත් ව සංවිධානය කිරීම උන්වහන්සේ සතු වගකීම වේ.

ශ්‍රී මහා බෝධීන් වහන්සේ උදෙසා වාර්ෂිකව සිදු කරනු ලබන මංගල්‍ය සතරකි.

1. අලුත් සහල් මංගල්‍යය
2. පරණ අවුරුදු මංගල්‍යය
3 නානුමුර හෙවත් අලුත් අවුරුදු මංගල්‍යය
4. කාර්තිි මංගල්‍යය

පාරම්පරික පිළිගැනීම යි. නානුමුරය සඳහා අවුරුදු චාරිත්‍රවල දී හිසතෙල් ගෑමට සූදානම් කරන නානුමෙන් තෙල් වර්ග හා ඇඹුල් වර්ග මිශ්‍ර කළ යුෂයක් භාවිත කෙරේ.

විහාර ගම්වලට ආඥාවක් නිකුත් කරනු ලබන්නේ අටමස්ථානාධිපති නාහිමිපාණන් ඇතුළු නිලධාරීන් රැස්ව අළුත් සහල් මංගල්‍යයට දිනය නියම කරගත් පසුව ය. ඒ අනුව රාජකාරිවලට නියමිත අය පැමිණ තොරණක් බැඳීම, පහන් අරම්බු බැඳීම, පැරණි තොරණේ සිට විහාරය දක්වා පහන් වැටක් බැඳීම කළයුතු වේ. ශ්‍රී මහාබෝධීන් වහන්සේට ආභරණ පැළඳවෙන්නේ ඉන් පසුව ය. පළමු ව බෝධීන් වහන්සේගේ කඳ රෙදිවලින් ඔතා ඒ මත ආභරණ පැළඳවීම කෙරේ. මේ සඳහා තෝරාගන්නේ මාල, වළලු හා පටි වර්ග පමණි. එසේ කරනුයේ බෝධීන්වහන්සේට අනතුරක් සිදු වේය යන හැඟීමෙනි. කිරි ආහාර ප්‍රධාන බුද්ධ පූජාවට වෙන්කිරීමෙන් අනතුරුව අටමස්ථානයට බෙදා හැරේ. එම පූජා එකම මොහොතක සිදු වේ.

**කාර්තික මංගල්‍යය :**

කාර්තික යනු කැති නැකත යි. එම නැකතින් සිදුවෙන මංගල්‍යය කාර්තික මංගල්‍යය යි. කාර්තික මංගල්‍යය කාච්චි මංගල්‍යය දරමිටි පෝය යන නම්වලින් ද හැඳින්වේ. දරමිටි පෝය නමින් හැඳින්වීමේ වැදගත්කමක් දක්නට ඇත. භික්ෂූන් වහන්සේලා අනුරපුර රාජධානිය පිරිහුණු කල විවිධ බාධක මැද ගිනි ගොඩවල් ගසාගෙන රැය පහන් කරමින් අලි ඇතුන් පලවා හරිමින් බෝධීන් වහන්සේ රැක ගත්හ. දරමිටි පෝය නමින් මෙය හැඳින්වෙන්නේ ඒ නිසා ය.

අටුවා ග්‍රන්ථවල සඳහන් වන අන්දමට බෝධීන්වහන්සේට පැන් වත්කර සංග්‍රහ කිරීමත්, මළුව පිරිසිදු කිරීමත් සෑම භික්ෂූන්වහන්සේ නමකගේ ම යුතුකමකි. සුවඳ පැන්වලින් නැවීම මල් පහන් පූජා කිරීම, මල්දම් එල්ලීම, ධජ පතාකවලින් සැරසීම සුවඳදුම් පිදීම පුන් කලස් තැබීම, ප්‍රාකාර දොරටු වේදිකා ඉදි කිරීම රන්වන් රිදීවන් වැලි බෝ මළුවේ ඉසීම, තූර්ය වාදනය, ප්‍රදක්ෂිණා කිරීම, සාධුකාර දීම හා වන්දනා කිරීම බෝධි පූජා පින්කම්වල අංග හැටියට සලකා ඇත.

අප රටට එල්ලවූ නොයෙක් උවදුරු අවස්ථාවලදී රට ආරක්ෂා වූයේ ශ්‍රී මහා බෝධීන්වහන්සේ වැනි පූජනීය වස්තූන්ගේ ආශිර්වාදය නිසායැ යි සැලකේ. මේ නිසාම අදත් රටට උවදුරු පැමිණි විට

ශ්‍රී මහාබෝධීන් වහන්සේ වෙත පූජෝපහාර පවත්වා ආශිර්වාද ප්‍රාර්ථනා කිරීම අපේ සිරිතකි.

**ක්‍රියාකාරකම් :**

1. ශ්‍රී මහා බෝධීන් වහන්සේට කෙරෙන පුදපූජා විධි නම් කරන්න.
2. ඔබේ පන්සලේ බෝධිපූජාවක් සූදානම් කරගන්නා ආකාරය පැහැදිලි කරන්න.
3. බෝධිපූජාවකදී සජ්ඣායනා කෙරෙන ගාථා හා කවි ඇතුළත් කර පොත් පිංචක් පිළියෙල කරන්න.

**පුහුණුවට :**

සුපතිට්ඨිත රට්ඨනුරාධපුරේ
සම ධිට්ඨිත දක්ඛිණ සාඛභවං
සුභ මේඝවනම්බර මේඝ නිභං
ජය බෝධිමහං පණමාමි වරං

සුත් කොට මරසෙන් ජය ලද බෝධිය
සම්බුදු දෙනෙතින් පුද ලද බෝධිය
සම්මා සම්බුදු හිමිවැනි බෝධිය
මම් නමදිමි ජයසිරි මහ බෝධිය

අවන් වැදී පත් නැළවෙන බෝධිය
සවන් නුවන් සනසාලන බෝධිය
ගිමන් නිවා සිත සනසන බෝධිය
නිවන් සුවය දෙන සිරි මහ බෝධිය

තුන් ලෝ වැසියන් නමදින බෝධිය
සත් සූත් කොට සිත් පුබුදන බෝධිය
සින් හල දීපය සුරකින බෝධිය
පන් දහසක් කල් පවතින බෝධිය

සංකල්පනාව - පූජ්‍ය පල්ලේගම හේමරතන නා හිමි

# 16. බොදු නිවසක සිරිය දකිමු

බොහෝ කලකට පසු අපි ඇඹිලිපිටියේ බාප්පලාගේ නිවසට ගියෙමු. බස්රියෙන් බැස බාප්පලාගේ වත්තට ඇතුළුවත් ම අප දුටු සරත් මල්ලි 'අම්මේ නෑයෝ එනවා'යි කියමින් පෙර මගට දිව ආවේය. ඉතින් අක්කේ සැපසනීප කොහොමද කියා පුංචි අම්මා අපේ අම්මාගේ අත අල්ලා ගත්තාය. අපි පාවහන් ගලවා නියමිත ස්ථානයේ තබා ආලින්දයට ගොඩවීමු. "බුදුසරණයි දෙවි පිහිටයි" යන්න ගේ ඉදිරිපසින් ම සටහන් කර තිබිණි.

සාලයේ සහ ආලින්දයේ බිත්ති සරසා තිබුණේ රාමු කරන ලද පැරණි බෞද්ධ පින්තූරවලිනි. එම්. සාර්ලිස් ශිල්පියා විසින් අඳින ලද සිද්ධාර්ථ කුමාරොත්පත්තිය, සිදුහත් කුමරා කන්ථක අසු පිටින් ගොස් පැවිදිවීම, බුදුවීම, පස්වග මහණුන්ට ධර්මය දේශනා කිරීම, සම්බුද්ධ පරිනිර්වාණය වැනි පින්තූර ඒවා අතර විය. බුද්ධ වන්දනාව සඳහා වූ කුටිය විදුලි බුබුළුවලින් හා විවිධ මල්වලින් සරසා තිබිණි. නිවසේ ඇති සුන්දර ම ස්ථානය වූයේ ද එයයි.

තේ පානයෙන් පසු අපි ඔබමොබ ඇවිද්දෙමු. නිවස තුළ කැසට් රේඩියෝවක්, රූපවාහිනියක්, පරිගණක යන්ත්‍රයක් දක්නට ලැබුණ ද ඒවා ක්‍රියාවිරහිතකර තිබිණි. අපි මේ ගැන ලොකු මල්ලීගෙන් විමසුවෙමු. "අයියේ අපේ ගෙදර මේ හැම භාණ්ඩයක් ම භාවිත වන්නේ අවශ්‍ය වේලාවට පමණ යි. ඒවායේ හඬත් නිවසට සීමා කරලයි කියෙන්නේ. අපි කථා බහකරන්නෙත් ගෙදර අයට ඇහෙන්න විතරයි. අයියේ අපේ බුදුහාමුදුරුවෝත් අල්ප ශබ්දතාව අගය කළානේ. "ඒ වදන් පෙළ කියවනවාත් සමඟ මම අපේ මල්ලි දෙස බැලිමි." මන්ද අපේ මල්ලීත් ඝෝෂාකාර, කටකාර, ශබ්දයට වඩාත් කැමති අයකු වන බැවිනි.

අපි පොඩි මල්ලීත් සමඟ ඔහුගේ කාමරයට පිවිසුනෙමු. මල්ලි ඇඟිල්ල දිගුකළේ බිත්තියේ වූ චිත්‍රයකට ය. එය හඳුන්වා තිබුණේ "බුදුරැසින් දිලෙන බොදු නිවසක්" යනුවෙනි. ගෙවත්තේ ඇති මල් හා පැළෑටි ගෙන එය සකසා ඇත. ලිවීමට හා කියවීමට ගන්නා පොතපත රාක්කය සහ මේසය මත තබා ඇත්තේ ක්‍රමවත් පරිදි ය.

නිවස තුළ ඇඳුම් පැළඳුම් විසිතුරු බඩු බාහිරාදිය සැලැස්මකට තබා තිබේ. 'මේ තියෙන්නේ අයියේ අපේ අම්මාගේ කාමරේ' යයි

කියමින් පුංචි මල්ලි සිනාසෙමින් අත දිගුකර පෙන්නුවේ මුළුතැන් ගෙයයි. පුංචි අම්මා පැරණි ක්‍රම භාවිත කර අදට ද ගැළපෙන සේ මුළුතැන්ගෙය පිළිවෙළකට සකස් කර තිබේ. 'අපි සතියකට තෙවරක් නිවසත් අවට පරිසරයත් පිරිසිදු කරන නිසා ක්‍රමවත්ව සකසන නිසා කොතැනකවත් අපවිත්‍ර දෑ නැහැ. සතුන්ගෙන් වන උවදුරුත් අඩුයි' එසේ කීවේ පුංචි අම්මා ය.

"ආ පුතාලා ගේ ඇතුලේ මොකද කරන්නේ ? පුංචි පුතා අයියලා අක්කලා එක්ක එළියට ආවනම් ඒ බාප්පාගේ හඬය. 'බාප්පේ අපි එනවා' කියමින් අපි මිදුලට ගියෙමු. ඉදලෙන් මිදුල ඇමදීම නිසා තිබුණු පොල් අත්තක රූරටා තවමත් මැකී ගොස් නැත. 'මේ තරම් ලස්සනට ක්‍රමවත්ව මිදුල අතුගෑවේ පුංචි අම්මා ද නැත්නම් අක්කාදැ'යි මම ඇසීමි. "ඔය ළඟම ඉන්නේ" මල්ලි පෙන්වමින් පුංචි අම්මා පැවසුවා ය.

"ගෙබිමත් මුළුතැන්ගෙයත් මිදුලත් අතුගෑමෙන් එකතු වන කුණුරොඩුවලින් තමයි අපි මේ කාබනික පොහොර හදාගෙන තියෙන්නේ අපි මල්වලට, එළවළුවලට බෙහෙත් පැළවලට යොදන්නේ ඒ පොහොරයි". එසේ පැවසුවේ අක්කා ය.

කොළ දිග වැලක් දැක මේ වැල කුමක්දැයි මල්ලි ඇසුවේය. ඒ තමා පුතා 'හාතාවාරිය' බාප්පාගේ පිළිතුර විය. 'පුතේ මේ කොළවලින් අපි ඔසුකැඳ සකස් කර ගන්නවා. ඔසුකැඳ, ඔසුපැන් බීවාම ආයු වර්ණ සැප බල වැඩෙනවා වගේම සිතීමේ ශක්තියක් වැඩිවෙනවා. මේ ඉඟුරු, කහ, දෙහි, කෝමාරිකා, කරපිංචා වගේ බෙහෙත් පැළෑටි වවන්නේ අපටත් අන් අයටත් ලෙඩක් දුකක් හැදුනාම ප්‍රයෝජනයට ගන්න.' ඒ විස්තරය බාප්පාගෙනි.

'බාප්පලා ගෙදරත් වත්තත් මිදුලත් ලස්සනට තබාගෙන තියෙනවානේ.' 'ඔව් පුතේ ගෙදර වත්ත පිරිසිදුව ලස්සනට පවත්වාගෙන යෑම බෞද්ධ පිළිවෙත යි. නිවස, ගෙමිදුල, ළිඳ, වැසිකිළිය, ඇඳුම්පැළඳුම්, ආහාරපාන, පොතපත, සෞඛ්‍යය රැකෙන පරිදි පිරිසිදුව තබා ගැනීම හරි වැදගත්. ආහාර ගැනීමේ දී හොඳ පුරුදු ඇති කර ගන්නත්, ක්‍රියාශීලි ජීවිතයකට හුරුවන්නත් හැකිනම් හැමදා ම පිරිසිදුව නීරෝගීව සතුටින් ජීවත් වෙන්න පුළුවන්" බාප්පාගෙන් අපට ලැබුණේ මහඟු උපදේශයකි.

'අයියේ අන්න ලේනෙක් එනවා.' හදිසියේ ම නංගී කෑගැසුවා ය. 'නංගී සද්ද කරන්න එපා. දෙන්නයි දෙන්න'යි කියමින් අක්කා ද ටිකක් ඈතට වූවා ය. ලේනුන් නිදහසේ කුරුලු ලැල්ලට වී කෑම කන හැටි සතුටින් අපි බලා සිටියෙමු. සුරතල් සතුන් කුඩු කර ඇතිකිරීමට ගෙදර අය අකැමැති බව ඔවුනගේ කථාබහෙන් හෙළිවුණි.

ඔසුපැන් බීම සඳහා අපේ අම්මා අපට කථා කළාය. ඔසුපැන් පානයෙන් පසු රාත්‍රි ආහාර පිළයෙල කිරීමට අපි අපේ අම්මාටත් පුංචි අම්මාටත් උදව් වුනෙමු. පසුව අපි බුද්ධ වන්දනාවට අවශ්‍ය මල් නෙළුවෙමු. අත්තම්මා පහන් වැටි අඹරා දුන්නාය. රාත්‍රි ආහාර පිළියෙල කර අවසානයේ සියල්ලෝ ම මුහුණකට සෝදාගෙන බුද්ධ වන්දනා කෙළෙමු. බුද්ධ වන්දනාව අවසන් වූයේ කරණීයමෙත්ත සූත්‍රය සජ්ඣායනා කර දෙවියන්ට පින්දීමෙනි. ඉන් අනතුරුව අප කළේ අත්තම්මාට වැඳීම ය. අම්මාට තාත්තාට බාප්පාට සහ පුංචි අම්මාට ද අපි වැන්දෙමු. බුද්ධ වන්දනා කටයුතු අවසන් වූ පසු අත්තම්මා උපදේශාත්මක කථාවක් කළාය.

"දරුවනේ, අද මට ඉතාම සතුටු දිනයක්. දූදරු, මුනුබුරු, මිනිබිරියන් එකට එකතු වෙලා ඉන්නවා දැක්කම මට මගේ පුංචි කාලේ මතක් වුණා. අපි ඒ කාලෙත් සිටියේ මේ වගේ. අපේ මහගෙදර තිබුණු ඒ සිරිත් විරිත් අදටත් අපේ පුංචි පුතා හොඳට ආරක්ෂා කරනවා. අපේ දරුවන් කවදාකවත් අනුන්ගේ දෝෂ දර්ශනයට ලක්වෙලා නැහැ. ඒ දරුවන් තුළ තිබුණ විනීතකම, පිරිසිදුකම, චාම් බව, තැනට හා අවස්ථාවට ගැළපෙන ඇඳුම් පැළඳුම් භාවිතය සහ ගුණ නුවණින් යුතුව ක්‍රියා කිරීම නිසා. මෙලෙස ජීවත් වෙන විටයි, අපේ බෞද්ධකම රැකෙන්නේ", අත්තම්මා අපට දුන් අවවාද අනුශාසනා පිළිගත් බව සතුටින් ප්‍රකාශ කළෙමු.

රාත්‍රි ආහාරයෙන් පසු ටික වේලාවක් සතුටු සාමීචියේ යෙදීම අපේ නිවෙස්වල සිරිත ය. අපේ පාසල් කටයුතු ගැන දෙමාපියන් විමසා බලන්නේ ද මේ වේලාවේ ය.

පසුව දා දහවල් එකට පමණ 'දැන් ගෙදර යන්න හොඳ වේලාව නේද?' යි තාත්තා අම්මාට සිහිපත් කළේය. අපි අත්තම්මාටත් බාප්පාටත් පුංචි අම්මාටත් අක්කාටත් දණ ගසා වැන්දෙමු. ඔවුහු අපට තෙරුවන්සරණ පැතුහ. බාප්පලාට ද තෙරුවන්සරණ පැතූ අපි නිවස බලා පිටත්වුණෙමු.

**ක්‍රියාකාරකම් :**

1. මෙම පාඩමෙන් මතුකෙරෙන බෞද්ධ නිවසක ලක්ෂණ හතරක් ලියා දක්වන්න.
2. මෙම පාඩමට අදාළව කවි දෙකක් නිර්මාණය කරන්න.
3. මෙම පාඩමේ සඳහන් ඔබේ සිත්ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.
4. බෞද්ධ නිවසක ප්‍රදර්ශනය කිරීමට සුදුසු ආදර්ශ පාඨ හතරක් ලියන්න.

# 17. සිව්සස් හැඳින ගනිමු

එදින ඇසළ පුණු පොහෝදා ය. සැඳෑ සමය එළඹිණි. හිරු බැස ගියේ ය. පුන්සඳ නැගී එන්නට විය. ඉසිපතනය ද සඳ එළියෙන් සෝභාවත්ය. පස්වග තවුසෝ සඳ එළිය පතිත වූ තැනක රැස්වූහ. බුදුරජාණන් වහන්සේ අනූපමේය බුද්ධ විලාසයෙන් යුතුව අසුනෙක වැඩහුන් සේක. බොහෝ දිව්‍ය බ්‍රහ්මයෝ ද එතැනට රැස් වූහ.

පස්වග තවුසන්ට බුදුරජාණන් වහන්සේ තම ප්‍රථම ධර්ම දේශනය වූ දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කළ සේක. තමන් වහන්සේ අවබෝධ කළ නව දර්ශනය එහි ඇතුළත් ය. එනම් චතුරාර්ය සත්‍යයයි. ආර්ය සත්‍ය සතරයි. එම සතර මෙසේය.

1. දුක්ඛ ආර්ය සත්‍යය
2. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය
3. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය
4. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය

චතුරාර්ය සත්‍යය බුදුදහමේ මූලික ඉගැන්වීමකි. සසර ගමන නවතා දුක් නැති කර නිවන් සුවය ලබා ගත හැක්කේ චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීමෙනි. චතුර් යනු සතරයි. උතුම් ශ්‍රේෂ්ඨ යන තේරුම ආර්ය යන්නෙහි ඇත. සත්‍ය නම් ඇත්තයි. ශ්‍රේෂ්ඨ සත්‍ය සතර යනු චතුරාර්ය සත්‍ය යන්නෙහි තේරුමයි.

බුදු පසේබුදු මහ රහත් උතුමෝ ශ්‍රේෂ්ඨයෝ ය. උන්වහන්සේලා ආර්ය නමින් හැඳින්වෙති. ආර්ය නම් වූ බුද්ධාදි උතුමන් විසින් අවබෝධ කරගත් නිසාත් වෙනස් නොවන ශ්‍රේෂ්ඨ සත්‍ය නිසාත් මෙම සත්‍ය සතර ම ආර්ය සත්‍ය යයි කියනු ලැබේ.

ඉපදීමත්, ජරාවත්, ව්‍යාධියත්, මරණයත් අප්‍රියයන් හා එක්වීමත්, ප්‍රියයන්ගෙන් වෙන් වීමත් කැමැති දෑ නොලැබීමත් දුකය. සැකෙවින් කිවහොත් උපාදානස්කන්ධ පහ ම දුක් ය. එය දුක්ඛ ආර්ය සත්‍යය යි.

තණ්හාව නිසා සත්වයා භවයට බැඳෙයි, නැවත උපදියි, නැවත නැවතත් ජරාවට මරණයට පත් වෙයි. ඒ ඒ තැන තදින් සතුටුව දැඩිව තෘෂ්ණාවෙන් ගනී. කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා ලෙස තණ්හාව තුන් ආකාර වේ. එය දුක්ඛ සමුදය ආර්ය සත්‍යය යි. එයින් කියවෙන්නේ දුක ඇතිවීමේ හේතුව යි.

ජාති ජරා ආදි දුක් ඇති වන්නේ තණ්හාව නිසා ය. ඒ සියල්ල සම්පූර්ණයෙන් නැතිවන්නේ තණ්හාව දුරු කළ විට ය. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය නමින් හැඳින්වෙන්නේ එය යි.

දුක නැති කිරීම සඳහා වූ මග මැදුම් පිළිවෙත යි. එය හැඳින්වෙන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය නමිනි. සම්මා දට්ඨි ආදී වශයෙන් එහි අංග අටකි. එය දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය යි. එනම් දුකෙන් මිදීමේ මගයි.

චතුරාර්ය සත්‍යයෙන් දැක්වෙන්නේ අප කාටත් පොදු වූ දුක කුමක් ද එහි හේතුව කුමක් ද එම දුකෙහි අවසානය නම් කුමක් ද ඒ සඳහා අනුගමනය කළ යුතු මාර්ගය කුමක් ද? යන මෙම සතර කරුණු පිළිබඳව යි.

මෙම චතුරාර්ය සත්‍යය බොරු යයි දෙව් බඹුන් සහිත කිසිවෙකුට කිසි කලෙකත් බැහැර කළ හැකි නොවේ. ඒවායේ සත්‍යතාව සදාකාලික ය. ලෝකයේ සදහට ම වෙනසකට පත්නොවී පවත්නා ශ්‍රේෂ්ඨ වූ සත්‍යයි. එහි හේතුඵල දහම ගැබ් වී තිබේ. එය අදාළ කරගත හැක්කේ මිනිසාගේ සසර දුකෙහි පැවැත්ම හා නැවැත්ම යන කරුණුවලට පමණක් නොවේ. එදිනෙදා ජීවිතයේ විවිධ ගැටලු විසඳා ගැනීම උදෙසා ද චතුරාර්ය සත්‍යය තුළ ඇතුළත් හේතු ඵල ක්‍රමය උපයෝගි කරගත හැකි ය.

1. ගැටලුව (දුක)
2. ගැටලුවට හේතුව (දුකට හේතුව)
3. ගැටලුවට විසඳුම (දුක නැතිවීම)
4. ගැටලුව විසඳීමේ මග (දුක නැතිවන මග)

පළමුව පවතින තත්ත්වය (දුක) අප තේරුම් ගතයුතු ය. එසේ වන්නේ ඇයිදැයි (දුකට හේතුව) අනතුරුව වටහා ගත යුතුය. ඊළඟට ඒ තත්ත්වයෙන් මිදීම (දුක නැතිවීම) ගැනත් ඒ සඳහා අනුගමනය කළයුතු පිළිවෙත (දුක නැති කෙරෙන මග) ගැනත් අවධානය යොමුකළ යුතු වෙයි.

වෛද්‍යවරයා රෝගියකු සුවපත් කරන්නේ ද මෙම මූල ධර්මයෙහි පිහිටා ය. පළමුව හෙතෙම රෝගය තේරුම් ගනී. දෙවනුව එම රෝගය ඇතිවීමට හේතු සොයා බලයි. එම හේතු ඉවත් කළ විට රෝගය

සුවවෙන බව දකියි. ඒ සඳහා ගතයුතු ප්‍රතිකාර දක්වයි. ජීවිතයේ ඕනෑම ගැටලුවක් ප්‍රශ්නයක් නිරාකරණය කර ගැනීමට මෙම ක්‍රම වේදය උපකාර කරගත හැකි ය.

සසර දුක් නැතිකර ගැනීම, නිවන් සුවය ලබා ගැනීම, තමා පිළිබඳවත් ලෝකය පිළිබඳවත් නිසිලෙස තේරුම් ගැනීම, ජීවිතයේ එදිනෙදා ගැටලු විසඳා ගැනීම, දුක් කම්කටොලුවලට සාර්ථකව මුහුණ දීම වැනි ප්‍රයෝජන රැසක් චතුරාර්ය සත්‍යය පිළිබඳ හැදෑරීමෙන් හා ක්‍රමානුකූලව අවබෝධ කර ගැනීමෙන් ලබාගත හැකි ය.

**ක්‍රියාකාරකම් :**

1. චතුරාර්ය සත්‍යය නිවැරදිව නම් කරන්න.
2. චතුරාර්ය සත්‍යය මූලධර්මයක් ලෙස ගෙන, එදිනෙදා ජීවිතයේ ඇතිවන ගැටලු විසඳා ගන්නා ආකාරය ගැන ගුරුතුමා සමග සාකච්ඡා කරන්න.
3. දුකට පත්වූවන්ට අප පිහිට විය යුත්තේ ඇයි දැයි පැහැදිලි කරන්න.

**භාවිතයට :**

දුක්ඛං දුක්ඛසමුප්පාදං - දුක්ඛස්සච අතික්කමං
අරියඤ්චට්ඨංගිකං මග්ගං - **දුක්ඛූපසමගාමිනං**

ඒතං ඛෝ සරණං ඛේමං - ඒතං සරණමුත්තමං
ඒතං සරණමාගම්ම - සබ්බ දුක්ඛා පමුච්චති

# 18. මෑත කාලීන යුගකාරක තෙරවරු

රට දැය සමයට අමිල සේවයක් සිදු කොට වදාළ ජාතියේ මුර දේවතාවුන් වහන්සේලා ලෙස සැලකෙන, ජාතික වශයෙන් පිදුම් ලබන මහතෙරුන් වහන්සේලා රැසකි. උන්වහන්සේලා අතරින් තෝරාගත් තෙනමකගේ ජීවන තොරතුරු මෙම පාඩමට ඇතුළත් වේ. ඒ වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මාහිමි, වැලිතර අඹගහපිටියේ ඤාණවිමලතිස්ස මාහිමි සහ අඹගහවත්තේ ඉන්දාසභවරඤාණසාමි මාහිමි යන තිදෙනා වහන්සේ ය.

## වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මාහිමි :

සෙන්කඩගල යුගය වූ කලී ලක් ඉතිහාසයේ හැමකිත් ම පිරිහීමක් ජනිත කළ කාලයකි. යුරෝපීය ජාතීහු මෙරට පාලනය කළෝ ය. ඔවුහු බෞද්ධයෝ නොවූහ. ඔවුන්ගෙන් සිංහල බෞද්ධයාට ත් භික්ෂූන් වහන්සේට ත් හිරිහැර තර්ජන ඇතිවිණ. මෙලෙස මෙරට ඇතිවූ අතිප්‍රබල සමාජ පරිහානිය නිසා පන්සල් පිරිහුණේය. උපසපන් භික්ෂූන් වහන්සේ විරල වූහ පන්සල්වල නායකත්වය දැරුවේ සාමණේරයන් වහන්සේලා ය. උන්වහන්සේලාට සිල්වත්කමක් හෝ උගත්කමක් නොතිබිණි. මේ නිසා ම ඒ පිරිස හැඳින්වූයේ ගණින්නාන්සේලා, ඉලේ බණ්ඩාර ආදී නම්වලිනි. මේ අගාධයෙන් සසුන බේරා ගැනීමට සමතෙක් එකල නොවීය. එබැවින් මේ යුගය අභාග්‍යසම්පන්න අඳුරු කාලයක් ලෙස ඉතිහාසගතව ඇත.



වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මාහිමි

ජාතියේ හා ශාසනයේ පිනට උඩරට තුම්පනේ වැලිවිට නම් ගමේ කුලතුංග බණ්ඩාර නම් දරුවෙක් උපන්නේය. උපතින් ම මහ පුණ්‍යවන්තයකු වූ හෙතෙම කුඩාකල සිට ම සැදැහැවතකු විය. නිතර පන්සිල් රැක්කේය. පොහෝ දින අටසිල් සමාදන් විය. සොළොස්වන වියේ දී කුලතුංග බණ්ඩාරයෝ සූරියගොඩ විහාරයේ දී වැලිවිට සරණංකර නමින් පැවිදි බව ලැබූහ.

පැවිදි ජීවිතයට අවශ්‍ය ධර්මශාස්ත්‍ර ඥානය ලබා ගැනීම පවා එකල අසීරු විය. එහෙත් උන්වහන්සේ ගුරුවරුන් සොයා ඈත පෙදෙස්වලට ගොස් ඉගෙනීමට උනන්දු වූහ. බාලාවතාරය නම් පාලි ව්‍යාකරණ පොතේ මුල් කොටස ඉගෙන ගත්තේ එකල මහකෙහෙල්වල සිරගත ව සිටි ලේවිකේ රාළ නම් ගුරුවරයාගෙනි. ඉතිරි කොටස උගත්තේ පල්කුඹුරේ අත්ථදස්සි සාමණේරයන් වහන්සේගෙනි. මෙසේ මහත් වෑයමින් ධර්මශාස්ත්‍ර උගත් සරණංකර හිමියන් සමඟ ශාස්ත්‍රාභිලාෂී ගිහි පැවිදි බොහෝදෙනා එක් වූහ. කල් යාමේදී "සිල්වත් සමාගම" නමින් ප්‍රකට වූයේ එම පිරිස ය. ඍසුකාලීන ව උඩ, පහත දෙරට ශාස්ත්‍ර උන්නතිය ඇති කළ ශ්‍රේෂ්ඨ පඬිවරුන් බිහිවූයේ මේ සාමාගම තුළිනි.

ඉගෙනීමට කැමැති අයට උදව් කිරීමට සරණංකර හාමුදුරුවෝ සිංහල හා පාලි පොත් ලිවීමට පටන් ගත්හ. උන්වහන්සේ විසින් ලියන ලද ප්‍රසිද්ධ ග්‍රන්ථයක් නම් සාරාර්ථ සංග්‍රහය යි. එය ලියා ඇත්තේ සත්ථා යන බුදු ගුණය විස්තර කිරීමට යි. සිදත් සඟරාව, රූපමාලා සන්නය සතර බණවර සන්නය, මුනිගුණාලංකාරය හා එළු බෝධිවංශය ද උන්වහන්සේ විසින් සංස්කරණය කරන ලද පොත් අතර වේ.

ශික්ෂාකාමී අල්පේච්ඡ ජීවිතයක් ගත කිරීමට රුචි වූ වැලිවිට සරණංකර හාමුදුරුවන් පැවිදිවූ දා සිට ම යැපුනේ පිඩුසිඟා යාමෙනි. උන්වහන්සේ "පිණ්ඩපාතික සරණංකර හිමි" නමින් හැඳින්වූයේ එ බැවිනි. ගමින් ගමට වඩිමින් දහම් දෙසමින් අසරණයන්ට පිහිට වූ බැවින් "අසරණ සරණ සරණංකර හිමි" යනුවෙනුත් උන්වහන්සේ ප්‍රචලිත වූහ. කාගේත් ගෞරවාදරයට පාත්‍ර වූ නිසාම ගණින්නාන්සේලා උන්වහන්සේට වෛර කර අභූත චෝදනා ගොඩනැගූහ. ඔවුනගේ කේලාම් ඇසූ නරේන්ද්‍රසිංහ රජතුමා විසින් සරණංකර සාමණේරයෝ ලග්ගලට පිටුවහල් කරනු ලැබූහ. එහෙත් ඒ කිසිවකින් උන්වහන්සේ කම්පා වූයේ නැත. ඉන්ද්‍රඛීලයක් සේ නොසෙල් වී සිටියහ.

මේ කාලයේ දී සංස්කෘත භාෂාව කථා කරන ඉන්දියානු බමුණු පඬිවරයෙක් මහනුවර රජ වාසලට පැමිණියේ ය. ඔහු හා කථා කළහැකි කිසිවෙක් රජ සබයෙහි නොවීය. රජතුමා පණිවිඩ යවා සරණංකර හිමියන් රජ වාසලට වැඩමවා ගත්තේ ය. පඬිවරයා

සරණංකර හාමුදුරුවන්ගේ පාණ්ඩිත්‍යය ගැන ප්‍රශංසා කළේය. රජතුමා ඇතුළු පිරිස ද උන්වහන්සේ කෙරෙහි පැහැදුණෝය.

පනස්විය ඉක්මවූවත් සරණංකර හාමුදුරුවෝ තවමත් සාමණේර නමකි. මෙතෙක් උන්වහන්සේට උපසම්පදාව ලබාගත නොහැකි වූයේ උපසපන් භික්ෂූන් වහන්සේ එකල සිරිලක නොසිටි බැවිනි. සරණංකර හාමුදුරුවෝ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ උදව් ඇතිව දූත පිරිසක් සියම් රටට (තායිලන්තයට) යැවූහ.

සියම් රජතුමා උපාලි මහතෙරුන් වහන්සේ ප්‍රමුඛ උපසම්පන්න භික්ෂූන් වහන්සේ විසි නමක් ලක්දිවට එවීය. සරණංකර හාමුදුරුවන්ට පළමුවැන්නා ලෙස උපසම්පදා විය හැකිව තිබුණද උපසම්පදා වූයේ පළමුවැන්නා ලෙස නොවේ. මගෙනුත් වැඳුම් ලබන්නට අයකු සිටිය යුතුය යන අනතිමානී සිතිවිල්ල නිසා පසුව අධිශීලයෙහි පිහිටියහ. මේ දක්වා පවතින ස්‍යාමෝපාලි මහානිකාය නමින් හැඳින්වෙන භික්ෂු පරපුර ශ්‍රී ලංකාවේ ඇතිවූයේ මෙම උපසම්පදාවත් සමඟ ය. එම නිකායේ නිර්මාතෘ වරයා වනුයේ ද වැලිවිට සරණංකර මාහිමිපාණන් වහන්සේ ය.

එදා විසූ භික්ෂූන් වහන්සේලා අතර උගත්කමින් ගුණනුවණින් හා ශික්ෂාකාමිත්වයෙන් සරණංකර හිමියන්ට වැඩි කෙනෙක් නොවී ය. එබැවින් කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා උන්වහන්සේට සඟරජ පදවිය පිරිනැමීය. සඟරජ පදවිය ලැබීමත් සමඟ ම උන්වහන්සේ "උඩඟු නොව මහණ" යන වැකිය තල්පතක තෙවරක් ලියා වැඩ වසන කුටියෙහි එල්ලා තැබූහ. උන්වහන්සේ තුළ පැවැති නිරහංකාර බව, අනතිමානී ගුණය මින් ප්‍රකට වේ.

අනුරාධපුරය, පොළොන්නරුව, දඹුල්ල ආදී නගරාශ්‍රිතව පැවති පැරණි බෞද්ධ විහාර නැවත පිළිසකර කර පූජා පැවැත්වීමට හැකිවූයේ උන්වහන්සේගේ උනන්දුව නිසා ය. මහනුවර ඇසළ පෙරහැරට දළදා මාළිගාවේ පෙරහැර එක්කරන ලද්දේ ද උන්වහන්සේගේ උපදෙස් පරිදිය. උන්වහන්සේ කළ ලෝකශාසනික සේවා සදානුස්මරණීය වේ. අද පවතින ධර්මශාස්ත්‍ර පුනරුද්දීප්තියේ ආදි කර්තෘවරයාණන් වහන්සේ වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ ය.

## අඹගහපිටියේ ඤාණවිමල තිස්ස මාහිමි

සියම් මහනිකාය පිහිටුවීමේ දී සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේට යම් ගෞරවයක් හිමිවන්නේ නම් ඊට නොදෙවෙනි ගෞරවයක් අමරපුර නිකාය පිහිටුවා වදාළ ඤාණවිමල තිස්ස නාහිමිපාණන් වහන්සේට ද හිමි වේ.

වැලිතර මහකරාව ගමේ කරෝලිස් ද සිල්වා මහතාගේ සහ මදලේනා මහත්මියගේ වැඩිමහල් පුතණුවන් වූ උන්වහන්සේ වැලිවිට සංඝරාජයන් වහන්සේ වෙතින් පැවිද්ද ලබා ගත්හ. මාතර බෝවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ ගුරුවරයා විය. පැවිදි වීමෙන් පසු වර්ෂ හතක් සඟරජ හිමියන්ගෙන් ධර්මවිනය හා පාළි භාෂාව හදාළ ඤාණවිමල සාමණේරයෝ ආපසු තම ගම් පියසට වැඩම කළහ. ශාසනික සේවය කළේ අඹගහපිටිය විහාරයේ හෙවත් වර්තමානයෙහි වැලිතර අම්බරුක්ඛාරාම මූලමහාවිහාරයේ වැඩ වෙසෙමිනි. එකී විහාරයට මඳක් දුරින් පුෂ්පාරාම නමින් විහාරයක් කරවාගෙන එහිද වරින් වර වැඩ විසූහ. එයට පුෂ්පාරාමය යන නම තබන ලද්දේ මහනුවර මල්වත්තේ පුෂ්පාරාමයට ගරු කරනු පිණිස ය. එයින් පැහැදිලි වන්නේ උන්වහන්සේගේ කෘතවේදී භාවය යි. අද වැලිතර නායක පන්සල නමින් හැඳින්වෙන්නේ එම පුෂ්පාරාමය යි.



අඹගහපිටියේ ඤාණවිමල තිස්ස මාහිමි

තිස් හැවිරිදි ඤාණවිමල ස්වාමීන් වහන්සේගේ බලවත් කැමැත්ත වූයේ සියම් රටට වැඩම කර උපසම්පදාව ලබා ගැනීමට ය. සඟරජ මාහිමියන්ගෙන් සහ බෝවල හිමියන්ගෙන් අවසර ලබාගෙන සියම බලා පිටත්වූ නමුත් අතර මගදි පැමිණි බාධක නිසා සියම් දේශයට යන ගමන වෙනස් කොට බුරුම රට බලා වැඩම කළහ.

බුරුමයේ අගනුවර වූ අමරපුරයේ දී එරට රජතුමන් විසින් මහත් හරසරින් පිළිගනු ලැබූ ඤාණවිමල ස්වාමීන් වහන්සේ ප්‍රධාන

පිරිස ඤාණාභිවංස ධම්ම සේනාපති, මහා ධම්මරාජාධි රාජගුරු සංඝරාජයන් වහන්සේ වෙත කැඳවාගෙන යන ලදහ. වසර කීපයක් උන්වහන්සේ වෙතින් ධර්මවිනය හදාළ ඤාණවිමල ස්වාමීන් වහන්සේ අනෙක් පස් නම ද සමඟ උපසම්පදාව ලැබ ආපසු ලක්දිවට වැඩම කළහ. උන්වහන්සේගේ ඊළඟ කාර්යය වූයේ බුරුම ජාතික අග්ගසාර මහා ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් මාදු ගඟේ බලපිටි මෝදර උදකුක්ඛේප සීමාවේ දී උපසම්පදා විනය කර්මයක් සිදුකිරීම යි. ඒ සමඟ ම බුරුමයට සම්බන්ධ භික්ෂු පරපුරක් මෙරට ඇති විය. එකල එය හඳුන්වන ලද්දේ අමරපුර සමාගම නමිනි. එහි ප්‍රධානත්වයට පත්වූයේ වැලිතර අඹගහපිටියේ ඤාණවිමල ස්වාමීන් වහන්සේ ය.

"මහාධම්ම රාජාධිරාජගුරු" යන ගෞරව නාමය සහිත ව මහානායක පදවිය බුරුම සංඝරාජයාණන් වහන්සේ විසින් ඤාණවිමල ස්වාමීන් වහන්සේට පිරිනමන ලදි. ඒ පිළිබඳ අක්තපත්‍රය උන්වහන්සේ වෙත පිරිනැමූ එඩ්වඩ් බාන්ස් ශ්‍රී ලංකා ආණ්ඩුකාරවරයා එම මහානායක පදවිය රජය පිළිගත් පදවියක් බවට පත් කෙළේය.

ලක්දිව අමරපුර නිකාය සුපේශල ශික්ෂාකාමී ආදර්ශවත් භික්ෂූන් වහන්සේගෙන් යුක්ත වූ භික්ෂු සංවිධානයක් බවට පත් කිරීම උන්වහන්සේගේ පරමාභිලාෂය විය. සම්බුද්ධසසුනේ සුරක්ෂිතතාව වෙනුවෙන් ඤාණවිමල තිස්ස නාහිමියන් විසින් දරන ලද ප්‍රයත්නය දැඩි නියං සමයක ඇදහැලුණ මහා වැස්සක් මෙන් විය.

තරුණ සාමණේර හිමිවරුනට උපසපන් වීමට අවස්ථාව සැලසූ උන්වහන්සේ විනයානුකූලව මහණ දම් පුරනු කැමැති සැමට කිසිදු භේදයකින් තොරව ඒ සඳහා ඉඩකඩ සලසා දුන්හ. ඤාණවිමල මාහිමිපාණන් වහන්සේ කළ උදාර සේවාවකි කිතු දහම පැතිර පැවති මුහුදුබඩ පෙදෙස්වල බුදුදහම ප්‍රචලිත කිරීම. එදා එසේ ක්‍රියා නොකරන්නට මුහුදු බඩ පෙදෙස සම්පූර්ණයෙන් ම අන්‍ය ලබ්ධිකයන්ගේ ග්‍රහණයට ලක්වීමට ඉඩ තිබිණි. ශාසනවංශදීපය, සීමාලක්ඛණ දීපනි ආදී ග්‍රන්ථ කීපයක් උන්වහන්සේ විසින් රචනා කර ඇත.

ඉංග්‍රීසි පාලනයෙන් අනන්ත කරදර විඳි සමයක බෞද්ධ ජනතාව වෙනුවෙන් අකම්පිතව, අභීතව ඉදිරියට පැමිණි උන්වහන්සේ ජාතික වීරවරයෙකි. උන්වහන්සේගේ නොපසුබට උත්සාහයේ

ප්‍රතිඵලයක් වශයෙන් විහිදී ගිය ශාසනාලෝකය අද දක්වා ම ලක්දිව දසදෙස පැතිර පවතී.

**අඹගහවත්තේ ඉන්දාසභවරඤාණසාමි මාහිමි**

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහානිකාය නැමැති භික්ෂු පරපුරේ නිර්මාතෘවරයා වූද සුපේශල ශික්ෂාකාමී පඬිවරයෙකු වූ ද අඹගහවත්තේ සරණංකර ඉන්දාසභවර ඤාණසාමි හිමියෝ ලක් සසුනඹරේ දීප්තිමත් තාරකාවකි.



අඹගහවත්තේ ඉන්දාසභවර ඤාණසාමි මාහිමි

කුඩා කල පිලානේ ලොකු හාමුදුරුවන් වෙතින් අකුරු කළ මුන්වහන්සේ තුවක්කුගලවත්ත විහාරයේ දී අඹගහවත්තේ සරණංකර නමින් පැවිදි වූහ. ගුරුවරයා වූයේ අක්මීමන සෝභිත හිමියන් ය. සරණංකර සාමණේරයෝ බෙන්තොට අත්ථදස්සි හිමියන් වෙතින් ධර්මවිනය උගත්හ. මුන්වහන්සේ උපසම්පදාව ලැබුවේ ධම්මාභිමුනිවර ඤාණකිත්ති ශ්‍රී මාහිමියන් උපාධ්‍යාය කොට බුරුම රට රාමඤ්ඤ දේශයේ භික්ෂූන් වහන්සේ වෙතිනි.

ලක්දිව රාමඤ්ඤ නිකාය නමැති නව භික්ෂු පරපුර ආරම්භ කළ උන්වහන්සේ විශේෂයෙන් වැදගත් වන්නේ තමන් වහන්සේ තුළ පැවැති විශිෂ්ට චරිත ලක්ෂණ නිසා ය. ස්වාධීනව ස්ථිර නිගමනයකට බසින තුරු ගවේෂණශීලි වීම උන්වහන්සේගේ විශිෂ්ට ලක්ෂණයකි. සියම් සහ අමරපුර නිකායන්ට ඇතුළත් වීමෙනුත් බුරුමයේ රාමඤ්ඤ දේශයේ දී උපසම්පදා වීමෙනුත් පෙනෙන්නේ උන්වහන්සේගේ මේ ලක්ෂණය යි.

රාමඤ්ඤ මහානිකාය ව්‍යාප්තියට පමුණුවනු පිණිස පයාගල පන්සල ධර්ම ගුප්ත පිරිවෙන බවට පත් කෙරිණි. සිය නිකායේ උන්නතියට නොපසුබස්නා උත්සාහයෙන් ක්‍රියා කළ අඹගහවත්තේ මාහිමියෝ පිළිවෙත් සංරක්ෂණයට අදාළ පරිදි දසපනතකින් යුතු කතිකාවතක් සංඝ සම්මතයෙන් ඇති කළහ. දුක් ගැහැට මැද අල්පේච්ඡ ජීවිතයක් ගත කළ උන්වහන්සේගේ කීර්තිනාමය අද දක්වාම ලංකාධරණී තලය තුළ පැතිර පවත්නේ ය.

**යුග කාරක තෙරවරුන් ගෙන් ඔබේ දිවියට :**

- කුඩා කල සිට ම මැනවින් සිප් සතර හදාළයුතු බව
- ඕනෑම අභියෝගයකට අභීත ව මුහුණ දියයුතු බව
- ශික්ෂාකාමී ව, විනයගරුක ව ජීවිතය ගත කළයුතු බව
- මැනවින් විමසා බලා තීරණ ගතයුතු බව
- ඉගෙනීමේ නිසිඵල නෙලා ගතහැකි බව
- ගුණනුවණින් යුක්තවීම වැදගත් බව
- අසරණයන්ට පිහිට වීම අවශ්‍ය බව
- තමා ඉගෙනගත් දේ අන් අයට බෙදා දියයුතු බව
- ශාසනයේ ආරක්ෂාව සඳහා අපට කළහැකි දේ කළයුතු බව

**ක්‍රියාකාරකම් :**

1. ගුරුතුමාගේ උපදෙස් පරිදි මෙම පාඩමේ සඳහන් තිදෙනා වහන්සේගේ චරිත කථාවල එන ප්‍රධාන කරුණු මොනවාදැ යි වෙන වෙන ම සටහන් කරන්න.

**පුහුණුවට :**

උට්ඨානවතෝ සතිමතෝ
සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්සච ධම්මජීවිනෝ
අප්පමත්තස්ස, යසෝභිවඩ්ඪති

(ධම්මපදය - අප්පමාදවග්ග)

වෙර ඇති සිහිඇති පිරිසිදු බව ඇති
විමසා කටයුතු කරනා ගති ඇති
නිසිලෙස හික්මුණු දැහැමි දිවිය ඇති
නොපමා අයගේ යසස වැඩේ නිති

# 19. සිත් තුළ මෙත්මල් පුබුදුවමු

සාමාවතී නම් වූ ඇය කොසඹෑ නුවර කාගේත් ආදරයට ලක්වූවා ය. තම දෙගුරුන්ට මියෙනතුරා මහත් ආයාසයෙන් උවටැන් කළ ඈ දිරිය දියණියකි. පසු කලෙක උදේන රජතුමාගේ අග මෙහෙසිය බවට පත්වූයේ ද ඇය ය.

සාමාවතී බිසව බුදුරජාණන්වහන්සේ කෙරෙහි සැදැහැ ඇත්තියකි. ඇය නිතර සියල්ලන්ට ම මෙත් වැඩුවාය. සියල්ලෝ ම සාමාවතී දේවිය කෙරෙහි පැහැදුණෝ ය. මෙය නො ඉවසූ උදේන රජුගේ දෙවන බිසව වූ මාගන්දිය සාමාවතී බිසවට සහ ඇයට හිතැති සැමට වෛර කළා ය. එහෙත් සාමාවතී දේවියගේ සිරිත වූයේ මෙත්සිත පැතිරවීම යි. ඇය මෙත් වැඩුවාසේ ම අන් අය ද මෙත් වැඩීමට යොමු කළා ය. මෙත් වැඩීමේ අනුසස් ද පෙන්වා දුන්නා ය.

මාගන්දිය දිනක් සාමාවතිය සිටි මාළිගයට ගිනි තියවා ඇයත් ඇගේ පිරිසත් මරණයට පත්කළා ය. සාමාවතී ඇතුළු පිරිස ගින්නෙන් දැවෙන විටත් මෙත් වැඩූහ. මෙලොව දී සෝවන් ව සිටි සාමාවතී මරණින් පසු දෙව්ලොව උපන්නා ය. ඇය මෙත්තා විහාරී උපාසිකාවන් අතර අගතනතුරට බුදුරජාණන් වහන්සේ විසින් පත්කරනු ලැබුවා ය. මෙම කතා පුවතින් ප්‍රකට වන්නේ මෙත් වැඩීමේ අනුසස් ය.

මෛත්‍රිය නම් මිතුරු බව යි. අපට මිතුරෝ සිටිති. අපි මිතුරන් ඇසුරු කරමු. සුහද සිතින් යුතුව දුක සැප දෙකේදී ම අපට පිහිට වන්නේ අපේ කළණ මිතුරන්ය.

මිතුරුතුමෝ දුක සැප දෙකෙහි ම පැවැති
බිතු සිතුවම් රූ මෙන් පිටු නොපා විති

යහපත් මිතුරාගේ ලක්ෂණය එලෙස සිරි රහල් හිමියෝ සැළලිහිණි සංදේශයෙහි සඳහන් කරති. අවංක ව අව්‍යාජ ව සිය මිතුරාට හිතවත් වන්නේ සැබෑ මිතුරෙකි. හෙතෙම මිතුරාගේ දියුණුව දැක සතුටු වෙයි. විටෙක මිතුරාට උපකාර කරයි. තවත් විටෙක අනුකම්පා කරයි. සැපෙදීත් දුකේදීත් පිහිට වේ. මිතුරා සිය මිතුරා කෙරෙහි දක්වන මේ ආකල්පය සියලු සතුන් කෙරෙහි පැතිරවීම මෙත් වැඩීම යි.

කරණීයමෙත්ත සූත්‍රයේ සඳහන් වන්නේ මවක සිය එක ම පුතු තම ජීවිතය මෙන් රකින්නා සේ සියලු සතුන් වෙත මෙත් වැඩිය යුතු බව යි.

"සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා" යනුවෙන් සියලු සතුන්ට ම මෙත් වැඩිය යුතු යි. අපට එකවර ම සෑම සතුන්ට ම මෛත්‍රිය කළ හැකි නොවේ. බුදුරජාණන් වහන්සේ සියලු සත්වයන්ට ම එකසේ මෛත්‍රිය කළ සේක. ක්‍රෝධ සිතින් යුතු වූ දෙව්දත්, අංගුලිමාල, නාලාගිරි, චිංචා මානවිකාව වැනි අයට ද සුනීත, සෝපාක, රාහුල වැනි අයට ද සම මෙත් පැතිර වූහ. මෛත්‍රිය කිරීම දෙලෝ යහපත සලසන්නක් බව මෙත්තානිසංස සූත්‍රයේ දැක්වේ.

* සුවසේ නින්ද යාම
* සුවසේ අවදි වීම
* නපුරු සිහින නොපෙනීම
* මිනිසුන්ට ප්‍රිය වීම
* මිනිසුන් නොවන සතුන්ට ද ප්‍රිය වීම
* දේවාරක්ෂාව ලැබීම
* විපත්වලින් ආරක්ෂා වීම
* වහා සිත සමාධිගත වීම
* මුහුණ ප්‍රසන්න වීම
* සිහි ඇතිව මරණයට පත් වීම
* මෙලොව දී රහත් ඵලයට පත්නොවුවහොත් බඹලොව උපත ලැබීම

මෙවන් අනුසස් ලබාදෙන මෛත්‍රී භාවනාව පුරුදු කළ යුත්තේ අදියරෙන් අදියරට ය. මෛත්‍රී භාවනාව කිරීමට තැනක්, වේලාවක් අවශ්‍ය නැත. පාසල, පන්සල, නිවස, දුම්රිය, බස්රිය, ගුවන්යානය ආදී ඕනෑම ස්ථානයක දී මෙත් වැඩිය හැකි ය. ඔබ දහම් පාසලේ හතර සහ පහ ශ්‍රේණිවලදී මෙහි මුල් පියවර කීපයක් ඉගෙන ගෙන ඇත. අපි තව දුරටත් මෙම භාවනාව වඩන අයුරු ඉගෙන ගනිමු. හිඳීම, සිටීම, ගමන් කිරීම, නිදා ගැනීම යන සතර ඉරියව්ව ම මේ සඳහා සුදුසු ය. මෙම ඉරියව්වලින් එකක් වන සක්මන් ඉරියව්වෙන් මෛත්‍රී භාවනාවේ

යෙදෙන අයුරු මෙහි දී ඉගෙන ගනිමු. සක්මන් කරන විට බොහෝ දුර බලන්නේ නැත. වඩා ළඟම ත් බලන්නේ නැත. තම පාදයේ සිට මීටරයක් පමණ දුර ඇසේ බැල්ම රඳවා ගැනීම සුදුසු ය. දකුණු පිටිඅත්ල මත වම් අත්ල තබා ගැනීම සිරිත යි. ගැහැනු පිරිමි වශයෙන් කණ්ඩායම් කීපයකට බෙදී ගුරු උපදෙස් පරිදි භාවනාවේ යෙදෙන්න. සක්මන අරඹන තැන සිට නමස්කාර පාඨය තෙවරක් කියා තෙරුවන් සරණ යමු. දැන් අපි මෛත්‍රී භාවනාව වඩමු.

පළමු, දෙවන පියවර මීට පෙර ඉගෙනගත් පරිදි ක්‍රියාවට නගන්න.

**පියවර 3**

මම නිදුක් වෙම්වා! නීරෝග වෙම්වා! සුවපත් වෙම්වා!
මා මෙන් ම මාගේ මව්පිය ගුරුවර හිතමිතුරෝ ද
නිදුක් වෙත්වා! නීරෝග වෙත්වා! සුවපත් වෙත්වා!
සියලු සත්වයෝ නිදුක් වෙත්වා! නීරෝග වෙත්වා සුවපත් වෙත්වා!

**පියවර 4**

මම නිදුක් වෙම්වා! නීරෝග වෙම්වා! සුවපත් වෙම්වා!
මා මෙන් ම මාගේ මව්පිය ගුරුවර හිතමිතුරෝ ද
මැදහත් අය ද සියලු සත්වයෝ ද නිදුක් වෙත්වා!
නීරෝග වෙත්වා! සුවපත් වෙත්වා!

භාවනාව අවසානයේ දී වැඳගෙන තෙවරක් සාධුකාර දී පහත සඳහන් කවිය කියන්න.

කයිනුත් සුවැත්තෝ - කිසිත් උවදුරු නැත්තෝ
වෙත්වා සියලු සත්හු ම - සුවපත් වූ සිතැත්තෝ

මාගේ මේ භාවනාව මෙලොව සැනසීම පිණිසත්, පරලොව සැනසීම පිණිසත්, නිවන් සුවයෙන් සැනසීම පිණිසත් හේතු වේවා! වාසනා වේවා!! යනුවෙන් ප්‍රාර්ථනා කරන්න.

**ක්‍රියාකාරකම් :**

1. ඔබේ පන්තියේ සැමදෙනා සමඟ මිතුරුවීම නිසා ඔබටත් අන් අයටත් ලැබෙන යහපත් ප්‍රතිඵල ගැන සටහන් කරන්න.
2. "අපේ මිතුරෝ " මැයෙන් කවියක් නිර්මාණය කරන්න.

3. ඔබ මෛත්‍රී භාවනාවට කැමති වන්නේ ඇයි දැ යි කෙටියෙන් පැහැදිලි කරන්න.

**පැවරුම :**

දිනපතා රාත්‍රී නිදාගැනීමට පෙරත් අළුයම නින්දෙන් අවදි වූ පසුත් මෙත් වැඩීම පුරුද්දක් කර ගන්න.

**පුහුණුවට :**

| | |
|---|---|
| දුක්ඛප්පත්තා ච | නිද්දුක්ඛා |
| භයප්පත්තා ච | නිබ්භයා |
| සෝකප්පත්තා ච | නිස්සෝකා |
| හොන්තු සබ්බේපි | පාණිනො |
| දුක් නිදුක් | වේවා |
| සැම බය නිබය | වේවා |
| සෝක දුරු | වේවා |
| හැමට සැනසුම උදා | වේවා! |

# 20. පින් දී සෙත් පතමු

අප කළ හොඳ වැඩ අන් අය සමඟ බෙදා හදාගෙන සතුටුවීම බෞද්ධ අපගේ උතුම් ගුණධර්මයකි. පින්කමක් කර අවසානයේ දී අන් අයට පින් පමුණුවන්නේ ඒ නිසාවෙනි. පින්දීම දස පුණ්‍ය ක්‍රියාවලින් එකකි. ඕනෑම පිංකමක් කර අපි පළමුවෙන් ම පින් දෙන්නේ දෙවියන්ට ය. ඒ ඔවුන්ගේ සැප, බල වැඩිවනු පිණිස ය. මිනිස් ලොව අපට ආරක්ෂාව ලබාගනු පිණිස ය. එබැවින් අප ලබාගත් පින් රැසින් කොටසක් පුද පඬුරු ලෙස දෙවියන්ට පිරිනමමු.

එත්තාවතා ච අම්හේ හි
සම්භතං පුඤ්ඤං සම්පදං
සබ්බේ දේවා අනුමෝදන්තු
සබ්බ සම්පත්ති සිද්ධියා

මෙතෙක් අප සිදු කළ - පූජාදියෙන් රැස් කළ
පින් රැගෙන සුරකැළ - ලැබ ගනිත්වා සියලු සැප බල

ආකාසට්ඨා ච භුම්මට්ඨා
දේවා නාගා මහිද්ධිකා
පුඤ්ඤං තං අනුමෝදිත්වා
චිරං රක්ඛන්තු ලෝකසාසනං

අහසෙ හා පොළොවහි - දෙව් නා පිරිස් තෙද ඇති
සතුටු වී මෙ පිනෙන් - රකිත්වා ලෝසසුන් බෝ කල්

ගංගාවල ජලය එකතුවීමෙන් මුහුද ජලයෙන් පිරී ඉතිරී යන්නාක් මෙන් මිනිස් ලොව ඥාතීන් අනුමෝදන් කරන පින් පරලොව ගිය ඥාතීන්ට ලැබේ. දිනක් බිම්බිසාර රජතුමා බුදු පාමොක් මහ සඟනට දන් දී ඥාති ප්‍රේතයන්ට පින් පැමිණ වීය. මිය ගිය ඥාතීන් එම පින් අනුමෝදන්ව සුවපත් භාවයට පත්වූ බව දහමේ සඳහන් වේ. ඒ අනුව අපිත් පින් ගැනීමට සුදුසු පරලෝ සැපත් ඥාතීන්ට පින් අනුමෝදන් කරමු. ඒ සඳහා භාවිත කෙරෙන ගාථාව පහත දැක්වේ.

ඉදං වෝ ඤාතීනං හෝතු සුඛිතා හොන්තු ඤාතයෝ
ඉදං වෝ ඤාතීනං හෝතු සුඛිතා හොන්තු ඤාතයෝ
ඉදං වෝ ඤාතීනං හෝතු සුඛිතා හොන්තු ඤාතයෝ

මියගිය නෑයන්ට මෙ පින් රැස් හිමි වේවා
ඒ පින් බෙලෙන් නෑයෝ සැප සම්පත් ලබත්වා

අපගේ පැතුම සත්පුරුෂ ඇසුරයි. බුදුසසුන ම පවතින්නේ කළණ මිතුරන්ගෙ ඇසුරින් බව වරක් බුදුරජාණන් වහන්සේ ආනන්ද හාමුදුරුවන් වහන්සේට දේශනා කළ සේක. එම සත්පුරුෂයා හෙවත් කළණ මිතුරා හැඳින ගනිමු.

අනුන් විසින් තමාට කරන ලද උදව් උපකාර දනීද. එම උපකාර කළ අයට නැවත උපකාර කෙරේද, නුවණැත්තේද, හොඳ මිතුරෙකු වේද, මිතුරනට මහත් භක්තියක් ඇත්තේද, දුකට පත් මිතුරාගේ දුක තමාට වූ දුකක් ලෙස සිතා මිතුරා දුකින් මුදවා ගැනීමට ක්‍රියා කෙරේද, එබඳු ගුණ ඇත්තා සත්පුරුෂයා වේ. නිවන් දක්නා ජාති දක්වාම එවන් සත්පුරුෂ ඇසුරක් අපි ප්‍රාර්ථනා කරමු.

ඉමිනා පුඤ්ඤකම්මේන
මා මේ බාල සමාගමෝ
සතං සමාගමෝ හෝතු
යාව නිබ්බාන පත්තියා

සිදුකළ මේ පිනෙන් - දුදන ඇසුරක් නොමැතිව
නිවන් දකිනා තුරු - සුදන ඇසුරම වේවා.

රජතුමාගේ ප්‍රධාන වගකීමකි, සසුන රැකීම හා ජනතාව රැකීම. මේ නිසා ම අපේ බෞද්ධ රජවරු දසරාජ ධර්මයෙන්, සතර සංග්‍රහ වස්තුවෙන් යුතුව සතර අගතියෙන් තොරව රජකම් කළහ. රජතුමා අදිමිටු වුවහොත් රටේ වැසියන් ද එසේවන බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. එබැවින් රජවරුන් ආදර්ශ සම්පන්න විය යුතුය. බෞද්ධ රජවරු තමන් ධාර්මිකව වෙසෙමින් රටවැසියා ද ධර්මයෙහි යෙදවීමට ක්‍රියා කළෝ ය. මෙමගින් රටේ සශ්‍රීකත්වය ඇතිවේ. නිසි කලට වැසි ලැබේ. එදා මෙදාතුර පින්කමක් සිදුකර අප ප්‍රාර්ථනා කරන්නේ මෙය යි.

"දේවෝ වස්සතු කාලේන
සස්ස සම්පත්ති හෝතුච
ඵීතෝ භවතු ලෝකෝච
රාජා භවතු ධම්මිකෝ

වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ මෙන් ම පිළිම වහන්සේ තුළින් දිස්වන්නේ ජීවමාන බුදුරජාණන් වහන්සේ ය. අපි ජීවමාන බුදුරජාණන් වහන්සේ උදෙසා ආමිස පූජා ප්‍රතිපත්ති පූජා පවත්වමු. උන්වහන්සේට අපේ නොදැනුවත්කම නිසා යම් වරදක් සිදුවිය හැකිය. වැරදි කිරීමෙන් පව් සිදුවේ. එබැවින් අපි බුදුරජාණන් වහන්සේ සමා කරගනිමු.

කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං
අච්චයං ඛම මේ භන්තේ - භූරිපඤ්ඤ තථාගත

සිත කය වචනයෙන් - පමාවෙන් කළ වරදට
සම්බුදු පියාණෙනි - සමාවුව මැන මාහට

**ක්‍රියාකාරකම් :**

1. අපි පළමුව පින් අනුමෝදන් කරන්නේ කාට ද?
2. දෙවියන්ට පින් දෙනවිට දී දෑත් තබාගන්නේ කෙසේද?
3. දෙවියන්ට පින් දෙන ගාථා නිවැරදිව ලියා දක්වන්න.
4. සත්පුරුෂයකු තුළ තිබෙන ගුණාංග මොනවා ද?
5. "දේවෝ වස්සතු කාලේන" යන පාඨයේ තේරුම ලියන්න.
6. නිවැරදිව ගාථා උච්චාරණය කිරීමට පුහුණු වන්න.

**පුහුණුවට :**

යෝ වේ කතඤ්ඤූ කතවේදි ධීරෝ
කල්‍යාණ මිත්තෝ දළ්හ භත්ති ච හෝති
දුක්ඛිතස්ස සක්කච්ච කරෝති කිච්චං
තථාවිධං සප්පුරිසං වදන්ති
(සරභංග ජාතකය)

කළගුණ දනී යුතුකම් ඉටුකරලන්නේ
නුවණැති කලණ මිතුරකු ලෙස හැසිරෙන්නේ
බැතිසිත් වැඩේ මිතුරගෙ දුක් දුරලන්නේ
සත් පුරුෂයා නාමෙති ඔහු හඳුනන්නේ

## 21. පින් මල් පිපෙන - සිල් වැසි වසින කාලයක්

හයවන ශ්‍රේණිය භාර සංඝරතන ස්වාමීන්වහන්සේ අද දිනට නියමිත පාඩමට පෙර සූදානමක් හැටියට ඇසළ උත්සවය ගැන කවි කිපයක් නිර්මාණය කර ගෙන එන ලෙස පසුගිය දහම් පාසල් වාරයේ දී සිසුන් දැනුවත් කළහ. ඒ අනුව පහත සඳහන් කවි දෙක නිර්මාණය කර ශ්‍රීමාලි සහ ප්‍රභාත් පන්තියට ඉදිරිපත් කළෝය.

ශ්‍රීමාලි :- මව් කුසයේ බෝසත් පිළිසිඳ ගන්නේ
සිදුහත් කුමරු ගිහිගෙය අතහැර යන්නේ
රාහුල කුමරුවන් එදිනම උපදින්නේ
ඇසළ පෝ දිනයි මේ සේරම වන්නේ

ප්‍රභාත් :- බුදු හිමි දෙසුව "දම්සක් බණ" අසාගෙන
හිමි කොණ්ඩඤ්ඤ "සෝවන්" පල ලබාගෙන
ඇසළ මහේ මේ අසිරිය නිසාවෙන
වස් කාලයත් එළඹිණි පින් පුරාගෙන

සංඝරතන හිමි :-

බොහොම හොඳ නිර්මාණ දෙකක්, හොඳයි මේ කවි දෙකට අනුව ඇසළ පෝයදා ඇති වැදගත්කම ගැන කාටද කියන්න පුළුවන් ?. (සිසුහු එකවර ම අත් ඔසවති) අපි පළමුව බලමු තාරක කියන්නේ මොනවද කියලා.

තාරක :-

සිදුහත් කුමරු මහාමායා දේවියගේ කුසේ පිළිසිඳ ගැනීම, සිදුහත් කුමරු අභිනිෂ්ක්‍රමණය කිරීම, රාහුල කුමරුගේ උපත, බුදුරදුන්ගේ පළමුවන ධර්ම දේශනාව, කොණ්ඩඤ්ඤ තවුසා සෝවන් වීම, වස් කාලය එළඹීම.

සංඝරතන හිමි :-

බොහොම හොඳයි, තාරක පුතා කවි දෙකේ අදහස් හොඳට තේරුම් ගෙන තියෙනවා. ප්‍රභාත් පුතාගේ කවියෙන් කියවුණු වැදගත් කරුණක් තමයි ඇසළ පෝයදා වස් කාලය ආරම්භ වන බව. වස් කාලය ගැන විශේෂ සැලකිල්ලක් බෞද්ධයන් තුළ තියෙනවා. ඇසළ

පෝයදා ගමේ පන්සලට ගිහින් හාමුදුරුවන්ට දැහැත් ගොටුවක් පිළිගන්වලා, දායක දායිකාවන් පිරිනමන සිව්පසය පිළිගෙන වස් තුන් මාසයේ පන්සලේ වැඩසිටින ලෙසට ආරාධනා කරනවා.

වස් කාලය තුළ ආමිස දානයෙන් උපකාර කරන ගිහි පින්වතුන්ට භික්ෂූන් වහන්සේ ධර්ම දානයෙන් උපකාර කරනවා. මල් පූජා, බෝධි පූජා, අටවිසි බුද්ධ පූජාදියත් ධර්ම දේශනාත් පිරිත් දේශනාත් පවත්වනවා. සමහර පන්සල්වල මේ කාලයේ සත්සති, සූවිසි විවරණ ආදී නෘත්‍ය පූජාවනුත් සිදු කරනවා. වස් පිංකම් අවසානයේ කඨින වස්ත්‍රය පූජා කරනවා. ගමේ එකමුතුකමට, ගිහි පැවිදි සම්බන්ධතාවට දෙව්, මිනිස්, නිවන් යන සම්පත් ලබා ගැනීමට මෙම වස් කාලය බෙහෙවින් ප්‍රයෝජනවත් වෙනවා.

සංඝරතන හිමියන්ගේ අනුශාසනාවෙන් පසුව

හාමුදුරුවනේ, මෙම ඇසළ මහේ සිදුවෙන තවත් උත්සවයක් ගැන රචනාවක් ලියාගෙන ආවා, ඒකත් කියවන්න දැයි මධුසංක ඇසුවේය.

සංඝරතන හිමි :-

බොහොම හොදයි, කියවන්න.

ඇසළ සමයේ ජාතියේ ප්‍රෞඪත්වය කියාපාන පෙරහැර රැසකි. කතරගම, රත්නපුර, අලූත්නුවර, දෙව්නුවර, නවගමුව, සීනිගම වාර්ෂික පෙරහැර පැවැත්වෙන්නේ මේ කාලයෙහිය. දේවාල පෙරහැර ආරම්භ වන්නේ කප් සිටුවීමෙනි.

නුවර පෙරහැර ආරම්භ වූයේ නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි යන සිව් දේවාල මුල්කරගෙන ය. දේවාල පෙරහැරට දළදා පෙරහැර එක් කළේ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ය. දළදා පෙරහැර තරම් විසිතුරු පෙරහැරක් තවත් නැත. දෙස් විදෙස්හි සුපතළ දළදා පෙරහැර ශ්‍රී ලංකාවාසීන්ට කීර්තිය ගෙන දෙන්නකි. දින පහළොවක් පැවැත්වෙන නුවර පෙරහැරත් දේවාල පෙරහැරත් අවසන් වන්නේ දිය කැපීමේ උත්සවයෙනි. පොදුවේ ගත් කල මහනුවර ඇසළ පෙරහැර යනු අපේකම අපේ බව විදහාපාන දේශයේ මහා සංස්කෘතික මංගල්‍යයයි.

සංසරතන හිමි :-

බොහාම හොඳයි, මධුසංක පුතා බොහොම කෙටියෙන් හුඟක් කරුණු ලියලා තියෙනවා.

දුවේ, පුතේ, අපි දන්නවා අවුරුද්දේ දොළොස් මාසය අතුරෙන් ඇසළ මාසය අප රටේ විවිධ බෞද්ධ උත්සව හා පෙරහැර පැවැත්වෙන විශේෂ මාසයක් බව. ශ්‍රී දන්ත ධාතුන්වහන්සේ මුල්කොට ගෙන මහනුවර දළදා මාලිගාව ආශ්‍රිතව පැවැත්වෙන දළදා පෙරහැරට එම උත්සව අතර ලැබෙන්නේ මුල් තැනක්. සිංහල බෞද්ධ අපට ආවේණික විවිධ සිරිත් විරිත් වත්පිළිවෙත් පින්කම් ආදිය ඇසළ මාසය තුළ සිදුවෙනවා. සිංහල බෞද්ධ සංස්කෘතිය විදහා දැක්වෙන විවිධ නැටුම්, ගැයුම්, සැරසිලි සෞන්දර්යාත්මක ක්‍රියාකරකම් ආදියට මෙම උත්සවවල දී විශේෂ ස්ථානයක් හිමිවෙනවා. පෙරහැරෙන් එකමුතු කමත්, සාමූහිකව වැඩ කිරීමේ හුරුවත් කලා කුශලතාවත් වැඩිදියුණු වෙනවා. දළදා පෙරහැර සිංහල බෞද්ධ සංස්කෘතියේ සංකේතයක්. ඇසළ සමයේ පැවැත්වෙන උත්සව, පෙරහැර ආදියට සම්බන්ධ සංස්කෘතික අංග අගය කිරීමට මෙන් ම ඒවා කඩ නොකොට පවත්වාගෙන යෑම සඳහා සහාය වීමටත් අපි ද උනන්දුවෙන් ක්‍රියා කරමු.

**ක්‍රියාකාරකම් :**

1. ඇසළ උත්සවය ළමා අපට වැදගත් වන්නේ ඇයිදැ යි ලියා දක්වන්න.
2. ඇසළ මාසයේ පැවැත්වෙන විවිධ උත්සව වගුගත කරන්න.
3. ඇසළ පෙරහැරක ඔබගේ සිත්ගත් එක අවස්ථාවක් චිත්‍රයට නගන්න.

## 22. මිදුල සහ ගෙවත්ත හැඩවත් කරමු

උදෑසන බුද්ධ වන්දනාවෙන් පසුව දහම් පාසලේ කටයුතු ඇරඹිණ. හාමුදුරුවන් වහන්සේ පන්තියට වැඩියහ. එදා පන්තියේ ළමයි සුදෝ සුදට බබලන ජාතික ඇඳුමෙන් සහ ළමා සාරියෙන් හැඩවී සිටියහ. හාමුදුරුවෝ ළමයි අමතා මෙසේ වදාළහ.

"අද බොහෝම හොඳයි., කවුරුත් මගේ උපදෙස් පරිදි පිරිසිදු ඇඳුම් ඇඳගෙන ඇවිත්. ලස්සනටත් පිරිසිදුවටත් ඇඳුම් තබාගැනීම වැදගත්. ඇඳුම් වගේම අපගේ ශරීරයත් ඉතා පිරිසිදුව තබා ගන්න ඕනෑ.''

"හාමුදුරුවනේ, අපි හැමදාම නානවා" ළමයි කීහ.

ඒක හොඳයි, හැබැයි දිනපතා නෑමෙන් පමණක් පිරිසිදුකම රැකෙන්නේ නැහැ. ඒ සඳහා තවත් කළයුතු දේ තිබෙනවා. උදේ සවස දත් මැදගන්න ඕනෑ. නියපොතු වැඩෙන විට ඒවායේ විෂබීජ රැඳෙනවා, ඒවා කපාගන්න ඕනෑ. ගැහැනු ළමයි හිසකෙස් තෙල් ගා පීරා පිරිසිදුව තබා ගන්නත් පිරිමි ළමයි කොණ්ඩය කොටට කපන්නත් ඕනෑ. ශරීරය අපවිත්‍රව තිබෙනවිට ලෙඩරෝග හැදෙන නිසා පිරිසිදුව තබාගත යුතුයි. ශරීරය හැරුණු විට තවත් මෙලෙස පවිත්‍රව තබාගත යුතු තැන් තියෙනවා. ඒවා කීමට පුළුවන්දැයි හාමුදුරුවෝ ළමයින්ගෙන් විමසූහ.

"අපේ ගෙදර, මිදුල, ගෙවත්ත, ළිඳ, වැසිකිළිය" ළමයි පිළිතුරු දුන්හ.

"බොහොම හොඳයි, ගෙදර පිරිසිදු කරගන්න හැටි මාලාට කියන්න පුළුවන් ද?"

"එහෙමයි. හාමුදුරුවනේ, දිනපතා ගෙදරත් මිදුලත් අතුගෑම, කුණු රොඩු එකතුකර වළකට දැමීම, සතියකට වරක්වත් මකුළුදැල් කඩා දැමීම, ගෙබිම පිරිසිදු කිරීම, ජනෙල් දොරවල් පිරිසිදු කිරීම, නිවස වටේට මල් වැවීම" මාලා කීවාය.

"බෞද්ධයින් නිතරම ආදර්ශයට ගන්නේ භික්ෂූන් වහන්සේ ය. උන්වහන්සේලා තමන් වහන්සේලා වැඩවසන පන්සලත්, බුදුමැදුරත්, බෝමළුවත්, සෑමළුවත්, විහාර මළුවත් හොඳින් අමදිනවා. මළුපෙත්මං

ඇමදීම උන්වහන්සේලාගේ දෛනික සිරිතක්. බොහෝ විට ඉදලෙන් මිදුල අමදින්නේ සිත්ගනනා රූ රටා මවමින්. බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේ වැඩහිටි කුඩා රාහුල හාමුදුරුවෝ එලෙස මළුපෙත්මං අමදින ලද ස්වාමීන් වහන්සේ නමක්. අමදින ලද මළුවේ වැලි දෝතක් අහසට විසිකර ඒ තරමට ම අවවාද අනුශාසනා ලැබේවා යි ප්‍රාර්ථනා කළේ ද උන්වහන්සේ යි. අතීතයේ සිට ම බොදු ගිහි පිරිස භික්ෂූන් වහන්සේ අනුගමනය කරමින් තමන්ගේ නිවස ඉතා පිරිසිදුව පවත්වා ගෙන යනවා. ඔබ ද දෙමාපියන් හා සහෝදර සහෝදරයින් සමඟ එකතුව නිවස සහ අවට පරිසරය පිරිසිදුව තබා ගැනීමට උනන්දු වන්න.

මිදුල වගේ ම ගෙදරට පිවිසෙන පාරත් අතුගා පිරිසිදු කිරීම අපේ හොඳ බෞද්ධ සිරිතක්. සමහරුන් පාරට කුණු කසල දමනවා. මිනිසුන් යන එන මගට අඹ, කෙසෙල් ලෙලි ආදිය දැමීම නිසා අනතුරු ඇති වෙනවා. තම ගෙවත්තේ තැන් තැන්වල ඇති පොල්කටු, ටැඹිලි කෝම්බ, ටින් ආදී කුණු කසල එකතැනක ගොඩගසා දමන්න. පොහොර කළහැකි දෑ රැගෙන කාබනික පොහොර සකස් කරගන්න. ඔබට පුළුවන් මේ සඳහා නිවසේ අනෙක් අයගේත් සහාය ලබා ගන්න.

ඔබ පාවහන් පැළඳ ගෙදරින් බැහැරට ගොස් ආපසු එලෙසින්ම නිවස තුළට පිවිසීම සුදුසු නෑ. ඊට හේතුව පාවහන් තුළ රැඳි අපවිත්‍ර ද්‍රව්‍ය නිසා ගෙබිම අපරිසිදු වීම ය. පාවහන් ගලවා එළියේ තබා නිවසට ඇතුල්වීම හොඳ සිරිතක්.

අප බීමට හා නෑමට ජලය ලබා ගන්නා ළිඳ ඉතා පිරිසිදුව තබාගැනීමත් අවශ්‍යයි. අප පාවිච්චි කරන වැසිකිළිය, කැසිකිළිය කොතැනක තිබුණත් දිනපතා පිරිසිදු කරගන්න ඕනෑ. ඒවා පිරිසිදුව තබා ගැනීම අප සැමගේ සනීපාරක්ෂාවට හිතකරයි.

වැසිකිළි භාවිතයේ දී පිරිසිදුකමට අදාළව බුදුදහමෙහි සඳහන් වන සිරිත් කීපයක් කියා දෙන්නම්

* දත් මදිමින් මළපහ නොකිරීම.
* නියමිත ස්ථානයෙන් පිටත මළපහ නොකිරීම.
* ජලය රැස්කර තබන බඳුනෙහි හැමවිට ම වතුර පුරවා තැබීම.
* වැසිකිළිය අපිරිසිදු වූ විට සෝදා පිරිසිදු කිරීම.
* වැසිකිළිය අවට වල් පැළෑටි කැළිකසළ ආදිය ඉවත්කර ඇමදීම.

සිංහල බෞද්ධයා නිතරම උත්සාහ කරන්නේ පිරිසිදුව ජීවත්වීමට යි. පිටත පිරිසුදු බවත් ඇතුළත පිරිසිදු බවත් අගය කිරීම සිංහල බෞද්ධ ලක්ෂණය යි.

"ඇතුළත අපිරිසිදු කියන්නේ කුමක්දැ"යි ළමයි කීපදෙනෙක්ම ඇසූහ.

"ඇතුළත පිරිසිදුකම කියන්නේ සිත පිරිසිදුකර ගැනීම ය. කෙලෙස් නිසා සිත අපිරිසිදු වෙනවා. කැළිකසළ යනු අප අවට පරිසරය අපවිත්‍ර කරන දේයි. කෙලෙස් කියන්නේ අපේ සිත අපවිත්‍ර කරන ලෝභකම, අහංකාරය, තරහ, මෝඩකම ආදිය යි."

පිටත අපිරිසිදුකම නිසා ශාරීරික රෝගත් ඇතුළත අපිරිසිදුකම නිසා ශාරීරික හා මානසික රෝගත් වැළදෙනවා. අපිරිසිදු සිතක් ඇති කෙනකුට තමා අවට පරිසරය පිරිසිදුව තබා ගැනීමත් අමාරුය. පරිසරය පිරිසිදුව තිබේනම් එය අපේ මානසික දියුණුවට ද හේතු වෙනවා. එයින් අපගේ යහපත් හැදියාව ද ප්‍රකට වෙනවා.

ස්වාමීන් වහන්සේ පාඩම නිමා කළේ පහත සඳහන් ක්‍රියාකාරකම්වල යෙදෙන ලෙස පන්තියට උපදෙස් දෙමිනි.

**ක්‍රියාකාරකම් :**

1. ඔබේ නිවස, වත්ත පිරිසිදු කර ගැනීමට ඔබ ක්‍රියා කරන අන්දම ලියා දක්වන්න.
2. වත්ත පිරිසිදුව තබා ගැනීමෙන් අපට අත්වන වාසි තුනක් ලියන්න.
3. ඔබේ නිවස හා ගෙවත්ත වඩාත් පිරිසිදුව තබා ගැනීමට අදාළ ආදර්ශ පාඨ හතරක් ලියා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

**පැවරුම :**

* දෙමාපියන් සහ ගෙදර අන්අය සමඟ එකතුව කාබනික පොහොර සකස්කර ගැනීමේ ව්‍යාපෘතියක් ක්‍රියාවට නගන්න.

**පුහුණුවට :**

වත්තං න පරිපූරෙන්තෝ න සීලං පරිපූරති.
(වත් නො පුරන්නා - සිල් නො පුරයි)

# 23. පොදු දේපොළ සුරකිමු

සුචරිතෝදය දහම් පාසලේ උදෑසන රැස්වීමේ කථාව පැවැත්වීමට නියමිතව තිබුණේ හසිත නුවන් ශිෂ්‍යයාට. එදා හසිත නුවන් පැවැත්වූ කථාවයි මේ.

සියලුදෙනාගෙන් ම අවසරයි

වර්තමාන සමාජයේ ශීඝ්‍රයෙන් ඉවත්ව යන "පොදු දේපොළ සුරැකීම" ගැනයි අද මා කථා කරන්නට යන්නේ. මෙවන් කාලයක ඒ ගැන කථා කිරීමට ලැබීමත් මගේ වාසනාවක්. මං එහෙම කීවේ පොදු දේපොළවලට ජනතාවගෙන් සිදු වෙන හානිය පිළිබඳ ව මගේ හිතේ පවතින නොසතුට නිසා.

මොනවද පොදු දේපොළ කියන්නේ? පාසල්, පන්සල්, රෝහල්, රජයේ කාර්යාල, බස්රිය, දුම්රිය වැනි පොදු ප්‍රවාහන සේවා මෙ හැම එකක් ම ගැනෙන්නේ පොදු දේපොළ හැටියට. මේවාට වැය කර තිබෙන්නේ අපේම මුදල්. එහෙම නම් පොදු දේපොළ කියන්නේ අපේම දේපොළ.

පොදු දේපොළවලට කරන හානිය දැක්කම අපේ හදවතේ ඇතිවන්නෙ කිවනොහැකි තරම් වේදනාවක්. උදේ පටන් ම කාර්යාලවල විදුලි බුබුළු දල්වලා, විදුලි පංකා පැය විසිහතරේ ම වැඩ කරනවා. පොදු තැන්වල ඇති ජල කරාම විවෘත කරපු ගමන්ම යි. කලය, වතුර භාජනය ජලයෙන් පිරී ඉතිරී ගියත් ජල කරාමය වහන්නේ නැහැ. රජයේ ගොඩනැගිලිවල, ජනේල් සොයිබ, විදුලි ස්විච් ගලවාගෙන යනවා. රජයේ රෝහල්වල බෙහෙත් ද්‍රව්‍ය ඇතැම් අය සොරා ගන්නවා. රජයේ වාහනවල ඉන්ධනත් සොරකම් කරනවා. දුම්රියේ බස්රියේ ආසන කපා දමනවා. කුරුටු ගානවා. ඒ මදිවට ආසන පසු පස කුරුටු ගීතත් ලියනවා. දුම්රියේ විදුලි පංකා විදුලි බුබුළු ගලවා දමනවා. මේ පාඩුව විඳදරාගත යුත්තේ කවුද? අපම යි. අප ගමන් කරන පාර ගැන සිතමු. මහ දවාලෙත් වීදි ලාම්පු දැල්වෙනවා, බොහෝ දෙනකු ගමන් කරන පාර ගැන වුනත් අපි හිතන්නෙ පොදු දෙයක් හැටියට නොවයි. මේ ගැන ජාතියක් වශයෙන් අපි හැමෝ ම එකා වගේ හිතන්න ඕනෑ.

පාසලේ තියෙන උපකරණ ගැන හිතා බලන්න. ඇතැම් අය පුටුවක ඉඳගන්නේ එහි කකුල් දෙකක් එසවෙන සේ. පුටුවට කකුල් හතරක් තිබෙන්නේ සමබරතාව රකින්නට. පාසලේ ඩෙස්ක් පුටු ආදී උපකරණ කැඩෙන්නේ අපේ ම වරද නිසා. සමහර උපකරණවල නොගැලපෙන දේ ලියලා බලි රූප ඇඳලා. කැඩුණු ඩෙස්ක් පුටුවල කෑලි අරගෙන පාසලේ අඹගහට ගහනවා. එයින් වහලේ උළු බිඳෙනවා. වහින වේලාවට මුළු ශාලාව ම තෙමෙනවා. කාටද පාඩුව? අපටම යි. ඉවත දමන ලද ඩෙස්ක් පුටු බංකු ආදිය සකස් කරගන්න අපේ ශ්‍රමදායකත්වයෙන් පුළුවන්. ඒත් අප එහෙම කරනවාද? බිත්තිවලට පා තබා මඩ සහිත පා සටහන් බිත්ති පුරාම. අපේ අවිනීත බවට කදිම සාක්ෂියක් ඒක. මේ නිසා පොදු දේපොළ පරිහරණය පිළිබඳව යහපත් ආකල්ප කුඩා කල පටන් ම අප ඇතිකර ගැනීම අවශ්‍යයි.

පොදු ළිඳ ළඟ මළ මුත්‍ර පහකරනවා. ඒ විසබීජ නිසා වතුර අපවිත්‍ර වෙනවා. ඒ තුළින් සෙංගමාලය වැනි වසංගත රෝග බෝ වෙනවා.

ඉතින් මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ පොදු දේවල් තමන්ගේ ම දේපොළ සේ රැකගන්න කියලා. පන්සිල් ගන්න විට අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි කියා පොරොන්දු වෙනවා. පොදු දේපාළ සුරැකීමත් ඊට ඇතුළත්. සමාදන් වන විදියට ම දෙවන සිල්පදය රැක්කොත් කොයි තරම් යහපතක් සිද්ධ වෙනවද? කවුරුත් ඒ වගේ සිතුවොත් පොදු දේපොළ හානිය වළක්වා ගන්න පුළුවන්. එවිට ඒවා ප්‍රතිසංස්කරණයට යන වියදමත් ඉතිරි වෙනවා. එම මුදල් රටේ සංවර්ධනයට යොදන්න පුළුවන්. දහම් පාසල් ළමයි හැටියට අපිත් හිතන්න ඕනෑ, අපට රජයෙන් දෙන පෙළ පොත් ටික ආරක්ෂා කරගෙන අනිත් නංගිලාටත් මල්ලිලාටත් ඊළඟ අවුරුද්දේදී පරිහරණයට ගන්න සුදුසු විදියට පාවිච්චි කරන්න. ඒ තුළින් විශාල ධනස්කන්ධයක් ඉතිරි කරන්න පුළුවන්. එතකොට රටේ ආර්ථිකයටත් අපි උදව් කළා වෙනවා.

අපේ රටේ භික්ෂූන් වහන්සේලා වැඩවාසය කරන බෞද්ධ ජනතාවගේ පූජනීය ස්ථානය වන පන්සල පොදු වස්තුවකි. ඒවා ගොඩනැගී ඇත්තේ රජදරුවන්ගේ, අපේ සීයලා ආච්චිලාගේ දහඩිය මහන්සියෙන්. වැලිකැටයක්, ගඩොලක් එකතු වෙලා රමණීය විහාරස්ථානයක් ඉදිවුණේ. එය ආරක්ෂාකර ගැනීම අපේ යුතුකමක්.

එහෙම වුනත් සමහර අය එම විහාරස්ථානවල දාගැබ්, පිළිම, නටබුන් විනාශ කරන්නේ පෞද්ගලික අපේක්ෂාවන් ඉටුකර ගැනීමට යි. මෙය බෞද්ධකමට කෙතරම් නිගරුවක් ද කියලා සිතා බලන්න කාලේ ඇවිදින්.

බොහොම අසීරුවෙන් විශාල වියදමක් දරා ඉදි කළ ගොඩනැගිලි අනිකුත් දෑ විනාශ කළාම එහි අලාභය ගෙවන්න වෙන්නේ අප වැනි පුංචි දූ දරුවන්ට යි. ඒ නිසා පොදු දේපොළවලට ආදරය කරන්න. තමාගේ දෙයක් ලෙස සිතා ඒවා ආරක්ෂා කරන්න අපි දිවි හිමියෙන් අධිෂ්ඨාන කරගත යුතුයි.

මෙයට වසර කිහිපයකට පෙර පොදු දේපොළ ආරක්ෂා කරගැනීමට ශ්‍රමදානයක් තිබෙනවා කියූ විට කී දෙනාක් එයට සම්බන්ධ වෙනවා ද? ගමේ කවුරුත් එදා එකමුතුව ශ්‍රමදානයට සහභාගී වුණා. අද ශ්‍රමදානයක් කීවොත් ඇතැම් අය මගහරිනවා. අපට ම කියා පාරක්, සොහොන් පිටියක්, සමිති ශාලාවක් හදා ගන්නේ කොහොම ද? ඒවා ආරක්ෂා කරන්නේ කොහොම ද? පොදු දේපොළ ආරක්ෂා කිරීමෙන් රට සංවර්ධනය වෙනවා. එවිට අන්‍යෝන්‍ය සුහදතාව, එකමුතුකම වඩා වර්ධනය වෙලා ශිෂ්ට සම්පන්න ජාතියක් ලෙස නැගී සිටින්ට අපට පුළුවන්. රට දියුණු වෙනවා කියන්නේ අපේ දියුණුවට. අපි ජාතියේ ඉදිරි ගමනට අතහිත දෙමු. සෞභාග්‍යවත් අනාගතයකට උරුමකම් ලබන්නට පොදු දේපොළ සුරකිමු.

මගේ කථාව අසාසිටි ඔබ සැමට තෙරුවන් සරණයි :

**ක්‍රියාකාරකම් :**

1. පොදු දේපොළ නම්කර, ඒවා ආරක්ෂා කිරීමට අප ක්‍රියා කළයුතු ආකාරය ලියා දක්වන්න.
2. "පොදු දේපොළ සුරැකීම අපේ යුතුකමකි" යන මැයින් කෙටි රචනාවක් ලියන්න.
3. පොදු දේපොළ සුරැකීමේ අගය කියැවෙන පද්‍ය කීපයක් නිර්මාණය කරන්න.

## 24. අගතියෙන් මිදෙන්නට අපි කරමු වෑයම්

ඡන්ද යනු ආසාවයි - ඇල්මයි, හිතවත්කමයි
හිතවත්කම නිසාම යි - ඡන්දයෙන් අගතියට යන්නේ

මගේ හොඳ නෑ මිතුරෝ - හිතවත් යහළු යෙහෙළියො
මෙසේ සිතමින් බොහෝ අය - යති අගතියට ඡන්දයෙන්

කෙනකුගෙ ගුණමකා - නැතිදොස් කියතොත් යමෙක්
දෝසයෙන් අගතියට යෑමෙකි - වයිරය නිසයි එසේ වන්නේ

වයිරයෙන් සිත දැඩිකොට - පළි ගන්නට සිතන අය
දැඩි දෝසයෙන් පෙළෙමින් - දැන දැන අගතියට යති

කෙනකුට භය නිසා - මහ අකැමැත්තෙත් නමුත්
අගතියට යන්නට - සිදුවන බවත් ඇත්තෙකි

ලොකුකම් ඇති අය - නොඑසේනම් දනවතුන්
තමනට වදයක් දෙතැයි - දුප්පත්තු අගතියට යති

ඇලෙන්නේ ආසාවෙන් - ගැටෙන්නේ මහ කෝපයෙන්
මෝහය එකතුවීමෙන් - දනෝ යති මුළාවෙන් මුළාවට

උගත් අය සමහරු - සිය ලාබය ම තකමින්
අයුතු දෑ කරනට - මෙහෙයවති අසරණ මෝඩයන්

'අවිජ්ජා පරමං මලං' - මෝඩකම මහ කිළිටෙකි
එහෙත් ඒ බව දැන දැන - අගතියට යති පඬුවෝ

උගත් නූගත් කවුරුත් - අගතිගාමී වෙත් මැයි
පුහුදුන් ලොවේ හැම දෙන - මේ වැරදිවල බැඳෙත්මය

එහෙයින් ඇලීමත් ගැටීමත් - බිය සහ තව මෝහයත්
යන මේ අගති සතරෙන් - මිදෙන්නට අපි කරමු වෑයම්

**මෙත්ත බුදුබණ ගීයෙන්**

වජිරාරාමාධිකාරි පූජ්‍ය පියදස්සි මාහිමි

ක්‍රියාකාරකම් :

1 සතර අගති නම් කරන්න.

2 මේ පාඩම කියවන විට ඔබට ඇතිවුණ දැහැමි අදහස් කීපයක් ඉදිරිපත් කරන්න.

3 දක්වා ඇති උදාහරණය අනුගමනය කරමින් එක් අගතියකට නිදසුන් දෙකක්වත් ඇතුළත් වන සේ පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| අගති | අගතිගාමී වීමේ පිළිවෙත | අගතිගාමී නොවීමේ පිළිවෙත |
|---|---|---|
| ඡන්ද | හිතවත්කම නිසා නුසුදුස්සන්ට තනතුරු ප්‍රදානය | සුදුස්සාට තනතුරු ප්‍රදානය |

පුහුණුවට :

ඡන්දා දෝසා භයා මෝහා - යෝ ධම්මං අතිවත්තති
නිහීයති තස්ස යසෝ - කාලපක්ඛේව චන්දිමා

ඡන්ද දෝස භය මෝහය සතර අගති වන්නේ
අගතිගාමී වැඩ කළාම නොහොඳයි සිදු වන්නේ
තමනට ඇති කිතුගෝසා ඉන් බැහැරට වන්නේ
කළුවර පක්ෂයෙ සඳමෙන් කලාව අඩු වන්නේ

ඡන්දා දෝසා භයා මෝහා - යෝ ධම්මං නාතිවත්තති
ආපූරති තස්ස යසෝ - සුක්ක පක්ඛේව චන්දිමා

ඡන්ද දෝස භය මෝහය සතර අගති වන්නේ
අගතිගාමී නොම වූ සඳ හොඳමයි සිදු වන්නේ
තමනට ඇති කිතුගෝසා හැම දින රජ වන්නේ
පුර පක්ෂයෙ පුන් සඳමෙන් කලාව වැඩි වන්නේ

# 25. පැළයක් සිටුවා ඵලයක් ලබමු

ස්වභාවයෙන් ම අපි විනෝදයෙන් කාලය ගත කිරීමට වැඩි රුචියක් දක්වමු. ඈත අතීතයේ සිට ම විනෝදාස්වාදය සඳහා නොයෙකුත් දෙනා විවිධ දේ සිදුකර ඇත. වත්මන් සමාජයේ ඇතමකු සිය විනෝදාස්වාදය සඳහා තෝරාගන්නේ දුම්වැටිය, සූරාව හා සූදුවයි. යහපත් අය කිසිවිටකත් මෙබඳු ක්‍රියාවන් අනුමත නොකරති. කවි ගී ගැයීම, සංගීත වාදනය, නාට්‍ය බැලීම, කවි ලිවීම, ගීත රචනය, ස්වභාව සෞන්දර්ය රසවිඳීම, පොතපත කියවීම මෙන් ම විනෝද චාරිකා යාම ද අපගේ විනෝදාංශ අතර වේ.

විවේකය වඩාත් ඵලදායී ලෙස සතුටින් ගත කිරීමට බුදුසමය අනුදත් වැදගත් ක්‍රියා පිළිවෙතකි ගෙවතු වගාව. මෙහි ලා අපගේ අවධානය යොමුවන්නේ මල් වගාව, පළතුරු වගාව සහ ඖෂධ පැළ වගාව පිළිබඳ ව යි. පවුලේ සාමාජිකයන් ගේ සහාය ලබාගෙන තම ගෙවත්තේ එළවළු පළතුරු ආදිය වගාකිරීමට යොමුවීම තුළින් පවුලේ ආදායමට දායක වීමටත්, පරිසරයට ආදරය කිරීමටත් අපට හැකියාව ලැබේ.

මල් වගාවෙන් අපේක්ෂිත ප්‍රධාන කරුණ වන්නේ සුන්දර පරිසරයක් ගොඩනගා ගැනීම යි. සොඳුරු බව කොතරම් වටිනවා දැයි කිවහොත් බිම්බිසාර රජතුමාගේ අග මෙහෙසිය වූ ඛේමා බිසව වේළුවනාරාමයට ගියේ එහි විසිතුරු බව දකිනු රිසියෙනි. පසුව ඇය පැවිදිව රහත් තෙරණියක් බවට පත්වූවා ය. සුපිපි කුසුමෙන් සැදුණු රුක් පෙළ, ලියපෙළ ගල්තලා, වැලිතලා ඇති ගලා බස්නා සිසිල් ජලය ඇති තැන සිත්කලුය. එතැන කෙලෙසුන්ගෙන් මිදුණු උතුමනට සිය විවේකයට බොහෝ මග සැලසෙන තැනකි. සිදුහත් බෝසත් සිරිත බුදු සිරිත මෙන් ම ශ්‍රාවක ශ්‍රාවිකා චරිත තුළින් ද මෙ බව වඩාත් තහවුරු වේ. සෑම නිවසක ම පිවිසෙන මඟ දෙපස මල්ගොමු වෙත්නම් මුළු ගම ම සුන්දර වනු ඇත.

ගෙවත්තෙහි ඉඩකඩ ඇති පරිදි සැලසුම් සහගත ව කලාත්මක ව මල් වගා කරගත හැකි ය. පෝච්චි භාවිත කරමින් මල් මැසි ඉදි කරමින් මල් පැළ වගා කිරීමට පුළුවන. මල් පාත්ති සැකසීමේ දී

හොඳින් හිරුඑළිය වැටෙන ස්ථාන තෝරා ගැනීම අවශ්‍ය යි. ගෙවත්තේ රෝපණය කරන ඇතැම් මල් ලස්සන යි. සමහර මල් සුවඳ යි. ලස්සනත් සුවඳත් ඇති මල්වලට කවුරුත් ප්‍රිය කරති. ඔබත් සොබා දහමේ සොඳුරු බව රකින ලස්සනත් සුවඳත් කැටිවුන මලක් වන්න.

මල්පැළ හා මල් විකිණීම හොඳ ආදායමක් ලබාගත හැකි ධාර්මික ජීවන වෘත්තියක් ද වෙයි. බුදුරජාණන් වහන්සේගේ දවස සිටි සුමන මාලාකාරයාගේ කථාව මල් වෙළෙඳාම එකල ජනප්‍රියව පැවැති රැකියාවක් බවට කදිම සාධකයෙකි. පාරාජික පාලිය නම් ත්‍රිපිටක ග්‍රන්ථයෙහි මල් දම් සකස් කළ ආකාරය සඳහන් වන්නේ මෙසේය.

* මල් නටුව එක ම අතකට සිටින සේ ගෙතූ මල්දම්.
* දෙපැත්තට ම මල් නටු සිටින සේ ගෙතූ මල්දම්.
* මල් කිනිති සේ සකස් කළ මල්දම්.
* නූලක හෝ ඉරටූ වැනි කුරක අමුණන ලද මල්දම්.
* මල් මාලා කීපයක් එකට බැඳ සකස් කළ මල්දම්.
* මුතුහරක් සේ ළයෙහි පැළඳිය හැකි ආකාරයට සකස් කළ මල්දම්.
* කන මතුයෙහි පළඳිනු පිණිස සකස් කළ මල්දම්.

මල්මාලා සකස් කිරීම පිළිබඳ එකල පැවැති උනන්දුව මෙම විස්තරයෙන් ද තේරුම් ගත හැකිය. මල නොතලා රොන් පමණක් ගන්නා බමරුන්ගේ ජීවිත ගැන සිතන්න. එසේ අනුන්ට හිරිහැර නොකර අපට හැකි පමණින් තම කටයුතුවල නියැලීම හොඳ බොදු දරුවෙකුගේ යුතුකම ය. කිසි විටකත් අනුන්ගේ ගෙවතුවලින් මල්පැළ හෝ මල් ඔවුනට නොදන්වා නොගැනීමට සිතට ගැනීම ද මෙහිලා සැලකිල්ලට ගත යුතු යි.

පලතුරු වර්ග වගා කිරීම ද ගෙවතු වගාවට අයත් තවත් අංශයකි. අතීතයේ බොහෝ දෙනා ගමන් බිමන් ගියේ පා ගමනිනි. බොහෝදුර ගමන් කරන ඔවුනට වෙහෙස නිවා විවේක ගැනීම පිණිසත් කුසගිනි නිවා ගැනීම සඳහාත් සතුන්ට ආහාර පිණිසත් උද්‍යානවල රසැති පලතුරු වැවීම සිරිතක් ව පැවතිණි. එසේ ම තම නිවෙස්වල ද විවිධ පලතුරු වර්ග වගා කෙරිණි. සෑම ගෙවත්තක ම පාහේ අවම වශයෙන් එක් පලතුරු ගසක්වත් දක්නට ලැබිණි.

වර්තමානයෙහි පලතුරු වර්ග බොහෝ සෙයින් අඩුවී තිබේ. දැනට ශ්‍රී ලංකාවේ වාර්ෂික ව එක් පුද්ගලයකු ලබාගන්නා පලතුරු ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 14ක් පමණ වේ. එය එක් එක් පුද්ගලයකුට වාර්ෂිකව අවශ්‍ය වන ප්‍රමාණයෙන් අඩකි. මේ ප්‍රමාණයෙනුත් කොටසක් සපුරා ගන්නේ පලතුරු ආනයනය කිරීමෙනි. මේ තත්ත්වයෙන් අපට නිදහස් විය හැක්කේ ගෙවත්තේ ම පලතුරු වගා කිරීමෙනි. කෙසෙල් පැපොල්, අන්නාසි, අඹ, දෙළුම්, අලිගැටපේර, පේර, මැංගුස්, රඹුටන් වැනි පලතුරු වර්ග ඒ සඳහා වගා කරගත හැකි ය.

ඈත අතීතයේ පටන් ම අපේ මුතුන් මිත්තන් වගා කටයුතුවල දී භාවිත කර ඇත්තේ කාබනික පොහොර යි. රසායනික පොහොර භාවිත නොකර කාබනික පොහොර යෙදීමෙන් විවිධ රෝගාබාධවලින් වැළකීමට ද අපට පුළුවන.

පලතුරු දෙස බලා අපට ඉගෙනගත හැකි පාඩම් එමට ය. ගස පල දරන්න දරන්න අතුරිකිලි පහතට නැමේ. එය මගෙන් ප්‍රයෝජන ලබා ගන්නයි නිහඬ ව කියාපාන්නාක් වැනි ය. එයින් අප තුළ රඳවන්නේ අනතිමානි ගුණය යි. විවිධ නිලතල දැරුවත් විභාගාදියෙන් විශිෂ්ටයන් වුවත් එයින් උදම් නොවී ක්‍රියා කළ යුතු ය යන්න පල දරන ගස අපට කදිමට කියාපායි.

විසිතුරු ශාක මගින් ගෙමිදුල හා ගෘහය අලංකාර කරගත හැකි ය. ඇතැම් ශාක වඩා දැකුම්කලු පෙනුමක් ලබා දේ. කායික මෙන් ම මානසික සහනය ද ඉන් ලබාගත හැකි වේ. එහිදී අපගේ වඩාත් සැලකිල්ල යොමු විය යුත්තේ ඔසු වගාව පිළිබඳව යි.

අතීතය කෙරෙහි අවධානය යොමු කරන විට දේශීය වෛද්‍ය ක්‍රමය හා බැඳුණු ඖෂධ පිළිබඳ ව කරුණු අපමණවත් අපට සොයා ගත හැකි ය. අතීත රාජ නාමාවලියේ එන බුද්ධදාස රජතුමා සුප්‍රසිද්ධ වූයේ දක්ෂ වෛද්‍යවරයකු ලෙසට ය. එකල දේශීය වෙදකම මෙන් ම ඖෂධ ද ව්‍යාප්තව පැවතිණ. එදා සුළු රෝගයක් වැළඳුණු විට ඒ සඳහා ප්‍රතිකර්ම සකසා ගැනීමට ගෘහණිය පවා දැන සිටියා ය. ඒ සියල්ල සඳහා භාවිත කෙරුණේ දේශීය ඖෂධ ය. රොබට් නොක්ස්, සෑම ලාංකිකයෙක් වෛද්‍යවරයෙකැ යි පවසා ඇත. අප රටේ ගවුවක් එහාටත් මෙහාටත් ඇවිද ගියද බෙහෙතකට නොගන්නා පැළෑටියක් සොයාගත නොහැකිය යි පැරණි අය පවසා ඇත.

කෝමාරිකා, හාතාවාරිය, අක්කපාන, ඉඟුරු, කහ, දෙහි, අරත්ත, ඉරිවේරිය, බැවිල, කටුවැල්බටු, සඳුන්, රත්කිඳ, කටුකරෝසන, අරළු, බුළු, නෙල්ලි, පාවට්ටා, පොල්පලා, කොත්තමල්ලි, රසකිඳ, වෙනිවැල්ගැට, උක්, හීරැස්ස, හීන් බෝවිටියා අද වුවද බොහෝ දෙනා හඳුනන දේශීය ඖෂධ වේ. දේශීය ඖෂධ කෙරෙහි පෙර පැවති විශ්වාසය ක්‍රමයෙන් යටපත් වන්නට වූයේ බටහිර වෛද්‍ය ක්‍රමය නිසා ය. එහෙත් දේශීය ඖෂධ පැළෑටි කීපයක් හෝ ගෙවත්තේ වගා කිරීමට කටයුතු යෙදීම සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමට අත්‍යවශ්‍ය වේ. ඖෂධ පැළෑටි මගින් සාදාගත හැකි කොළකැඳ පෝෂ්‍යදායි ආහාරයකි. ගොටුකොළ, මුකුණුවැන්න, එළබටු, පොල්පලා, හාතාවාරිය, ඉරමුසු, යකිනාරන් කොළ, වැල්පෙනෙල කොළ, කොළකැඳ සකස්කර ගැනීමට භාවිත කළ හැකි ඖෂධ අතර වේ.

මල්, පලතුරු, ඔසු වගාවන් සිදු කිරීමෙන් අපට නිරාමිස සතුටක් ඇතිකරගත හැකි අතර ම පහත දැක්වෙන අන්දමේ ප්‍රයෝජන ද ලබාගත හැකි ය.

* බුද්ධ පූජාවට, බෝධි පූජාවට අවශ්‍ය මල්, පලතුරු බෙහෙත් සපයා ගැනීම.
* නිවසේ ආලින්දය මල්වලින් සැරසීම.
* මල්, පලතුරු, ඔසු පැළ පරිත්‍යාග කර සතුටුවීම.
* මල් පැණි බොන, ඉදුණු පලතුරු රස විඳින සතුන් දෙස බලා සතුටක් ලැබීම.
* මල්, පලතුරු, ඖෂධ දානමය පුණ්‍යකර්මවලට යොදා ගැනීම.
* ගිලනුන්ට පලතුරු සහ කොළකැඳවලින් සංග්‍රහ කිරීම.
* ඉතා ඉක්මණින් අස්වැන්න ලබාගත හැකි මල්, පලතුරු ඖෂධ වර්ග අන්අයට හඳුන්වා දීම.
* වඳවී යන මල්, පලතුරු, ඖෂධ වර්ග ආරක්ෂා කර ගැනීම.

වඩාත් උසස් ලෙස පින් පල ලද හැක්කේ සියතින් ම කළ ගෙවතු වගාවේ ඇති දේ තමා විසින් ම පූජා කිරීමෙනි. මල්, පලතුරු, බෙහෙත් පූජා කිරීමෙන් ලද හැකි අනුසස් මෙසේ ය.

* සිරුර පැහැපත් වේ.
* උවදුරු දුරුවේ.
* නීරෝග සම්පත් ලැබේ.
* ආයු, වර්ණ, සැප, බල, නුවණ වැඩේ
* පිරිස් බලය වැඩිවේ.
* සාගින්න පිපාසාව සන්සිඳේ.
* ආමාශය පිරිසිදුවේ.
* කායික, වාචසික, මානසික සංවරය ඇතිවේ.
* නිරාමිස ප්‍රීතිය ඇතිවේ.
* ගරු බුහුමන් ලැබේ.
* කීර්තියට හා ප්‍රශංසාවට ලක්වේ.
* ප්‍රියමනාප පුද්ගලයෙක් වේ.
* දෙවි මිනිස් සැප ලැබේ.

යමෙක් මල්, පලතුරු, ඔසු උයන් වවන්නේ ද ස්වභාවික වනාන්තර වවන්නේ ද ඒදඬු පාලම්, පැන්හල්, පොකුණු තනා දෙයි ද ඔහුට දිවා රෑ දෙකෙහි ම පින් වැඩෙන බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. අපි මල්, පළතුරු ඔසු වගාවන් සිදුකර දෙලෝ යහපත සලසා ගනිමු.

**භාවිතයට :**

* තුරුලතා සෙවනක් යට හිඳගන්න. එහි වටපිටාව නරඹමින් ස්වභාව ධර්මයට සිතෙන් සමීපවීමට උත්සාහ කරන්න.
* ගස්වල හැඩය. වර්ණය, සුළඟින් තුරුපත් සැලෙන සැටි, අහසේ නිල් පැහැය නිරීක්ෂණය කරමින් පරිසරයේ චමත්කාරය දකින්න.
* සුළඟේ සිසිල නැවුම් බව හා හිරු රැසෙහි සැපවත් බව විඳගන්න. ස්වල්ප වේලාවකට ඔබේ වෙනත් ප්‍රශ්න ගැටලු අමතක කර වර්තමාන මොහොතෙහි ජීවත්වීමේ සුවය හා සතුට අත්දැකීමට උත්සාහ කරන්න.

* අපි සියලුදෙනා ටික වේලාවක් මෙසේ හිඳ විවේකයක් ගනිමු. එකිනෙකා සමග කතා කිරීමෙන් සිතේ සන්සුන් බව බිඳීයන බැවින් ඉන් වැළකී සිටිමු.

ක්‍රියාකාරකම් :

1. රුක් රෝපණයේ ඇති වැදගත්කම ගැන වාක්‍ය පහක් ලියා දක්වන්න.
2. ඔබේ ගෙවත්තේ මල් පලතුරු සහ ඖෂධ පැළෑටි හැකි පමණ වගාකර ඒවාට සාත්තු කරන්න.

දහම් පාසල් සිසුන් සඳහා
නොමිලයේ
බෙදදීම පිණිසයි.